

# ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍ය, මානව ආරක්ෂාව සහ ත්‍රස්තවාදය වැලැක්වීම පිළිබඳ අවබෝධ කරගැනීම

අර්මීසා ටීගල්

LAW & SOCIETY TRUST

# ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍ය, මානව ආරක්ෂාව සහ ත්‍රස්තවාදය වැලැක්වීම පිළිබඳ අවබෝධ කරගැනීම

**අර්මීසා ටීගල්**

LAW & SOCIETY TRUST

LAW & SOCIETY TRUST

© නීතිය හා සමාජ භාරය, ශ්‍රී ලංකාව, 2021 පෙබරවාරි

ප්‍රකාශනය
නීතිය හා සමාජ භාරය
3, කින්සි ටෙරස්
කොළඹ 8
ශ්‍රී ලංකාව

දුරකථන: + 94 (0) 11 268 4845
ෆැක්ස්: + 94 (0) 11 268 6843
ඊමේල්: admin@lstlanka.org
www.lstlanka.org

ISBN 978-624-5545-10-0

# පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | පසුබිම | 3 |
| 2.1 | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ඉතිහාසය | 3 |
| 2.2 | දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව අත්විඳි, අතිවිශේෂවූත් සීමා නොකරන ලද්දවූත් විධායක බලය | 4 |
| 2.3 | පොලිස් බලතල අවභාවිතය සහ සාමාන්‍ය අපරාධ නීතියෙහි සිදු වන ප්‍රමාදයන් | 6 |
| 2.4 | ප්‍රතිසංස්කරණ සඳහා දරන ලද අසාර්ථක දේශපාලන තැත | 6 |
| 2.5 | 2019 පාස්කු ඉරු දින ප්‍රහාර වලින් අනතුරුව වූ පසුබිම | 8 |
| 3. | නීතිමය රාමුව | 10 |
| 3.1 | ත්‍රස්ත විරෝධී නීතිය සහ මානව හිමිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතීන් | 10 |
| 3.2 | දේශීය නීති රාමුව | 15 |
| 4. | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක වූ වසර 40 තුළ උගත් පාඩම් කිහිපයක් | 22 |
| (අ) | අත් අඩංගුවට ගත් ආකාරය | 22 |
| (ආ) | නීති නියෝජනය සඳහා ප්‍රවේශය | 22 |
| (ඇ) | අත් අඩංගුවට ගැනීමට හේතු සහ රඳවා තබා ගැනීම යුක්තිමත් කිරීම අධිකරණ සමාලෝචනයට ලක් නොවීම | 23 |
| (ඈ) | රඳවා තබා ගන්නා කාලසීමාව | 24 |
| (ඉ) | පවුල්වලින් දුරස්ථ බව | 25 |
| (ඊ) | වධහිංසා | 25 |
| (උ) | එකම පුද්ගලයාට විරුද්ධව විවිධ අධිකරණවල බහුවිධ නඩු පැවරීම | 27 |
| (ඌ) | පුනරුත්ථාපන ප්‍රතිපත්තිය | 27 |
| (එ) | දීර්ඝ කාලයක් සිරභාරයේ තබාගෙන සිට නිදහස් කිරීමෙන් ඇතිවන අසාධාරණය | 27 |
| (ඒ) | සමස්ත ප්‍රජාවන්ම සහ සාමකාමීව සිදු කරන විවේචන හෝ විරුද්ධත්වය දැක්වීම් ත්‍රස්තවාදීන් හෝ ත්‍රස්තවාදී ක්‍රියා වශයෙන් සලකා අපකීර්තියට පත් කිරීම | 28 |
| 5. | 2019 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම් හා රඳවාගැනීම් පිළිබඳ අත්දැකීම් | 29 |
| (අ) | නීති නියෝජනයක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම | 29 |
| (ආ) | අත් අඩංගුවට ගැනීම් | 30 |
| (ඇ) | විමර්ශන අවසන් කිරීමට බාධා වන අන්දමින් බහුවිධ නඩු පැවරීම | 34 |
| (ඈ) | පවුල්වලින් දුරස්ථවීම | 34 |
| (ඉ) | වධහිංසා | 35 |
| (ඊ) | අත්අඩංගුවට ගැනීම් අධිකරණයේ අධීක්ෂණයට නතුකිරීම | 36 |
| (උ) | නීතිපතිවරයා වෙත නියෝජනයන් සිදු කිරීම | 36 |

(ඍ) රැඳවූවන්ගේ පවුල් මත ඇති කෙරෙන සමාජ-ආර්ථික බලපෑම 38

(එ) සැකකරුවන්ගේ පවුල් සමාජයේ හුදකලාවීම 39

(ඒ) කෝවිඩ්-19 පසුබිම තුළ දුෂ්කරතා සහ අවිනිශ්චිතතා උග්‍ර වීම 39

(ඔ) අසමාන ලෙස සැලකීම 40

6. සමාප්තිය 42

# ස්තුතිය

මෙම වාර්තාව සම්පාදනය කිරීම වෙනුවෙන් අර්මීසා ටීගල් වෙත සහ පර්යේෂණ සහය ලබා දුන් අම්රා ඉස්මයිල් වෙත නීතිය හා සමාජ භාරයේ ස්තුතිය හිමි වේ. නීති ආධාර ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක වශයෙන් මේ සඳහා ලබා දුන් සහාය සහ අදහස් වෙනුවෙන් ධනුෂාන් ආරුමුගම් වෙත නීතිය හා සමාජ භාරයේ කෘතඥතාවය පළ කරනු ලැබේ. අම්බිකා සත්කුනනාදන් සහ ශ්‍රීන් සරූර් විසින් ලබා දෙන ලද සහය සහ මගපෙන්වීම ද ඉතා අගනේ ය. සමස්ත ව්‍යාපෘතිය පුරාම මෙයට සම්බන්ධ වූ නීතිඥ ජාලයෙන් ලැබුණු දයකත්වය සහ අදහස් නීතිය හා සමාජ භාරය කෘතඥ පූර්වකව සිහිපත් කරනු ලැබේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් අසාධාරණ අන්දමින් තමන්ගේ ජීවිත වලට හානිකර බලපෑම් එල්ල වී ඇති ශ්‍රී ලංකාවේ සෑම ජනවර්ගයකට ම අයත් පුද්ගලයින් සහ පවුල් වෙත මෙම කෘතිය පුද කරනු ලැබේ.

නීලන් තිරුචෙල්වම් භාරයෙන් ලැබුණු මූල්‍ය සහාය නිසා මෙම වාර්තාව සම්පාදනය කිරීමට හැකි විය.

# කෙටි යෙදුම්

BASL - Bar Association of Sri Lanka
ශ්‍රී ලංකා නීතිඥ සංගමය

CID - Criminal Investigation Department
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

CTA - Counter Terrorism Act
ප්‍රති ත්‍රස්ත පනත

HRC - Human Rights Commission of Sri Lanka
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

HRW - Human Rights Watch
හියුමන් රයිට්ස් වොච් සංවිධානය

ICCPR - International Covenant on Civil and Political Rights
සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

ICJ - International Commission of Jurists
ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම

ICRC - International Committee of the Red Cross
ජාත්‍යන්තර රතු කුරුස කමිටුව

LST - Law and Society Trust
නීතිය හා සමාජ භාරය

LTTE - Liberation Tigers of Tamil Eelam
දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය

PSO - Public Security Ordinance
මහජන ආරක්ෂක ආඥාපනත

PTA - Prevention of Terrorism Act
ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

SLR - Sri Lanka Law Report
ශ්‍රී ලංකා නීති වාර්තාව

TID - Terrorism Investigation Division
ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය

UN - United Nations
එක්සත් ජාතීන්ගේ සංවිධානය

UNCAT - United Nations Convention Against Torture, Cruel, Inhuman and Degrading Treatment
වධහිංසාව සහ අනෙකුත් කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකීම්වලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය

UNWGAD - United Nations Working Group on Arbitrary Detentions
අත්තනෝමතික රඳවාගැනීම් පිළිබඳව වන එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම

# 1. හැඳින්වීම

1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 2019 වර්ෂයේ පාස්කු ඉරිදා දින සිදුවූ බෝම්බ ප්‍රහාර වලින් පසුව යොදා ගන්නා ආකාරය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, එම පනත දැනට ක්‍රියාත්මක කෙරෙන අන්දම පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා නීතිය හා සමාජ භාරය විසින් මෙම වාර්තාව සම්පාදනය කරන ලදී.

2019 අප්‍රේල් 21 වැනි ඉරු දින අන්තවාදී කණ්ඩායමක් විසින් දේවස්ථාන තුනක සහ සුඛෝපභෝගී හෝටල් තුනක සිදු කරන ලද බෝම්බ ප්‍රහාරවලින් පසුව එළඹුණු මාස වලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන රඳවා සිටි පුද්ගලයින් 44 දෙනෙකුට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් සිදු කළ නිරීක්ෂණ මත පදනම්ව මෙම වාර්තාවට පදනම් වේ. එම අවස්ථාවේදී නීතිය හා සාමය අංශයෙන් දැක්වූ ප්‍රතිචාරය වේගවත් විය. එසේ අත් අඩංගුවට ගත් හා රඳවා ගත් පුද්ගලයින් වෙනුවෙන් පෙනී සිටීමට නීති වෘත්තියේ නියැළී ඇතැම් කොටස් දැක්වූ මැළිකමත්, අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගනු ලැබූ අයගේ පවුල් විසින් ලබා දෙන ලද විස්තරත්, රැඳවුම් නියෝග සහ පරිපාලනමය රැඳවුම් කාල සීමා සම්බන්ධයෙන් වූ අවිනිශ්චිතභාවයත් තුළින් පෙන්නුම් කළේ ශ්‍රී ලංකාවේ ත්‍රස්ත විරෝධී නීති රාමුව රැඳවියන්ට අවාසි සහගත අන්දමින් පෙළගැසී ඇති ආකාරය පිළිබඳ ඉතා හුරු පුරුදු සලකුනු ය. වරදකරු බවට ඔප්පු කරන තුරු නිර්දෝෂීභාවයේ පූර්වානුමිතිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ක්‍රියාත්මක නොවේ.

මෙම රඳවා තබාගැනීම් වල නීතිමය සහ සමාජමය අත්දැකීම් පිළිබඳ දැනුවත්වී, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීමට කැප වී සිටින පාර්ශ්වකරුවන් සමග එම දැනුම බෙදා ගැනීම වැදගත් වන බව නීතිය හා සමාජ භාරයේ විශ්වාසය යි. පාස්කු ඉරු දින ප්‍රහාර හා සම්බන්ධයෙන් සිදු කළ අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් 'ජාතික ආරක්ෂාව' යනුවෙන් හඳුන්වනු ලබන, පොදු යහපත තකා අයිතිවාසිකම් සීමා කිරීම සඳහා අවසර ලබාදෙන්නා වූ ජාතික ආරක්ෂක රාමුවක් ඇතුළත ඇඳී ඇති බව නීතිය හා සමාජ භාරය හඳුනා ගනියි.

කෙසේ නමුත්, එවැනි ඕනෑම රාමුවක් හෝ සන්දර්භයක් තුළ නීතියේ ආධිපත්‍යය පිළිපැදීම යනු රජයෙන් බලාපොරොත්තුවිය හැකි අවිශේෂ අවම ප්‍රමිතියක් වේ. ඒ සඳහා මහජන බලය ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සඳහා අවස්ථාව සැලසීම තුළින් විධායකයේ බලතල මත මූලික සංවරණයක් තිබීම අවශ්‍ය කරයි. විධායකය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග වලදී (අ) ඒ සඳහා නීතියෙන් අවසර දී තිබේද හා එය නීතිය තුළ සලසා දී ඇති සීමාවන් තුළ ක්‍රියාත්මක කර තිබේ දැයි බැලීම සඳහා සහ (ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත් ද සහ අයිතිවාසිකම් මත පනවා ඇති සීමා කිරීම් සඳහා නීතියෙන් අවසර දී තිබේද යන්න සොයා බැලීම සඳහා විධායක ක්‍රියාමාර්ග සමාලෝචනයකට භාජනය කිරීමට හැකි විය යුතු වේ. එයට අමතරව, විධායක බලය භාවිතා කිරීමෙහි සහ අවභාවිතයෙහි මානව, සමාජ, සහ දේශපාලන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ද ප්‍රතිපත්ති සම්පාදකයින් සහ මහජන නියෝජිතයින් විසින් උනන්දුව දැක්විය යුතු වේ. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන නීති තුළ ඇතුළත් වී තිබෙන පුළුල් සහ සැලකිය යුතු බලතල සලකා බලන කල, ඒවා ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳ වඩාත් වැඩි පරීක්ෂාකාරී බවක් තිබිය යුතුය. බලය, විශේෂයෙන් ම සීමිත වූ සංවරණ සහිත බලය, නිතර ම අවභාවිතයට ලක්වන්නේ ය යන කාරණාව සත්‍ය බවට යළි යළිත් ඔප්පු වී තිබෙන මූලික උපකල්පනය වේ. නොපැහැදිලි බවක් තිබීමේ නැඹුරුවතාවයක් ඇති, වඩාත් පුළුල් ක්‍රියාමාර්ග ගැනීමට අවසර දීම සඳහා අර්ථනිරූපණයට විවෘත වූත්, සාමාන්‍යයෙන් සංවරණයට ලක් නොවන්නා වූත් මහජන ආරක්ෂක බලතල ඒ අන්දමින් අවභාවිතය සඳහා වැඩියෙන්ම ඉඩ ඇති බලතල අතරට අයත් වේ. ජාතික ආරක්ෂාවේ නාමයෙන් මානව ආරක්ෂාව පීඩාවට ලක් නොවිය යුතුය. ඇත්තෙන් වශයෙන් ම ජාතික ආරක්ෂාවේ අරමුණ වන්නේ මානව ආරක්ෂාව සහතික කර දීමයි. නොවැළැක්විය හැකි වූ අයිතිවාසිකම් සීමාකිරීම් සැබවින් ම අවශ්‍ය වන්නේ ද, යුක්ති සහගත ද සහ ප්‍රමාණානුකූලද යන්න සහතික කර ගැනීම සඳහා මහජන ආරක්ෂක බලතල සියුම්ව පරීක්ෂාවට ලක් කිරීම යුක්ති සහගත කිරීම මෙම කරුණ මගින් සිදු කරයි.

මෙම අධ්‍යනය තුළ සලකා බැලෙන අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් වලට ලක් වූ තැනැත්තන්ට එරෙහිව ඇති නඩුවල වලංගුතාවය මෙම වාර්තාවෙන් අධ්‍යයනයට ලක් නොවන අතර, කලට වේලාවට පවත්වනු ලබන සාධාරණ හා නිසි නඩු විභාගයකින් පමණක් එය තහවුරු කළ හැකිය යන්න නීතිය හා සමාජ භාරයේ ස්ථාවරයයි. මෙම වාර්තාව සඳහා සමාලෝචනයට ලක් කළ සිදුවීම් නිසි ක්‍රියාවලීන්ට ඇති අනුකූලතාවයට අදාළව සහ බලපෑමට ලක් වූවන් කෙරෙහි ඇතිකෙරෙන මානව දුක් පීඩා සහ අනෙකුත් පාඩු පැමිණවීම් වලින් ඇතිකෙරෙන බලපෑම අනුව තක්සේරුවට ලක් කර ඇති ලබා ගැනීමට තිබෙන තොරතුරු අනුව මෙම නිරීක්ෂණ සහ අවබෝධයන් ප්‍රාරම්භක ස්වභාවයක් ගන්නා බවත්, ඒවා සම්බන්ධයෙන් වඩාත් සමීපව හා අඛණ්ඩව අධ්‍යනය කිරීම අවශ්‍ය බවත් පැහැදිලි වේ. කෙසේ නමුත්, මින් පෙර අවස්ථාවල ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදාගැනීමේදී දැක පුරුදු ප්‍රවණ්ඩත්වය, වෙනස්කොට සැලකීම, බලය අනිසි ලෙස යොදාගැනීම, නිසි ක්‍රියාවලීන් හා මනුෂ්‍ය ජීවිත නොසලකා හැරීම සම්බන්ධ රටාවන් ම මෙම සිදුවීම් තුළ ද දක්නට ලැබේ.

(1) විශේෂයෙන් ම ත්‍රස්තවාදය වැළැක්වීමේ සන්දර්භය තුළ, අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර නීති ප්‍රමිතීන් කවරේ ද, (2) ත්‍රස්තවාදය වැළැක්වීමට සම්බන්ධව අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් වලට අදාළව පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇති දේශීය නීති රාමුව කුමක් ද, (2019 )3 වර්ෂයට පෙර සහ 2019 අප්‍රේල් 21 ප්‍රහාරවලින් පසුව, ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වන නීති හරහා බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ ප්‍රායෝගික සහ ජීවමාන අත්දැකීම් කවරේ ද යන්න මෙම වාර්තාව මගින් විමසා බලනු ලැබේ.

නීතියේ ආධිපත්‍යය, නිසි ක්‍රියාවලීන් සහ මානව ආරක්ෂාව කෙරෙහි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් ඇති කෙරෙන අහිතකර බලපෑම් හඳුනා ගනිමින් මෙම වාර්තාව මගින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට තිබෙන දීර්ඝ කාලීන අත්දැකීම එහි සමාජ-ආර්ථික දේශපාලනය, අපරාධ යුක්ති පද්ධතිය, නීතියේ ආධිපත්‍යය කෙරෙහි ඇති මහජන විශ්වාසයෙහි පුළුල් සංදර්භය තුළ ස්ථානගත කරයි. මෙම කෙටි වාර්තාවෙහි ඇතුළත් නිරීක්ෂණ සහ විස්තර මේ සම්බන්ධයෙන් තිබෙන ලිපිලේඛන සමුදයට යමක් එකතු කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවබෝධ කරගැනීමට දායක වන ආකාරයකින් ඉදිරිපත් කර තිබේ.


දැනට පවතින නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තිබෙන ව්‍යවහාරයන්, ප්‍රවණතා සහ ඒවායෙහි ප්‍රතිඵල පිළිබඳව මෙන්ම මූලික මානව හිමිකම් ආරක්ෂා කිරීමේ ඇති හිදැස් සම්බන්ධයෙන් ද ලබන දැනුම ත්‍රස්තවාදය වැළැක්වීම සම්බන්ධයෙන් අනාගතයේ සිදු කරනු ලබන නීති ප්‍රතිසංස්කරණ වලදී යොදාගත යුතු යැයි නීතිය හා සමාජ භාරය විශ්වාස කරයි.

# 2. පසුබිම

## 2.1 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ඉතිහාසය

'ශ්‍රී ලංකාව තුළ ආණ්ඩු වෙනසක් ඇතිකිරීමේ ක්‍රමයක් වශයෙන් හෝ එයට උපකාරී වනු පිණිස බලය යොදා ගැනීම හෝ අපරාධයක් සිදුකිරීම සඳහා සහයෝගීත්වය දක්වන අංශ හෝ පුද්ගල කණ්ඩායම් හෝ සංවිධාන' මගින් එල්ල කෙරෙන අනතුරට ආමන්ත්‍රණය කිරීම පිණිස 1979 වර්ෂයේ දී තාවකාලික හදිසි අවස්ථා නීතියක් වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හඳුන්වා දෙන ලදී. එය අවශ්‍යතාවයක් වශයෙන් පිළිගන්නා ලද අතර, පනතෙහි විධිවිධාන මගින් මූලික අයිතිවාසිකම් සීමා කෙරෙන බව පිළිගැනීමට ලක් කරමින් එය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ඇතිව සම්මත කරගන්නා ලදී. 1982 වර්ෂයේ දී එය ස්ථිර පනතක් බවට පත් කරන ලද අතර අදටත් එය බලාත්මක ව පවතී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කරගනු ලැබූ පසුබිම දෙමළ දේශපාලන සමාජය තුළින් නැගී ආ බෙදුම්වාදී අභිලාෂයන් සඳහා ප්‍රබල විරෝධයක් දැක්වූ ද, රජය සහ බෙදුම්වාදී දෙමළ සටන්කාමී කණ්ඩායම් අතර ප්‍රචණ්ඩත්වය උග්‍ර කරවූ ද පසුබිමක් විය.

**ශ්‍රී ලංකාවේ බලපවත්වන අතිවිශේෂ පොලිස් බලතලවල සහ මහජන ආරක්ෂක නීතීයේ කාලානුක්‍රම පිළිවෙල ශ්‍රී ලංකාවේ බලපවත්වන අතිවිශේෂ පොලිස් බලතලවල සහ මහජන ආරක්ෂක නීතීයේ කාලානුක්‍රම පිළිවෙල**




ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කරගනු ලැබුවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, එනම්, දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මතකරගෙන වසරකට පසුව වේ. පාර්ලිමේන්තුවේ පෙර නොවූ විරූ අන්දමේ බහුතර බලයක් අත්කර ගෙන තිබූ එවක තිබූ ආණ්ඩුව විසින් පුළුල් සහ බොහෝ දුරකට සංවරණ රහිත වූ විධායක බලතල සහිත විධායක ජනාධිපති ධුරයක් ඇති කරන ලදී. එය අධිකරණයේ භූමිකාව සහ බලතල ආන්තීකරණය කරන ලද සහ එහි ස්වාධීනත්වය ආරක්ෂා කර නොදුන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය. එසේම එය නීති පැනවීමෙන් පසු එම නීති අධිකරණමය සමාලෝචනයකට ලක් කිරීම පිළිනොගත් සහ පනත් කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව අධිකරණ සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකි කාල සීමාව දින තුනකට පමණක් සීමා කෙරෙන 'හදිසි අවශ්‍යතාවයකින් යුත් පනත් කෙටුම්පත්' සම්මත කර ගැනීමේ ක්‍රමවේදයක් සඳහා අවසර ලබා දුන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නීතිගත කරන අවස්ථාව වන විට, 1947 මහජන ආරක්ෂක ආඥාපනත (පීඩ) සහ ඒ යටතේ නීතිගත කළ හදිසි අවස්ථා රෙගුලාසි ද ශ්‍රී ලංකාවේ බලාත්මකව පැවතුණි. මහජන

ආරක්ෂක පනත ද 'හදිසි පනතක්' වශයෙන් මිනිත්තු 90 ක් තුළ සම්මත කර ගත් නීතියක් වූ අතර,[1] එම කරුණ සම්බන්ධයෙන් වඩාත් සුපරීක්ෂාකාරී ලෙස සලකා බැලිය යුතු බවට එම අවස්ථාවේදී සභාවෙන් අනතුරු ඇඟවීම් සිදු කරනු ලැබීමට එය හේතු වී තිබුණි.[2] මෙම මහජන ආරක්ෂක ආඥා පනත පුළුල් අන්දමින් රාමුගත කළ යටත්විජිතවාදී නීතියක් වූ අතර, හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කර ඇති විට හදිසි අවස්ථා රෙගුලාසි පැනවීමට එමගින් ජනාධිපතිවරයාට බලය ලබා දෙයි.

## 2.2 දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව අත්විඳි, අතිවිශේෂවූත් සීමා නොකරන ලද්දවූත් විධායක බලය

ශ්‍රී ලංකාවේ හදිසි අවස්ථා රීතිය සහ වෙනස් නොවී පවතින අර්බුද තත්වය මනාව ලේඛනගත වී තිබේ.[3] ශ්‍රී ලංකාවේ හදිසි අවස්ථා රීතිය සහ වෙනස් නොවී පවතින අර්බුද තත්වය මනාව ලේඛනගත වී තිබේ. බ්‍රිතාන්‍ය පාලන සමයෙන් පසුව ශ්‍රී ලංකාව මුලින් ම නිල හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන ලද්දේ 1953 දී ය. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව වැඩිම කාලයක් පාලනය වී ඇත්තේ හදිසි අවස්ථා තත්වයක් තුළ වන අතර එසේ නොමැතිව පාලනය වූ කාලසීමාව අඩු ය. හදිසි අවස්ථාව බලපැවැත්වුනු දීර්ඝත ම කාලසීමාව වන්නේ 1989 දී මාස 5කට අත් හිටුවීමක් හැරුනුවිට 1983 සිට 2001 දක්වා වූ කාලය තුළ හදිසි අවස්ථාව බලපැවැත්වීමයි. ඉන්පසුව, ගැටුම පෝෂණය කරමින් තිබූ ගැටළු සඳහා සාමකාමී විසඳුම්වලට එළඹීමට සම්මුති සාකච්ඡා පැවැත්වීමට අවස්ථාවක් සලසාදීම පිණිස 2001 දී එවකට රජය සහ එල්ටීටීඊය අතර සටන් විරාම ගිවිසුමක් ඇතිවීමෙන් පසුව හදිසි අවස්ථා තත්වය ඉකුත් වී ගියේ ය.[4] නිල වශයෙන් හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කර නොතිබුණ ද, රජය විසින් දිගටම හදිසි අවස්ථා බලතල ක්‍රියාත්මක කළ බව සඳහන් වී තිබේ.[5] ඉකුත් වී ගොස් තිබූ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ හිමිවන බලතල ම ක්‍රියාත්මක කළහැකි කරවන අන්දමේ රෙගුලාසි මාලාවක් ගැසට් කිරීම සඳහා අමාත්‍යාංශවලට රෙගුලාසි පැනවීමට හැකියාව ලබාදෙන්නා වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 27වැනි වගන්තිය යොදාගන්නා ලදී. 2003 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බලාත්මකව තිබූ රෙගුලාසිවලට 'අධි ආරක්ෂක කළාප' නිර්මාණය,[6] යම් ප්‍රදේශවල ධීවර කටයුතු තහනම් කිරීම,[7] සහ භාර වූ තැනැත්තන් අත් අඩංගුවේ තබාගැනීමට පොලිස් බලතල ඇතුළත් විය.[8]

---

1 එන්. මනෝහරන්, "ශ්‍රී ලංකාවේ ප්‍රතිත්‍රස්ත නීතිය: සාර්ථකත්වය ඇගයීම", ප්‍රතිපත්ති අධ්‍යයන, 28 වැනි වෙළුම, Washington, D.C.: East-West Center, (2006), 22 jeks msgqj. http://hdl.handle.net/10125/3495. (ප්‍රවේශය: 2009 ජූලි 01).

2 කොළඹ දකුණ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ඒ.පී. ද සොයිසා මහතා මෙසේ සඳහන් කර තිබුණි: 'ප්‍රතිපත්තියක් නැති අමාත්‍යවරයකුට හෝ අග්‍රාමාත්‍යවරයකුට මේ නීතිය ම යොදාගෙන නිර්දෝෂී පුද්ගලයින් රඳවා තබාගන්න පුළුවන්' - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ විවාදය සහිත හැන්සාඩ් වාර්තාව, 1947 ජූනි 10. Counterterrorism Legislation in Sri Lanka නැමති ග්‍රන්ථයේ 22 පිටුවේ මනෝහරන් විසින් උපුටා දක්වා තිබේ.

3 Radhika Coomaraswamy and Charmaine de los Reyes, Rule by emergency: Sri Lanka's postcolonial constitutional experience, *International Journal of Constitutional Law,* Volume 2, Issue 2, April 2004, Pages 272–295; Asanga Welikala, State of permanent crisis: Constitutional government, fundamental rights and states of emergency in Sri Lanka, Center for Policy Alternatives, 2008; Deepika Udagama, An Eager Embrace: Emergency Rule and Authoritarianism, *Republican Sri Lanka in Reforming Sri Lankan Presidentialism: Provenance, Problems and Prospects* edited by Asanga Welikala, Center for Policy Alternatives, 2015 n,kak'

4 සිත්ගන්නා කරුණ නම්, මෙය, ප්‍රධාන විපක්ෂ පක්ෂයට මිස ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ බහුතර සහයෝගයක් නොලැබුණු එකම අවස්ථාව සමග සමපාත වීමයි. හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් ඒ බව ප්‍රකාශයට පත්කිරීම අවශ්‍ය වන අතර එය දිගටම ක්‍රියාත්මක වන්නේ එය සෑම මසකම ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබුවහොත් පමණි. මෙම ඉතිහාසය සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා බලන්න:
Ermiza Tegal (2009) Emergencies, Constitutions and Autochthonous Solutions: A comparative study of emergency power in South Africa and Sri Lanka, LL.M, School of Oriental and African Studies, University of London.

5 Saliya Edirisinghe, 'Addendum, Lapse of Emergency Rule and resort to other measures', In Sri Lanka: State of Human Rights 2004, Law and Society Trust, 23-26, at page 23. මහජන ආරක්ෂක පනතේ II කොටසින් විධිවිධාන සලසා ඇති, අත්අඩංගුවට ගැනීමේ හා රඳවා තැබීමේ බලතල ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කළ බවත්, රෙගුලාසි පැනවීමට අමාත්‍යාංශවලට හැකියාව ඇතිකරදීම සඳහා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 27 වගන්තිය භාවිතා කළ බවත් එදිරිසිංහ ප්‍රකාශ කරයි.

6 කොළඹ අධි ආරක්ෂිත කළාපයක් වශයෙන් ප්‍රකාශයට පත් කරමින් සහ බලපත්‍රයක් නොමැතිව ලොරි සහ ට්‍රේලර් ඇතුළුවීම හෝ නවතා තැබීම තහනම් කරමින් පනවන ලද 2001 අංක 3 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ වන රෙගුලාසිය.

7 2001 අංක 7 හා 8 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ වන රෙගුලාසි (යම් යම් අංශවලට අදාළ වේ)

8 2001 අංක 11 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත් රෙගුලාසිය

එකල විදේශ අමාත්‍යවරයාගේ ඝාතනයට ප්‍රතිචාරයක් වශයෙන් 2005 වර්ෂයේ දී හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කෙරුනු අතර, මාසිකව පාර්ලිමේන්තුවේ අලුත් කරනු ලබමින් එය අඛණ්ඩව බලපැවැත්වුනේ ය. *ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නීති බැඳීම්, විශේෂයෙන් ම ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මත අංක 1373 (2001) රට තුළ බලාත්මක කිරීම* යන අරමුණ ඇතිව 2006 වර්ෂයේ දී ජනාධිපතිවරයා විසින් නව හදිසි අවස්ථා රෙගුලාසි මාලාවක් ප්‍රකාශයට පත් කරන ලදී. 2009 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා රජය එල්.ටී.ටී.ඊ. සංවිධානය පරාජය කරන ලද බව ප්‍රකාශයට පත් කරන ලද නමුත් දිගින් දිගටම හදිසි අවස්ථා තත්වය දීර්ඝ කරනු ලැබීය. 2009 වන විට මහජන ආරක්ෂක ආඥාපනත යටතේ නිකුත් කළ හදිසි අවස්ථා රෙගුලාසි මෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ විධිවිධාන හා රෙගුලාසි යන ස්වරූප වලින් හදිසි අවස්ථා බලතල අතිච්ඡාදනය වූ නොහොත් ද්විත්ව ආකාරයකින් බලාත්මක වූ විධිවිධාන තිබූ බවක් පැවසිය හැකිය. 2009 ට පෙර වූ වසර තුනක කාලය තුළ හදිසි අවස්ථා බලතල සහ ත්‍රස්ත-විරෝධී ක්‍රියාමාර්ගවල වර්ධනය 'වඩාත් සංකීර්ණ සහ ප්‍රයෝගකාරී'[9] බවට පත් වෙමින් තිබූ බව විස්තර කෙරී ඇත.

2009 වර්ෂය වන විට, ශ්‍රී ලංකාවේ ත්‍රස්ත විරෝධී නීති රාමුව බෙහෙවින් විස්තීර්ණ විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මක කිරීමෙන් පසුව නීතිගත කරන ලද, ඒ ආශ්‍රිත නීති කිහිපයක් පහත දැක්වේ: (1) 1982 අංක 24 දරන ගුවන්යානාවලට එරෙහි වූ වැරදි පනත, (2) 1988 අංක 70 දරන ත්‍රස්තවාදය මර්ධනය සඳහා වූ 'සාක්' කලාපීය සම්මුති පනත, (3) 1991 අංක 15 දරන ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂා කර ඇති පුද්ගලයින්ට එරෙහි අපරාධ වැළැක්වීමේ හා ඒවාට දඬුවම් දීමේ පනත, (4) 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සඳහා සේවා සපයන ගුවන්තොටුපල වලදී නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මර්ධනය කිරීමේ පනත, (5) 1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මර්ධනය කිරීමේ පනත, (6) 2000 අංක 41 දරන ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීම වැළැක්වීමේ පනත, (7) 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත, (8) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, (9) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තාකිරීමේ පනත, (10) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ (11) 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත.

ශ්‍රී ලංකා රජය හදිසි අවස්ථා තත්වය දීර්ඝ කිරීමක් ඉල්ලා නොසිටින බව 2011 අගෝස්තු 25 වැනි දින ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් නිවේදනය කරන ලදී.[10] නීතියේ ක්‍රියාත්මකවීම මගින් 2011 අගෝස්තු 30 වැනි දින වනවිට හදිසි අවස්ථා තත්වය අවලංගු වී ගියේ ය. ඒ අවස්ථාවේ දී ම, අයැදුම දීර්ඝ කිරීම, රැඳවූවන් සහ රිමාන්ඩ් භාරයේ සිටින්නන්, භාර වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් කිරීම සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වෙනම ම රෙගුලාසි හතරක් ගැසට් කරන ලදී.[11]

එයින් පසු අවුරුදු හයකුත් මාස හතක් ගත වූ විට, 2018 මාර්තු මාසයේ දී, මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වූ මුස්ලිම් විරෝධී කෝලාහල සඳහා ප්‍රතිචාර දක්වමින් දිවයින පුරා දින දහයක හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කරන ලදී.[12] හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කරන ලද මීළඟ අවස්ථාව වූයේ පාස්කු ඉරුදින ප්‍රහාරවලට පසු දින, එනම් 2019 අප්‍රේල් 22 වැනි දින විය.

---

[9] Sri Lanka: Briefing Paper – Emergency Laws and International Standards, Geneva: International Commission of Jurists, 2009, at page ii. Available at http://www.icj.org/IMG/SriLanka-BriefingPaper-Mar09FINAL.pdf. ප්‍රවේශය: 2009 අගෝස්තු 10

[10] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, "CPA statement on the termination of the state of emergency", 2011 අගෝස්තු 27 https://www.cpalanka.org/cpa-statement-on-the-termination-of-the-state-of-emergency/

[11] 2011 අගෝස්තු 29 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1721/02, 1721/03, 1721/4 සහ 1721/05.

[12] Human Rights Watch, State of Emergency Declared: Violence By Anti-Muslim Mobs Highlights Interethnic Strife, 7 March 2018, https://www.hrw.org/news/2018/03/07/state-emergency-declared-sri-lanka#

## 2.3 පොලිස් බලතල අනිසි ලෙස භාවිතය සහ සාමාන්‍ය අපරාධ නීතියේ සිදු වන ප්‍රමාදයන්

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි නීති ක්‍රියාත්මක කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය ඇතුළතින් සහ එම පද්ධතිය සමන්විත වන ක්‍රියාධරයින් විසින් බව මෙහිදී සිහිපත් කිරීම අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බලය අවභාවිතය, දූෂණය, විමර්ශන ක්‍රමවේද සීමා කිරීම, නීතියේ ප්‍රමාදයන්, වින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාවන් නොමැතිවීම, සහ සැකකරුවන්ට නිසි ක්‍රියාවලි අයිතිවාසිකම් ලබාදීමට අසමත්වීම ඇතුළු වත්මන් අපරාධ පද්ධතියේ පවතින සියළුම දුබලතා මෙම පද්ධතිය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාවෙහි යෙදවීමේ සංදර්භය තුළ නැවත ඇතිකිරීම සහ උග්‍රකරවීම සිදු වේ.[13]

ශ්‍රී ලංකාවේ බරපතළ අපරාධ සඳහා වරදකරු කිරීම් අනුපාතය 2019 දී 13.8% ක් ද, 2018 දී 16.5% ක් ද, 2017 දී 18.6% ක් ද විය.[14] 'විමර්ශන සිදු කිරීමට තිබෙන' නඩු අනුපාතය 2019 දී 57% ක් ද, 2018 දී 55.3% ක් ද 2017 දී 50.8% ක් ද විය. නඩු විමර්ශනය කිරීම සම්බන්ධයෙන් අපරාධ යුක්ති පද්ධතිය බරපතළ අභියෝගවලට මුහුණ දෙන බවත්, නඩු විභාගය ගෙනයෑම සඳහා සුදුනම් තත්වයේ යැයි සලකනු ලබන නඩු අතරින් සාමාන්‍යයෙන් සියයට අසූවකට (80%) වඩා නඩුවලදී වරද ඔප්පු කිරීමට අපොහොසත් වන බවත් මෙම සංඛ්‍යා ලේඛන වලින් අවධාරණය කරයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් මගින් සොයාගෙන තිබුණු අන්දමට මහාධිකරණයේ පවරනු ලබන බරපතළ අපරාධ නඩුවක්, එවැන්නකට ලබා ගැනීමට අවසර ඇති අභියාචනා අවස්ථා දෙක ද ලබාගන්නේ නම්, වත්මන් අපරාධ යුක්ති පද්ධතිය තුළ එම නඩුව අවසන් වීමට අවුරුදු 17ක් ගත වේ.[15] ශ්‍රී ලංකාවේ අධිකරණවල තවමත් නොවිසඳී පවතින නඩු 4,620 ක් අවුරුදු විස්සකට වැඩි කාලයක් පුරා විභාග වෙමින් පවතින නඩු බව අධිකරණ පද්ධතියෙහි ඇති ප්‍රමාදයන් සම්බන්ධයෙන් දළ විස්තරයක් ලබා දෙමින් අධිකරණ අමාත්‍යවරයා 2020 දෙසැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය.[16] විශේෂයෙන් ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන නඩු සඳහා, නඩු විභාගයට පූර්වයෙන් දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබා ගැනීම් සිදුවන බව අවධාරණය කළ මානව හිමිකම් කොමිෂන් සභාව, ඇතැම් සැකකරුවන් අවුරුදු 11 සිට 15 දක්වා තරම් කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරගතව පසුවන බව වාර්තා කළේ ය.[17]

## 2.4 ප්‍රතිසංස්කරණ සඳහා දරන ලද අසාර්ථක දේශපාලන තැත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිතා කිරීම් හා එහි අසාර්ථකවීම් පිළිබඳ විවේචනය කරන්නන් විසින් එම පනත අහෝසි කරන මෙන් දිගින් දිගටම ඉල්ලීම් සිදුකර තිබේ. 2015 වර්ෂයේ දී, **"මහජන**

---

13 මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් බන්ධනාගාර පිළිබඳව සිදු කළ
අධ්‍යයනයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින රැඳවියන් පිළිබඳව පරිච්ඡේදය බලන්න.
https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Study-by-HRCSL_Concise-ersion.pdf ("HRCSL
Prison Report 2020").

14 ශ්‍රී ලංකා පොලීසිය විසින් ඉදිරිපත් කළ 2019, 2018 සහ 2017 වර්ෂ සඳහා බරපතළ අපරාධ නඩු කටයුතු හමාර කිරීමේ සාර
සංග්‍රහයේ හෙළිදරවු කර තිබූ 'පැමිණිල්ල ගොනු කිරීමෙන් ඇරඹී වරදකරු කිරීමෙන් අවසන් වූ' නඩු පිළිබඳ සංඛ්‍යාලේඛන මත
පදනම් වෙමින් මෙම අනුපාත ගණනය කරන ලදී. 'පැමිණිල්ල ගොනුකළ' යනුවෙන් නියෝජනය වන නඩු, 'වරදකරු කිරීමෙන්
අවසන් වූ නඩු' සමගින් සෘජුවම සම්බන්ධ වන්නේ ය යන උපකල්පනය මෙහිදී සිදුකර තිබේ.
ශ්‍රී ලංකා පොලීසිය විසින් ඉදිරිපත් කළ 2019, 2018 සහ 2017 වර්ෂ සඳහා බරපතළ අපරාධ නඩු කටයුතු හමාර කිරීමේ සාර
සංග්‍රහයේ හෙළිදරවු කර තිබූ 'තත්‍ය මුළු නඩු ප්‍රමාණය' සහ විමර්ශනය කිරීමට නියමිත නඩු පිළිබඳ සංඛ්‍යාලේඛන මත පදනම්
වෙමින් මෙම අනුපාත ගණනය කරන ලදී. 'තත්‍ය මුළු නඩු' යනුවෙන් නියෝජනය වන නඩු, 'විමර්ශනය කිරීමට නියමිත නඩු'
සමගින් සෘජුවම සම්බන්ධ වන්නේ ය යන උපකල්පනය මෙහිදී සිදුකර තිබේ.

15 2017 සැප්තැම්බර් 20 වැනි දින දරන, නීති කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක
සභාව විසින් අපරාධ යුක්තිය නොපමාව සහ කාර්යක්ෂමව පසිඳලීම සම්බන්ධයෙන් සිදුකළ නිර්දේශ.

16 "Over 4000 cases filed 20 to 25 years ago still heard in Sri Lanka" dated 6th December 2020, Newswire
website. Found at http://www.newswire.lk/2020/12/06/over-4000-cases-filed-20-25-years-ago-still-heard-in-sri-lanka-cours/

17 HRCSL බන්ධනාගාර වාර්තාව 2020 පිටු අංක 525.

*ආරක්ෂක ආඥාපනත සමාලෝචනය කිරීමට සහ **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සමාලෝචනය කර අහෝසි කිරීමටත්** ඒ වෙනුවට වර්තමාන ජාත්‍යන්තර යහපරිචයන් හා අනුකූල ත්‍රස්ත විරෝධී නීති පැනවීමටත් ශ්‍රී ලංකා රජයෙහි ඇති කැපවීම සාදරයෙන් පිළිගනු ලැබේ"* යනුවෙන් 12 වැනි වගන්තියෙහි සඳහන්ව තිබෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනාසම්මත අංක 30/1 හරහා එවකට පැවති රජය පොරොන්දු විය (අවධාරණය කිරීමක් එක් කර තිබේ).

2018 ඔක්තෝබර් 9 වැනි දින, කිසිම ආකාරයකින් මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියකට භාජනය නොකර කෙටුම්පත් කරන ලද ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා වන ප්‍රගතිශීලී විකල්පයක් වශයෙන් මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ද, සහ එයට ඇතැම් කණ්ඩායම්වල සහාය ලැබුණ ද, මෙම යෝජිත ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත සභාගත කිරීමට පෙර සහ ඉන් පසුව පනත් කෙටුම්පතෙහි අඩංගු විධිවිධාන සම්බන්ධයෙන් තවත් පාර්ශ්ව වලින් විරෝධතා එල්ල විය.[18] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සංවරණය නොවන බලය අවභාවිතය, හෝ වධහිංසා හා දීර්ඝ කාලයක් රඳවා තැබීමට ලක්වීම සම්බන්ධයෙන් ජනතාව අත්විඳ ඇති ජීවමාන අත්දැකීම් පිළිබඳ අවබෝධය මෙම ප්‍රති ත්‍රස්ත පනත කෙටුම්පත් කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැති බවක් පෙනෙන්නට තිබුණු බව මෙහි ලා අවධාරණය කිරීම වැදගත් වේ. නීතියේ ප්‍රමාදයන්, නීති ආධාර වෙත ප්‍රවේශය සම්බන්ධයෙන් සහතික වීමක් නොමැතිවීම, මූලික අයිතිවාසිකම් නීත්‍යානුකූලව ආරක්ෂා කිරීම හා අත්කරගැනීම සඳහා වන සීමා කිරීම් සහ ප්‍රති ත්‍රස්ත ක්‍රියාමාර්ග සඳහා ප්‍රබල නෛතික රාමුවක් පැවතීම හා අදාළ වන පුළුල් පසුබිම මෙම පනත් කෙටුම්පත තුළ සැලකිල්ලට ගෙන නොමැති බව නිරීක්ෂණය කරන ලදී.[19] විවිධාකාර ස්ථාවරයන් ගණනාවකින් මෙම පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද අතර, 2018 නොවැම්බර් 14 වැනි දින ඒ සම්බන්ධයෙන් එම අධිකරණයේ තීන්දුව ලබා දෙන ලදී. [20] අනෙකුත් කරුණු අතර, මරණ දඬුවම ලබා දීමට අපොහොසත් විධිවිධානය, සැකකරුවෙක් මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කළ හොත් රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමට අවසර ලබා දෙන විධිවිධාන සහ ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති ජාත්‍යන්තර මානව හිමිකම් සාධනපත්‍ර රටේ නීතියට ඇතුළත් වන්නේ යැයි නිර්වචනය කළ විධිවිධාන මගින් සමානාත්මතාවය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති සහතිකය උල්ලංඝනය වන බවට තීරණය කළ එම අධිකරණය, ඒ අනුව මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් සම්මත විය යුතු බව තීරණය කළේය. ඒ අනුව එම අවස්ථාවේ දී ප්‍රතිත්‍රස්ත පනත සම්මත නොකරන ලදී.

2020 ජනවාරි 4 වැනි දින, එනම් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයට පත් වී මාස දෙකකට පසුව, කැබිනට් ප්‍රකාශක බන්දුල ගුණවර්ධන සඳහන් කර තිබුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තවදුරටත් තබා ගැනීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලද බවත්, යෝජිත ප්‍රතිත්‍රස්ත පනත ඉවත්කර ගැනීමේ යෝජනාවකට කැබිනට් අනුමැතිය ලැබුණු බවත් ය. එම ප්‍රතිත්‍රස්ත පනත මගින් 'සන්නද්ධ හමුදා සහ පොලීසිය ත්‍රස්තවාදයේ තර්ජනය සම්බන්ධයෙන් ඵලදායී අන්දමින් කටයුතු කිරීම වළක්වනු ලැබිය හැකිව තිබූ බවත්, ඒ වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනතාවට සහතික කර දී ඇති දේශපාලන වෘත්තීය සමිති අයිතිවාසිකම් සහ ප්‍රකාශනයේ නිදහස වැනි අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ඇති' බව ඔහු පැහැදිලි කළේ ය.

---

[18] විරුද්ධ පක්ෂ, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය, අන්තර් විශ්වවිද්‍යාලීය සම්මේලනය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, නිදහස් ව්‍යාපාරය, සහ මානව හිමිකම් ක්‍රියාධරයින් ප්‍රතිත්‍රස්ත පනත සම්බන්ධයෙන් සැලකිලිමත්විය යුතු කරුණු ඉස්මතු කරන බව පුවත් ලිපිවල සඳහන් විය. බලන්න:සන්ඩේ ටයිම්ස් පුවත්පතේ 2017 අප්‍රේල් 30 පලවූ කිෂාලි පින්තු ජයවර්ධනගේ ලිපිය: "Skullduggery, Secrecy and the Counter Terrorism Act" http://www.sundaytimes.lk/170430/columns/skullduggery-secrecy-and-the-counter-terror-draft-act-238848.html, D Withanage and S Gunadasa, "Sri Lankan Government Prepares New Anti Terrorism Laws" [World Socialist Website, 9th April 2019] ප්‍රවේශය: https://www.wsws.org/en/articles/2019/04/09/ctas-a09.html.

[19] යෝජිත ප්‍රති ත්‍රස්ත නීතිය සම්බන්ධයෙන් 2017 තිබුණු තත්වය සහ 2018 ඔක්තෝබරයේදී එම පනත පාර්ලිමේන්තුවේ දී සභාගත කළ අවස්ථාවට ද අදාළවන සාකච්ඡාවක් සඳහා බලන්න: "A Knockout Punch by Security on Liberty: The Proposed Counter Terror Law", Ermiza Tegal, LST Review, December 2017, Law and Society Trust.

[20] 2018 නොවැම්බර් 14 වැනි දින දරන, ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ නඩු තීන්දු අංක 41 සිට 47/2018.

## 2.5 2019 පාස්කු බෝම්බ ප්‍රහාරවලින් අනතුරුව වූ පසුබිම

2019 අප්‍රේල් 21 වැනි දින සිදු වූ ප්‍රචණ්ඩ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් ශ්‍රී ලංකාවේ සිවිල් වැසියන් 269 දෙනෙක් මරුමුවට පත් වූහ. යුද්ධය අවසන් වී රට නැවතත් යථා තත්වයට පත්වීම ආරම්භවී වසර දහයක් ගත වී තිබුණු අතර, එම කාලය තුළ විටින් විට වර්ගවාදී ප්‍රචණ්ඩත්වය, ප්‍රධාන වශයෙන්ම මුස්ලිම් ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇති වී තිබුණි. පාස්කු ඉරු දින සිදුවූ එම බෝම්බ ප්‍රහාර සිදුවී ඉතා කෙටි කාලයක් තුළ එම ප්‍රහාර සඳහා වරදකරුවන් 'මුස්ලිම්' තැනැත්තන් බව පොදුවේ හඳුනාගන්නා ලදී. එම ප්‍රහාරවල විශාලත්වය කෙතරම් වූයේ ද යත් රට නැවතත් පෙර හුරු පුරුදු භීතිය, අහිමිවීම් සහ අවිනිශ්චිතතාවයේ හැඟීම් තුළ ගිලී ගියේ ය.

අප්‍රේල් 22 වැනි දින, එනම් එම ප්‍රහාර වලට පසු දින මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා මහජන ආරක්ෂක ආඥාපනතෙහි දෙවැනි කොටස බලාත්මක වන බව ප්‍රකාශයට පත් කරමින් රට තුළ හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කළේ ය.[21] එදින ම, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා ජනාධිපතිවරයා විසින් සන්නද්ධ බලකා සාමාජිකයින්ව කැඳවන ලද[22] අතර හදිසි අවස්ථා රෙගුලාසි මාලාවක් ද පනවන ලදී.[23] එම රෙගුලාසිවලට සිදු කළ යම් නිවැරදි කිරීම් කිහිපයක් අප්‍රේල් 24 වැනිදා ප්‍රකාශයට පත් කරන ලදී.[24] ඉන්පසුව, අප්‍රේල් 29[25] සහ මැයි 13[26] යන දිනවලදී එම රෙගුලාසි තවදුරටත් සංශෝධනය කරන ලදී.

මැයි 22[27] සහ ජූනි 22[28] යන දින වලදී, හදිසි අවස්ථාව මාසයකින් දීර්ඝ කරන බව ප්‍රකාශ කරමින් ජනාධිපතිවරයා විසින් නිවේදන නිකුත් කරන ලද අතර එයින් එතෙක් බලාත්මකව තිබූ හදිසි තත්වය තවදුරටත් දීර්ඝ විය. ජූනි මස 27 වැනි දින[29] හදිසි තත්වය මාසයකින් දීර්ඝ කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණු අතර, ජූලි මස 13 වැනි දින එම යෝජනාවට පක්ෂව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 40 දෙනෙකුගේත් විපක්ෂව දෙදෙනෙකුගේත් (2) ඡන්දයෙන් හදිසි තත්වය තවත් මාසයකින් දීර්ඝ කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවේ දී සම්මත විය.

අවුරුද්දක් දක්වා දීර්ඝ කළහැකි රැඳවුම් නියෝග (19(1) රෙගුලාසිය), රැඳවුම් නියෝග අධිකරණයකින් ප්‍රශ්න කළ නොහැකි බව ප්‍රකාශිත විධිවිධාන (19(10) රෙගුලාසිය), එවැනි නියෝගයකින් අගතියට පත් පුද්ගලයකුට කළහැක්කේ උපදේශක කමිටුවකට තම විරෝධතා ඉදිරිපත් කිරීම හා ජනාධිපතිවරයා වෙත නියෝජනය ඉදිරිපත් කිරීම පමණක් වීම (එවකට ආරක්ෂක අමාත්‍යාංශය ජනාධිපතිවරයා යටතේ පැවතුණි), 'මහජන සාමයට බාධා කිරීමට ඉඩ ඇතැයි හෝ කලකිරීම ප්‍රවර්ධනය කරනු ඇතැයි' ජනාධිපතිවරයාගේ මතය වන ජනතා පෙළපාලි හෝ රැස්වීම් පැවැත්වීම තහනම් කිරීමේ බලය ජනාධිපතිවරයාට ලබාදෙන විධිවිධාන (13 වැනි රෙගුලාසිය) ඇතුළු ත්‍රස්තවාදය වැළැක්වීම පනත යටතේ ඒ වන විටත් තිබූ පුළුල් පරාසයක වූ පොලිස් බලතල හදිසි අවස්ථා රෙගුලාසි ඔස්සේ තවදුරටත්

21 2019 අප්‍රේල් 22 වැනි දිනැති අංක 2120/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය http://www.documents.gov.lk/files/egz/2019/4/2120-03_E.pdf

22 2019 අප්‍රේල් 22 වැනි දිනැති අංක 2120/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය http://www.documents.gov.lk/files/egz/2019/4/2120-04_E.pdf

23 2019 අප්‍රේල් 22 වැනි දිනැති අංක 2120/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය http://www.documents.gov.lk/files/egz/2019/4/2120-05_E.pdf

24 2019 අප්‍රේල් 24 වැනි දිනැති අංක 2120/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය

25 2019 අප්‍රේල් 29 වැනි දිනැති අංක 2121/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය

26 2019 මැයි 13 වැනි දිනැති අංක 2123/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය

27 2019 මැයි 22 වැනි දිනැති අංක 2124/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය http://documents.gov.lk/files/egz/2019/5/2124-10_E.pdf

28 2019 ජූනි 22 වැනි දිනැති අංක 2128/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය http://documents.gov.lk/files/egz/2019/6/2128-35_E.pdf

29 2019 ජූනි 27 හැන්සාඩ් වාර්තාව, 272 වෙළුම - අංක 5 https://www.parliament.lk/uploads/documents/hansard/1562229080015022.pdf

පුළුල් කරන ලදී. යම් යම් කාරණා සම්බන්ධයෙන් ප්‍රකාශන පළ කිරීම හෝ එවැනි කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සිට බාහිර ස්ථාන කරා සම්ප්‍රේෂණය කිරීම සීමා කිරීමට නිසි බලධාරියකුට අවසර ලබා දීම ඇතුළුව ප්‍රකාශනයේ නිදහස බරපතල අන්දමින් සීමා කිරීමට 15(1) රෙගුලාසිය මගින් කටයුතු කර තිබේ. එමෙන් ම, මුහුණු ආවරණය කරන වේල්පට සහ බුර්කා තහනම් කිරීමට හේතුවන අන්දමින් ප්‍රසිද්ධ ස්ථාන වලදී සම්පූර්ණයෙන් ම මුහුණ වසා සිටීම ද මෙම රෙගුලාසි තුළින් තහනම් කරන ලදී.

2019 අගෝස්තු 22 වැනි දින හදිසි අවස්ථා තත්වය අහෝසි වන්නට ඉඩ හරින ලදී.

පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව සිදුකළ අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම් සම්බන්ධයෙන් පවතින තොරතුරු ඉතා සීමිත වන අතර, ප්‍රසිද්ධ තලයේ මේ සම්බන්ධයෙන් ලබා ගැනීමට තිබෙන තොරතුරු වලට පහත දැක්වෙන වාර්තා ඇතුළත් වේ. 2019 සැප්තැම්බර් මාසයේදී ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ග්‍රෑප් සංවිධානයේ වාර්තාවක මෙසේ සඳහන්ව තිබුණි: "පාස්කු ඉරු දින ප්‍රහාර වලින් පසුව, බෝම්බ ප්‍රහාර හෝ ඒ සම්බන්ධ සිදුවීම් වලට අදාළව **මුස්ලිම් පුද්ගලයින් 1,800** ට වැඩි සංඛ්‍යාවක් අත් අඩංගුවට ගෙන ඇති අතර (2019) සැප්තැම්බර් මුල් කාලය වන විට ද **300 ට ආසන්න පුද්ගලයින් සංඛ්‍යාවක්** තවමත් අත් අඩංගුවේ පසු වෙති".[30] 2020 අප්‍රේල් මාසය වන විට පාස්කු ඉරු දින ප්‍රහාර සම්බන්ධයෙන් සිදුකරගෙන යන විමර්ශන කටයුතු වලට අදාළව **සැකකරුවන් එකසිය අනූ හත් දෙනෙක්** අත් අඩංගුවට ගෙන තිබූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, පොලිස් අධිකාරී ජාලිය සේනාරත්න තහවුරු කළ බව 2020 අප්‍රේල් මාසයේදී පළ වූ 'ඩේලි නිවුස්' පුවත්පතේ ලිපියක වාර්තා කර තිබුණි.[31] 'පසුගිය ගිම්හානයේ සිදුවූ ප්‍රහාර සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන කොළඹ අපරාධ කොට්ඨාසය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය එතැන් පටන් මේ දක්වා 200 ඉක්මවූ සැකකරුවන් සංඛ්‍යාවක් අත් අඩංගුවට ගෙන ඇති' බව 2020 ජූනි මාසයේ දී 'ද හින්දු' පුවත්පත වාර්තා කර තිබුණි.[32]

2019 අප්‍රේල් මාසයෙන් පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කළ මුළු අත් අඩංගුවට ගැනීම් සංඛ්‍යාව සම්බන්ධයෙන් ප්‍රසිද්ධ තලය තුළ ප්‍රවේශ විය හැකි තොරතුරු නොමැත. මෙම වාර්තාව සම්පාදනය කර අවසන් කරන අවස්ථාව වන විට (2020 දෙසැම්බර්), ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කාත්තන්කුඩි ප්‍රදේශයෙන් ළදරුවන් ද සමග කාන්තාවන් දෙදෙනෙකු ඇතුළුව කාන්තාවන් 6 දෙනෙකු අත් අඩංගුවට ගෙන ඇතැයි අලුතින් තොරතුරු අනාවරණය වී තිබුණි. මෙම නීතියෙහි සුවිශේෂී ස්වභාවය හේතුකොට ගෙන, මෙම අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම් පිළිබඳව ප්‍රසිද්ධ කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම හා අධ්‍යයනය කිරීම ද වැදගත් වේ.

---

[30] International Crisis Group (ICJ), 'After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence' (27 September 2019) Asia Report N 302.

[31] Sandasen Marasinghe, 'Easter attacks: 197 suspects arrested' (Daily News) 15 April 2020 <https://www.dailynews.lk/2020/04/15/law-order/216500/easter-attacks-197-suspects-arrested> accessed 17 November 2020.

[32] Meera Srinivasan, 'Sri Lanka's Easter bombings probe is at final stages, say police.' (The Hindu) 20 June 2020 <https://www.thehindu.com/news/international/sri-lankas-easter-bombings-probe-is-at-final-stages-say-police/article31878643.ece> accessed 17 November 2020.

# 3. නීතිමය රාමුව

## 3.1 ත්‍රස්ත විරෝධී නීතිය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන්

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ෂසසජසඎ) (1966) ඇතුළුව ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුති අටක් සඳහා ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වී තිබේ.[33] සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් අත් අඩංගුවේ සිටින තැනැත්තන්ගේ සහ රැඳවියන්ගේ මූලික අයිතිවාසිකම් කිහිපයක් සහතික කරනු ලැබේ. නීතියෙන් විධිවිධාන සලසා ඇති අන්දමට ප්‍රමාණවත් පදනමක් නොමැති නම් පුද්ගලයෙකු අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීමට හෝ රඳවා තැබීමට නොහැකි බව එහි 9 වැනි වගන්තියෙහි සඳහන් වේ.[34]

- පුද්ගලයකු අත් අඩංගුවට ගන්නේ නම්, අත් අඩංගුවට ගන්නා අවස්ථාවේදී එසේ අත් **අඩංගුවට ගැනීමට හේතු එම පුද්ගලයා වෙත දැනුම් දිය යුතු අතර,** ඔහුට එරෙහිව ඇති චෝදනා නොපමාව ඔහුට දැනුම් දිය යුතු වේ.[35]
- අපරාධ චෝදනා මත අත් අඩංගුවට ගන්නා හෝ රඳවා ගත් ඕනෑම අයෙක් **කඩිනමින් විනිසුරුවරයෙකු ඉදිරියට පැමිණ විය යුතු** අතර සාධාරණ කාලයක් තුළ නඩු විභාගයකට භාජනය වීමට හෝ නිදහස් කරනු ලැබීමට එම තැනැත්තාට හිමිකම් තිබිය යුතුය.[36]
- අත් අඩංගුවට ගැනීම හෝ රඳවා තැබීම හේතුවෙන් නිදහස අහිමිවන ඕනෑම අයෙකුට තමන් එසේ රඳවා තැබීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් **අධිකරණ සමාලෝචනයක් සඳහා හිමිකම තිබෙන අතර,** එම රඳවා තැබීම නීති විරෝධී නම් නිදහස් කිරීමේ නියෝගයක් ලැබීමට ද හිමිකම තිබේ.[37]
- නීතිවිරෝධී ලෙස රඳවාගෙන ඇත්නම්, **වන්දි ලබා ගැනීම සඳහා බලාත්මක කළ හැකි අයිතිවාසිකමක් වින්දිතයාට තිබේ.** [38]
- රඳවා තැබීමේ අත්තනෝමතික බව හා නීතිවිරෝධී බව අභියෝගයට ලක් කිරීම සඳහාත්, ප්‍රමාදයකින් තොරව උචිත හා ප්‍රවේශ විය හැකි ප්‍රතිකර්ම ලබා ගැනීම සඳහාත් අධිකරණ මගින් කටයුතු කිරීමට ඇති අයිතිය හමුදාවෙන් රඳවා තැබීම, ආරක්ෂක රඳවා තැබීම හා ත්‍රස්ත විරෝධී ක්‍රියාමාර්ග යටතේ රඳවා තැබීම යන සියළු ආකාරයේ රඳවා තැබීම් සඳහා අදාළ වේ.[39]

මෙයට පාදක වන පූර්ව නිගමනය වන්නේ නිදහස පිළිබඳව සහතික කිරීමකි. 'පුද්ගලයාගේ නිදහස සහ ආරක්ෂාව ඔවුන්ගේම යහපත උදෙසා මහාර්ඝ වේ...'[40] යනුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව නිරීක්ෂණය කර තිබේ. පුද්ගලයාගේ ආරක්ෂාව 'ශරීරයට හා මනසට හානි සිදුවීමෙන් හෝ ශාරීරික මානසික ඒකාග්‍රතාවයට හානි වීමෙන් නිදහස' හා සම්බන්ධ යැයි නිර්වචනය කරනු ලැබ තිබේ.

---

33 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය; වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ පහත් සැලකීම් හෝ ද දඬුවම්වලට එරෙහි සම්මුතිය; ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය; සියලු ආකාරයේ වර්ගවාදී වෙනස්කම් කිරීම තුරන් කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය; කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය; ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය; බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය; සහ වධහිංසාවට එරෙහි සම්මුතියේ විකල්ප කෙටුම්පත.

34 ICCPR 9(1) වගන්තිය

35 ICCPR 9(2) වගන්තිය

36 ICCPR 9(3) වගන්තිය

37 ICCPR 9(4) වගන්තිය

38 ICCPR 9(5) වගන්තිය

39 එම, 47 ඡේදය.

40 ICCPR පොදු විස්තරය අංක 35 (CCPR/C/GC/35) 2 ඡේදය

පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ නිදහස අහිමි කළ යුත්තේ එසේ කිරීම මුළුමනින් ම අවශ්‍ය වන අවස්ථාවක දී පමණි.

නිදහස අහිමි කරන්නේ නම්, එය අත්තනෝමතික විය නොහැකි ය. රඳවා තැබීමක් අත්තනෝමතික රඳවා තැබීමක් වීම එහි නුසුදුසුබව, අසාධාරණබව සහ කලින් කීමට හැකියාවක් නොතිබීම යන කාරණු සහ නීතියේ නිසි ක්‍රියාවලියේ, යුක්තිසහගත භාවයේ, අවශ්‍යතාවයේ හා සමානුපාතිකභාවයේ මූලිකාංග මත පදනම් වේ.[41]

අත්තනෝමතික රඳවා තැබීම් සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (UNWGAD) විසින් හඳුනාගෙන ඇති පරිදි:

(අ) අනෙකුත් කරුණු අතර, සාධාරණ නඩුවිභායක් සඳහා ඇති අයිතියට අදාළ ජාත්‍යන්තර සම්මතයන් නොපිළිපැදීම හෝ අඩ වශයෙන් පිළිපැදීම කෙතරම් බරපතළ ද යත් එම නිදහස අහිමි කිරීම වෙත අත්තනෝමතික ගති ලක්ෂණ ආරෝපණය කිරීමට තරම් එය ප්‍රමාණවත් අවස්ථාවල, සහ ජාතික, ජනවාර්ගික හෝ සමාජ සම්භව, ආගමික, ආර්ථික තත්ව යනාදිය[42] ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ සාධක මත පදනම්ව සිදු කරන වෙනස්කොට සැලකීම් හේතුකොටගෙන, එකී නිදහස අහිමිකිරීම ජාත්‍යන්තර නීති උල්ලංඝනයක් වන අවස්ථාවල නිදහස අහිමි කිරීම යුක්තිසහගත බව කීමට කිසිදු නීතිමය පදනමක් යොදා ගැනීම පැහැදිලිවම කළ නොහැකි අවස්ථා **අත්තනෝමතික** රඳවා ගැනීම් ලෙස හඳුනාගනු ලැබේ.

(ආ) නිදහස අහිමි කිරීමක් නීතියෙන් තහවුරු කළ හේතු සහ කාර්යපටිපාටි මත පදනම් නොවන්නේ නම් එය '**නීතිවිරෝධී**' නිදහස අහිමි කිරීමක් යනුවෙන් හඳුනාගනු ලැබේ. එවැනි 'නීතිවිරෝධී' රඳවා තැබීම්වලට දේශීය නීති උල්ලංඝනය කරන රඳවා තැබීම් මෙන්ම, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට, ජාත්‍යන්තර නීතියේ පොදු මූලධර්ම වලට, ව්‍යවහාර ජාත්‍යන්තර නීතිවලට, ජාත්‍යන්තර මානුෂීය නීතියට සහ රාජ්‍යයන් විසින් පිළිගත් අනෙකුත් ජාත්‍යන්තර මානව හිමිකම් සාධනපත්‍රවලට පරස්පර වන රඳවා තැබීම් යන දෙකම ඇතුළත් වේ.[43]

## පරිපාලනමය රඳවා තැබීම්

චෝදනාවකින් හෝ නඩුවිභාගයකින් තොරව පුද්ගලයෙකු රඳවා තැබීම ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට පටහැනි ය. ත්‍රස්තවාදය, ත්‍රස්ත මර්ධනය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමේ විද්වත් නීති මණ්ඩලය 'සැබෑ හදිසි අවස්ථාවකින් පරිබාහිර අවස්ථාවල චෝදනා ගොනු කිරීමකින් හෝ නඩු විභාගයකට යෑමෙන් වැළකී සිදුකරන පරිපාලනමය රඳවා තැබීම් සඳහා අවසර ලබා දෙන සියලුම නීති' රාජ්‍යයන් විසින් අහෝසි කළ යුතු යැයි නිර්දේශ

> **සැබෑ හදිසි අවස්ථාවකින් පරිබාහිර අවස්ථාවල චෝදනා ගොනුකිරීම හෝ නඩුවිභායකට යෑමෙන් වැළකී සිදුකරන පරිපාලනමය රඳවා තැබීම් සඳහා අවසර ලබා දෙන සියලුම නීති අහෝසි කළ යුතු ය.**
>
> ත්‍රස්තවාදය, ත්‍රස්ත මර්ධනය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වූ අන්තර්ජාතික යුක්ති අධිකරණයේ විද්වත් ජූරි මඬුල්ලෙහි නිර්දේශය (2012)

---

41 ICCPR General Comment No. 35; para 12; UNWGAD Deliberation No 9 A/HRC/22/44 (24 December 2012).

42 Report of the Working Group on Arbitrary Detention, United Nations Basic Principles and Guidelines on Remedies and Procedures on the Right of Anyone Deprived of Their Liberty to Bring Proceedings Before a Court A/HRC/30/37 (6 July 2015) para 10.

43 Report of the Working Group on Arbitrary Detention, United Nations Basic Principles and Guidelines on Remedies and Procedures on the Right of Anyone Deprived of Their Liberty to Bring Proceedings Before a Court A/HRC/30/37 (6 July 2015) para 12.

කර තිබේ.[44] මානව හිමිකම් ගිවිසුම්වල බැඳීසිටීම් වලින් බැහැර වීමට අවසර ලැබෙන පරිදි සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සමුමුතියෙහි 4 වැනි වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූලව හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබෙන අවස්ථාවල ඉතාමත් සුවිශේෂී වාතාවරණයන් යටතේ පමණක් මහජන ආරක්ෂාවේ නාමයෙන් සිදුකරන පරිපාලනමය රඳවා තැබීම් ඉවසා සිටිනු ලැබේ. එවැනි වාතාවරණයන් යටතේ පවා තමන්ගේ නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන්ට සෑම විටකම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියෙහි (ICCPR) 9 වැනි වගන්තිය යටතේ හිමිවන පහත සඳහන් අයිතිවාසිකම් රජය විසින් සහතික කළයුතු වේ:

(1) අත් අඩංගුවට ගැනු ලැබීමට හේතු දැනුම් දෙනු ලැබීම සඳහා ඇති අයිතිය (ICCPR හි 9(2) වැනි වගන්තිය)

(2) නීතිය මගින් නියම කර ඇති හේතු හා කාර්යපටිපාටි මත පමණක් රඳවා තබනු ලැබීමේ අයිතිය (ICCPR හි 9(1) වැනි වගන්තිය)

(3) රඳවා තැබීම සෑමවිටම අධිකරණ පාලනයේ තිබීම (ICCPR හි 9(4) වැනි වගන්තිය)

(4) රඳවා තැබීම නීති විරෝධී බව සොයා ගනු ලැබුව හොත් වන්දි ලැබීම සඳහා වන බලාත්මක කළහැකි අයිතිය (ICCPR හි 9(5) වැනි වගන්තිය )

ත්‍රස්ත මර්ධන ක්‍රියාමාර්ගයක් වශයෙන් පරිපාලනමය රඳවා තැබීම යොදා ගැනීම ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගනු ගනු නොලැබේ. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැකපිට පුද්ගලයින් රඳවා තබා ගන්නේ නම් ඒ සඳහා පැහැදිලි චෝදනා තිබිය යුතු ය.

## අත්තනෝමතික රඳවා තැබීම සඳහා සම්පූර්ණ තහනමක්

අත්තනෝමතික අන්දමින් නිදහස අහිමිකිරීම තහනම් කිරීම ව්‍යවහාර ජාත්‍යන්තර නීතියක තත්වය අත්කර ගෙන ඇති අතර, එය ජාත්‍යන්තර නීතියෙහි බැහැර කළ නොහැකි jus cogens මූලධර්මයක් ලෙස සලකනු ලැබේ.[45] jus cogens යනුවෙන් අදහස් කෙරෙන්නේ කිසිදු ආකාරයකින් බැහැර වීමට අවසර නොමැත්තේ යැයි ජාත්‍යන්තර රාජ්‍ය ප්‍රජාව විසින් පිළිගනු ලබන ජාත්‍යන්තර නීතියෙහි මූලික මූලධර්මයක් වේ. මෙම තහනම මහජන හදිසි අවස්ථා ද ඇතුළු 'සියලුම අවස්ථා සඳහා පූර්ණ වශයෙන් අදාළ වන' බව අත්තනෝමතික රඳවා තැබීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම විසින් සලකනු ලැබේ.[46] 'අත්තනෝමතික රඳවා තැබීමට එරෙහි මූලික සහතිකවීම කිසිදු ආකාරයකින් බැහැර කළ නොහැකි මූලධර්මයක් වන අතර, 4 වැනි වගන්තියෙන් ආවරණය වන අවස්ථාවල පවා එම වාතාවරණය යටතේ අසාධාරණ හෝ අනවශ්‍ය අන්දමින් නිදහස අහිමි කිරීම යුක්ති සහගත යැයි කීමට නොහැකි ය' යනුවෙන් මානව හිමිකම් කමිටුව නිරීක්ෂණය කරයි.[47] සරල බසින් පවසන්නේ නම්, මහජන හදිසි අවස්ථාවකදී පවා අත්තනෝමතික රඳවා තැබීමට එරෙහිව මෙම තහනම අත්හිටුවීමට රාජ්‍යයන්ට නොහැකි ය යන්න මෙහි අර්ථය වේ. අත්‍යාවශ්‍ය ළැදියාවක් ආරක්ෂා කිරීමට හෝ ඒ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සමප්‍රමාණ වන්නේය යන පදනමින් නිතීවිරෝධී, අසාධාරණ හෝ කලින් කීමට නොහැකි අන්දමින් නිදහස අහිමි කිරීම අවශ්‍ය වන්නක් යැයි කියාපෑමට රාජ්‍යයන්ට කිසිවිටකත් ඉඩක් නොමැති බව අත්තනෝමතික රඳවා තැබීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම පවසයි.[48]

---

44 International Commission of Jurists, Authority without Accountability: The Crisis of Impunity in Sri Lanka (November 2012) at page 146.

45 General Assembly, Human Rights Council report A/HRC/22/44, para. 43 and 51.

46 එම, 51 ඡේදය.

47 General Comment No. 35 (CCPR/C/GC/35) para 66. මෙහිදී ICCPR හි 4වැනි වගන්තිය පිළිබඳව සඳහන් වන්නේ මහජන හදිසි අවස්ථා පසුබිමක් තුළ රාජ්‍යයන්ට ඇතැම් අයිතිවාසිකම්වල අගය අඩුකළ හැකිය යන්න එහි පිළිගෙන තිබීම පිළිබඳව සඳහන් කිරීමට ය.

48 General Assembly, Human Rights Council report (A/HRC/22/44), para. 48

## අත්තනෝමතික රඳවා තැබීම සහ ත්‍රස්තවාදයට එරෙහිව සටන්කිරීම

ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමෙහි (ICJ" බර්ලින්) ත්‍රස්තවාදයට එරෙහිව සටන්කිරීමේදී මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම පිළිබඳ බර්ලින් ප්‍රකාශනයට අනුව, ත්‍රස්ත මර්ධන ක්‍රියාමාර්ග නීත්‍යානුකූලභාවයෙහි, අවශ්‍යතාවයෙහි, සමානුපාතිකබවෙහි සහ වෙනස්කොට නොසැලකීමෙහි මූලධර්මවලට අනුකූලව ක්‍රියාත්මක කරන්නේ නම්, ත්‍රස්තවාදී ක්‍රියාවන්ගෙන් පුද්ගලයින් ආරක්ෂා කරගැනීම සඳහා රාජ්‍යයන්ට බැඳීමක් ඇත.[49] එම ප්‍රකාශනයෙහි තවදුරටත් සඳහන් වන අන්දමට, ත්‍රස්ත මර්ධන ක්‍රියා -

- අවභාවිත නොකළ යුතු ය,
- ත්‍රස්තවාදී ක්‍රියාවලට සම්බන්ධ යැයි සැක කරන තැනැත්තන්ට එරෙහිව නීතියෙන් විධිවත් අන්දමින් නිර්වචනය කර ඇති අපරාධ සම්බන්ධයෙන් පමණක් චෝදනා ගොනු කළ හැක.
- ත්‍රස්තවාදී ක්‍රියා සඳහා අපරාධ වගකීම පුද්ගල වගකීමක් මිස සාමුහික වගකීමක් නොවිය යුතු ය,[50]
- කිසිදු වාතාවරණයක් යටතේ පුද්ගලයකු රහසේ හෝ අන්‍යයන් සමගින් කථාකිරීම වළක්වන අන්දමින් රඳවා තැබීම නොකළ යුතු වන අතර නීතිවේදීන්, පවුලේ සාමාජිකයින් සහ වෛද්‍ය කාර්යමණ්ඩල වෙත ඔවුන්ට නොපමාව ප්‍රවේශය සලසා දිය යුතු වේ,[51]
- පරිපාලනමය රඳවාතැබීමක් සිදුකරන්නේ නම්, එය කාල සීමාකිරීම් වලින් තදින් ම බැඳී ඇති සහ නිරන්තර හා ක්‍රමවත් අධිකරණ අධීක්ෂණයක් යටතේ සිදුකෙරෙන විශේෂිත වූ ක්‍රියාමාර්ග යක් විය යුතු ය.[52] මහජන ආරක්ෂාව යන පදනම මත සිදුකරන එවැනි පරිපාලනමය රඳවා තැබීම් සඳහා අවසර ලැබෙන්නේ තමන්ගේ මානව හිමිකම් ගිවිසුම්වල බැඳී සිටීම්වලින් බැහැර වීමට රාජ්‍යයන්ට අවසර ලැබෙන, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 4 වැනි වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූල අන්දමින් හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කළ අවස්ථාවලදී සුවිශේෂී වාතාවරණයන් යටතේ පමණකි.[53] එවැනි තත්වයක් යටතේ. එවන් මහජන හදිසි අවස්ථාවන් නිල වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු වන අතර, සිදුකරන බැහැරවීම් තාවකාලික, නිශ්චිත තර්ජනයකට මුහුණදීම සඳහා සප්‍රමාණික, සහ වෙනස්කොට නොසලකනසුළු විය යුතු වේ.

## සාධාරණ නඩුවිභාගයක් සඳහා වන අයිතිය

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුව, නීතියෙන් ස්ථාපිත කළ නිසි බලය සහිත, ස්වාධීන, අපක්ෂපාතී විනිශ්චය සභාවක් මගින් සිදු කෙරෙන සාධාරණ හා ප්‍රසිද්ධ නඩුවිභාග යක් සඳහා සෑම අයෙකුටම අයිතිවාසිකමක් ඇත.[54] අපරාධ චෝදනා එල්ල වී ඇති අවස්ථාවල, අදාළ පුද්ගලයාට එරෙහිව ඇති චෝදනා නොපමාව ද, සවිස්තරාත්මකව ද එම පුද්ගලයාට අවබෝධ කරගත හැකි භාෂාවකින් දැනුම්දෙනු ලැබීමටත්,[55] ප්‍රමාදයකින් තොරව නඩු විභාගයකට ලක්වීමටත්,[56] තමන්ට

---

[49] International Commission of Jurists, Declaration on Upholding Human Rights and the Rule of Law in Combatting Terrorism (28 August 2004) para 1ශ

[50] එම, 3 ඡේදය.

[51] එම, 6 ඡේදය.

[52] එම, 6 ඡේදය.

[53] International Commission of Jurists, Authority without accountability: The Crisis of Impunity in Sri Lanka (November 2012)

[54] ICCPR 14(1) වගන්තිය

[55] ICCPR 14(3)(a) වගන්තිය

[56] ICCPR 14(3)(c) වගන්තිය

ම එරෙහිව සාක්ෂි ලබාදීමට හෝ වරදකාරී යැයි පාපොච්චාරණය කිරීමට බල කරනු නොලැබීමටත්[57] එම පුද්ගලයාට අයිතියක් තිබේ. අපරාධ වරදක් සඳහා චෝදනා එල්ල වන සෑම අයෙකුම, නීතියට අනුව වරදකාරී බව ඔප්පු කරන තෙක් නිර්දෝෂී යැයි සැලකිය යුතු වේ.[58] වධහිංසා දීමෙන් ලබාගත් සාක්ෂි වලංගු නොවන බව වධහිංසාවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ද පැහැදිලිව දක්වා ඇත.[59]

## නීති නියෝජනය සඳහා ඇති අයිතිය

නීති ආධාර ලැබීම[60] සඳහා සහ තමන්ගේ විත්ති වාචකය සූදානම් කරගැනීමටත්, තමන් තෝරාගන්නා නීතිවේදියකු සමගින් සන්නිවේදනය කිරීමටත් ප්‍රමාණවත් කාලයක් සහ පහසුකම් ලැබීම සඳහා ඇති අයිතිය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් පිළිගෙන තිබේ.[61] විශේෂයෙන් ම, 'නිදහස අහිමිකිරීම ආරම්භයේ පටන් අපරාධ කාර්ය පටිපාටියේ සියලුම අදියරයන් අතරතුර, රඳවා තබා ගන්නා පුද්ගලයාට අවබෝධ කරගත හැකි භාෂාවක් කථාකරන නීතිවේදියකු වෙත පූර්ණ සහ බාධා රහිත ප්‍රවේශයක් සහතික කරදීමට' රජය විසින් කටයුතු කළ යුතු බව ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියා කරමින්, මානව හිමිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු (මෙහි මින් මතු 'ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු' යනුවෙන් හඳුන්වනු ලබන) විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ වාර්තාවක නිශ්චිත වශයෙන් නිර්දේශ කර තිබේ.[62]

අපරාධ යුක්ති පද්ධතීන් තුළ නීති ආධාර කරා ප්‍රවේශවීම සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ මූලධර්ම හා මාර්ගෝපදේශවලට අනුව, අපරාධ යුක්ති ක්‍රියාවලිය තුළ අපරාධ වරද සම්බන්ධයෙන් රඳවා ගත්, අත් අඩංගුවට හෝ සිරභාරයට ගත්, සැකකරන හෝ චෝදනා ලැබූ පුද්ගලයින් සඳහා සහ වින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා, වත්කමක් නොමැතිකම හේතුවෙන් හෝ යුක්තිය වෙනුවෙන් එසේ කිරීම අවශ්‍යවන කල්හි නොමිලයේ නීති උපදෙස්, ආධාර සහ නියෝජනය ලබාදීම නීති ආධාර යන්නට ඇතුළත් වේ. වයස, ජනවර්ගය, ශරීර වර්ණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, භාෂාව, ආගම හෝ විශ්වාස, දේශපාලන හෝ වෙනත් මතවාද, ජාතික හෝ සමාජ සම්භවය, හෝ දේපළ, පුරවැසිභාවය හෝ නිත්‍ය වාසය, උපත, අධ්‍යාපනය හෝ සමාජ තරාතිරම හෝ වෙනත් තරාතිරමක් නොසලකා අපරාධ යුක්ති ක්‍රියාවලියේ සෑම අදියරකදී ම නොපමාව නීති ආධාර ලැබීමට අපරාධ වරදක් සම්බන්ධයෙන් රඳවා තැබූ, අත් අඩංගුවට ගත්, සැක කරන හෝ චෝදනා එල්ල වී ඇති ඕනෑම අයෙකුට හිමිකම් තිබේ.[63] එලෙදයී නීති ආධාර යන්නට, අනෙකුත් සෙසු කරුණු අතර, රඳවා තබා සිටින පුද්ගලයින්ට බාධාවකින් තොරව නීති ආධාර වෙත ප්‍රවේශය, සන්නිවේදනවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම, නඩු ගොනු සඳහා ප්‍රවේශය සහ තමන්ගේ විත්ති වාචකය සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් කාලය හා පහසුකම් යන කරුණු ඇතුළත් වේ.[64] එසේ නීති ආධාර ලබාදීම රජයේ අනිසි මැදිහත්වීම්වලින් තොර විය යුතු ය.[65]

අන්ත දුගීභාවය සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකාරිනිය අන්ත දුගීභාවය හා මානව හිමිකම් සම්බන්ධයෙන් වූ ඇගේ 2012 වාර්තාවේ අපරාධ සම්බන්ධ කරුණුවලදී නීති ආධාර සේවාවන් කරා ප්‍රවේශය ලබා දීමෙහි වැදගත්කම පිළිබඳව සඳහන් කරමින්, අපරාධ නඩු කාර්යපටිපාටි සඳහා නීති ආධාර ලබා ගැනීමේ අයිතිය ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙන් ප්‍රකාශිතව ම ස්ථාපිත කර

---

[57] ICCPR 14(3)(g) වගන්තිය

[58] ICCPR 14(2) වගන්තිය

[59] UNCAT 15 වගන්තිය

[60] ICCPR 14(3)(d) වගන්තිය

[61] ICCPR 14(3)(b) වගන්තිය

[62] Report of the Special Rapporteur on the promotion and protection of human rights and fundamental freedoms while countering terrorism visit to Sri Lanka (A/HRC/40/52/Add.3) 14 December 2018.

[63] United Nations Principles and Guidelines on Access to Legal Aid in Criminal Justice Systems (June 2013), United Nations, Principle 6 para 26; Principle 3 para 20 and Principle 7 para 27.

[64] එම, 7 මූලධර්මය, 28 ඡේදය.

[65] එම, 2 මූලධර්මය.

ඇති බවත්, එය 'ඇප කාර්ය පටිපාටි, නඩු විභාගයට පූර්වයෙන් රඳවා තැබීම, නඩු විභාග හා තීන්දු දීම, සහ අභියාචනා යනාදී ක්‍රියාවලීන් සමගින් ගනුදෙනු කිරීමේදී විවිධාකාර බාධක රැසකට මුහුණ දෙන්නා වූ, දරිද්‍රතාවයේ ජීවත්වන තැනැත්තන්ට එය විශේෂයෙන් ම වැදගත් වන බවත්' පෙන්වා දී ඇත. (එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, අන්ත දුගීභාවය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වන විශේෂ වාර්තාකාරිනියගේ වාර්තාව, 2012 අගෝස්තු 9 (A/67/278))

### රඳවා තැබීම සම්බන්ධයෙන් සම්මත තත්වය

සිරකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් වන සම්මත අවම රීති (මැන්ඩෙලා රීති) මෙහිදී ද අදාළ වේ.

### වන්දි සඳහා අයිතිය

තමන්ගේ නිදහස අහිමිවීමකට ලක් වූ ඕනෑම තැනැත්තකුට ඒ සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියට නඩුකටයුත්තක් ගෙන ඒම සම්බන්ධයෙන් වන ප්‍රතිකර්ම සහ කාර්යපටිපාටි හා අදාළ වන එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම හා මාර්ගෝපදේශයන්හි 16 වැනි මාර්ගෝපදේශයේ සඳහන් වන අන්දමට, යම් රඳවා තැබීමක් අත්තනෝමතික හෝ නීතිවිරෝධී බවට තහවුරු වූ කල්හි වන්දි ලබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටි පිළිබඳව එම පුද්ගලයාට දැනුම් දිය යුතු වේ. භෞතික හානි සඳහා, භෞතික හානිවල ප්‍රතිවිපාක දුරුකරගැනීම සඳහා, සහ අහිමි කරනු ලැබූ හෝ උල්ලංඝනය කරනු ලැබූ සියලුම අයිතිවාසිකම් පුනස්ථාපනය සඳහා පූර්ණ වන්දියක් ලබා ගැනීමට එම පුද්ගලයාට අයිතිය තිබේ. රැඳවියා මිය ගොස් ඇත්නම්, ස්ථාපිත කාර්ය පටිපාටීන්ට අනුකූලව වන්දි ලැබීමේ අයිතිය රැඳවියාගේ උරුමකරුවන්ට පැවරේ. අපරාධ චෝදනා එල්ල කරනු ලැබ, පසුව එම චෝදනා ඉවත්කර ගනු ලැබූ විට එම පුද්ගලයින්ට ද වන්දි ලබා ගත හැකිය. අත්තනෝමතික හෝ නීති විරෝධී රඳවා තැබීමක වින්දිතයකු වූ තැනැත්තකුට අත් විඳින්නට වූ භෞතික හානි සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ගෙවනු ලබන වන්දි අතරට අපරාධ නඩු පැවරීම හේතුවෙන් අහිමි වී ගිය ඉපැයීම්, විශ්‍රාම වැටුප්, සමාජ ප්‍රතිලාභ හා අනෙකුත් මුදල් ද, වින්දිතයින්ගේ නීති වියදම් ද ඇතුළත් විය හැකිය.

## 3.2 දේශීය නීති රාමුව

අත් අඩංගුවට ගැනීම හා රඳවා තැබීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති සහතිකවීම්

පුද්ගලයින් අසාධාරණ සැලකීම් වලින් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව මගින් අත් අඩංගුවට ගැනීම සහ රඳවා තැබීම සම්බන්ධ අයිතිවාසිකම් මාලාවක් නියම කර තිබේ:

- නීතියෙන් ස්ථාපිත කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිදු පුද්ගලයකු අත් අඩංගුවට නොගත යුතු බවත්, අත් අඩංගුවට ගනු ලබන ඕනෑම පුද්ගලයෙකුට තමන්ව අත් අඩංගුවට ගනු ලැබීමට හේතුව දැනුම් දිය යුතු බවත් 13(1) වැනි ව්‍යවස්ථාවෙහි දැක්වේ.
- සිරභාරයේ තැබීමෙන්, රඳවා තබා ගැනීමෙන්, එසේත් නැත හොත් වෙන යම් ආකාරයකින් පුද්ගලික නිදහස අහිමි කරවනු ලැබූ සෑම පුද්ගලයකු ම ඒ ආසන්නයේ ම ඇති නිසි බලය සහිත අධිකණයේ විනිසුරුවෙකු ඉදිරියට පැමිණවිය යුතු බවට 13(2) වැනි ව්‍යවස්ථාවෙහි දැක්වේ. එම තැනැත්තාගේ පෞද්ගලික නිදහස තවදුරටත් සීමා කළ හැක්කේ නීතියෙන් ස්ථාපිත කාර්යපටිපාටීන්ට අනුකූලව විනිසුරුවරයා විසින් නිකුත් කරන නියෝගයක් මත පමණක් වේ.
- වරදක් සඳහා චෝදනා ලැබූ තැනැත්තෙකුට නිසි බලය සහිත අධිකරණයක පවත්වන සාධාරණ නඩු විභාගයක දී තමන් විසින් ම ප්‍රකාශකරන දෑ සඳහා සවන් දෙනු ලැබීමට, නැත හොත් නීතිවේදියකු විසින් නියෝජනය කරනු ලැබීමට ඇති අයිතිය ද ඇතුළු සාධාරණ නඩු විභාග යක් සඳහා ඇති අයිතිය 13(3) වැනි ව්‍යවස්ථාවෙන් සහතික කර ඇත.

- නිසි බලය සහිත අධිකරණයකින් ලබා දෙනු ලබන නියෝගයක් මත මිස කිසිදු පුද්ගලයෙකු මරණීය දණ්ඩනයට හෝ බන්ධනාගාරගත කිරීමට යටත් කළ නොහැකි බව 13(4) වැනි ව්‍යවස්ථාවෙහි සඳහන් වේ.
- වරදකාරි බව ඔප්පු කරන තෙක් සෑම පුද්ගලයකුම නිර්දෝෂී යැයි පූර්වානුමාන කළ යුතු බව 13(5) වැනි ව්‍යවස්ථාවෙහි දැක්වේ.

අයිතිවාසිකම් සීමා කළ හැකි අවස්ථා ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හඳුනා ගැනීමට ලක් කර තිබේ. 'රාජ්‍ය ආරක්ෂාව තහවුරු කරනු පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි' සීමාකිරීම් වලට පමණක් යටත්ව නිර්දෝෂී භාවයෙහි පූර්වනිගමනය (13(5) වැනි ව්‍යවස්ථාව) සඳහා සහ අතීතයට බලපාන අන්දමින් යම් වරදක් සඳහා වරදකරු නොකරනු ලැබීමේ අයිතිය (13(6) වැනි ව්‍යවස්ථාව) සඳහා 15(1) වැනි ව්‍යවස්ථාවෙන් අවසර ලබා දී ඇත.

'රාජ්‍ය ආරක්ෂාව ද, රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරනු ලබන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්තිසහගතව අවශ්‍ය දෑ සපුරාලීම සඳහාත්' 13(1) වැනි ව්‍යවස්ථාව (එනම්, නීතියට අනුකූලව අත් අඩංගුවට ගැනීම හා අත් අඩංගුවට ගැනීමට හේතු දැනුම්දීම) සහ 13(2) වැනි ව්‍යවස්ථාව (එනම්, අධිකරණයක් ඉදිරියට පැමිණවීම සහ අධිකරණ නියෝග මත පමණක් රඳවා තැබීම) යටතේ හිමි වන අයිතිවාසිකම් සීමා කිරීමට 15(7) වැනි ව්‍යවස්ථාව මගින් අවසර ලබා දෙයි.

## ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන සමග සංසන්දනාත්මකව**

| | |
|---|---|
| අත් අඩංගුවට ගැනීම සඳහා හේතු දැනුම්දීම | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| චෝදනා පිළිබඳ නොපමාව දැනුම්දීම (අපරාධ නීතියෙන් නිර්වචනය වී තිබිය යුතුය) | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| අධිකරණය ඉදිරියට නොපමාව පැමිණවීම | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| අධිකරණ සමාලෝචනයකට සහ රඳවා තැබීම නීතිවිරෝධී නම් නිදහස් කිරීමට නියෝගයක් ලබාගැනීමට අයිතිය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| නීතිවිරෝධී රඳවා තැබීම් සම්බන්ධයෙන් වන්දි ලබාගැනීමට බලාත්මක කළහැකි අයිතිය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| සාධාරණ නඩුවිභාගයක් සඳහා අයිතිය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| නීති නියෝජනය සඳහා අයිතිය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |
| සිරකරුවන්ට සැලකීම (මැන්ඩෙලා රීති) | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන නැත |

### අත් අඩංගුවට ගැනීම

නීතියෙන් නිශ්චිත කොට දක්වා නොමැති 'නීතිවිරෝධී ක්‍රියාකාරකම්' සම්බන්ධයෙන් වරෙන්තු නොමැතිව අත් අඩංගුවට ගැනීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අවසර ලබා දෙයි.[66] එම පනතේ 6(1) වගන්තියට අනුව, 'වෙනත් ඕනෑම නීතියක එයට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද' වරෙන්තු රහිතව පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට පොලිස් අධිකාරී තනතුරට පහළින් නොවන ඕනෑම තනතුරක පොලිස් නිලධාරියෙකුට හෝ ඒ සම්බන්ධයෙන් ලිඛිතව බලය පැවරූ උප පොලිස් පරීක්ෂක තනතුරට පහළින් නොවන ඕනෑම තනතුරක පොලිස් නිලධාරියකුට වරෙන්තුවක් නොමැතිව පුද්ගලයකු අත් අඩංගුවට ගැනීමේ හැකියාව තිබේ. මෙම වගන්තිය යටතේ අත් අඩංගුවට ගැනෙන පුද්ගලයකු පැය හැත්තෑ දෙකක් දක්වා සිරභාරයේ තබාගත හැකි අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් නියෝග කළහොත්,

66 Human Rights Watch, Locked Up Without Evidence: Abuses under Sri Lanka's Prevention of Terrorism Act (29 January 2018), at page 13. (Referred to as "HRW, Locked Up Without Evidence")

නඩු විභාගය අවසාන වන තෙක් එම පුද්ගලයාව තවදුරටත් රඳවා තැබිය හැකිය.[67] කෙසේ නමුත්, ඒ අන්දමින් දීර්ඝ කාලයක් සඳහා රඳවා තැබිය හැක්කේ 6(1) වැනි වගන්තිය යටතේ 'වලංගු හා නිසි අත් අඩංගුවට ගැනීමක්' සිදුකර ඇත්නම් පමණි. 6(1) වැනි වගන්තිය යටතේ අත් අඩංගුවට ගැනීමක් සිදුකරන ලද්දේ යැයි 'ව්‍යාජ ලෙස ප්‍රකාශ කිරීමෙන් හෝ ව්‍යාජ ලෙස ඇඟවීමෙන්' පමණක් අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් සඳහා අදාළ වන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති ආරක්ෂණයන් මගහැර යාමට නොහැකි ය.[68] ඒ වෙනුවට, එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) වැනි ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි අදාළ තැනැත්තාව විනිසුරුවරයෙකු ඉදිරියට පමුණුවා විනිසුරුවරයාගේ නියෝගය මත පමණක් තවදුරටත් රඳවා තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ.

*මහර බන්ධනාගාර පාලක සහ තවත් අයට එරෙහි දිසානායක*[69] නඩුවේ දී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පහත කරුණු පිළිගන්නා ලදී:[70]

- අත් අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ සාමාන්‍ය නීතිය යටතේ ද, හදිසි අවස්ථා රෙගුලාසි යටතේ ද, නැතහොත් ත්‍රස්තවාදය වැළැක්වීම යටතේ ද යන්න නොසලකා එම අත් අඩංගුවට ගැනීමේ වලංගුතාවය තීරණය කරන්නේ එය වාස්තවික පරීක්ෂාවට භාජනය කිරීමෙනි.
- සාධාරණ නිලධාරියෙකුට අත් අඩංගුවට ගැනීමක් සිදුකිරීමට හේතු වන තරම් කරුණු තිබුණේ ද යන්න අධිකරණය විසින් සලකා බැලිය යුතු අතර, දිවුරුම් ප්‍රකාශ හරහා ඉදිරිපත් කරන තනි ප්‍රකාශයන් මත පමණක් පදනම් නොවී, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, නිරීක්ෂණ යනාදිය ඇතුළුව විමර්ශන සටහන් වැනි, තීරණයක් ගැනීම සඳහා අධිකරණයට හැකියාව ලබා දෙන්නා වූ ප්‍රමාණවත් කරුණු අඩංගුවට ගත් බලධරයා විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.
- වරද සිදුකළේ ය යැයි ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර "වරද සිදුකළ බවට සාධාරණ සැකයක් හෝ සාධාරණ පැමිණිල්ලක්" තිබීම ප්‍රමාණවත් වේ.
- හදිසි අවස්ථා කාලසීමාවක් තුළ අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් පොලිසියට වඩාත් පුළුල් අභිමතයක් පැවරෙන නමුත්, අධිකරණය විසින් ස්වකීය විනිශ්චය විධායකයට පවරා දීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වැනි ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති අත්තනෝමතිකව අත් අඩංගුවට ගනු ලැබීමෙන් නිදහස්ව *වීරවංශ එදිරිව නීතිපති* [2000] 1 SLR 387, 400. නිදහසේ සිටීමේ මූලික අයිතිය උවදුරේ හෙළනු ඇති බැවින් *"ස්වකීය විනිශ්චය විධායකයට පවරා නොදෙනු ලබන"* බව අධිකරණය පිළිගන්නා ලදී.

හමුදාපතිට එරෙහි විනායගමූර්ති නඩුවේදී අත් අඩංගුවට පත්වන තැනැත්තාට, එම තැනැත්තා අත් අඩංගුවට ගැනීමට හා රඳවාගැනීමට හේතු වූ වැදගත් කරුණු සහ විස්තර ඇතුළුව තමන් අත් අඩංගුවට ගනු ලබන්නේ කුමන හේතු මත ද යන්න දැනුම්දිය යුතු බව, සහ අත් අඩංගුවට ගන්නා නිලධාරියාගේ සැකය බිඳහෙළීම සඳහා හෝ අනන්‍යතාවය හඳුනාගැනීමේදී දෝෂයක් සිදු වී ඇති බව පෙන්වා දීමට එම පුද්ගලයාට හැකියාව ලබා දීම පිණිස එසේ කිරීම අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලදී.[71]

## රඳවා තැබීම

9 වැනි වගන්තිය යටතේ රැඳවුම් නියෝගයක් ලබා දී ඇත්තේ නම් මිස, පුද්ගලයකු අත් අඩංගුවට ගෙන පැය හැත්තෑ දෙකක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවිය යුතු බව 6(1) වගන්තියෙහි දැක්වේ. පුද්ගලයාව නිදහස් කිරීමට නීතිපතිවරයා එකඟවී ඇත්තේ නම් මිස, නඩු විභාගය අවසාන වන

---

[67] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 7(1) වගන්තිය.

[68] *වීරවංශ එදිරිව නීතිපති* [2000] 1 SLR 387, 400.

[69] *දිසානායක එදිරිව මහර බන්ධනාගාර පාලක සහ තවත් අය* [1991] 2 SLR 247, 256. කුලතුංග විනිසුරුතුමාගේ තීන්දුව

[70] *වීරවංශ එදිරිව නීතිපති* [2000] 1 SLR 387, 400.

[71] *විනායගමූර්ති එදිරිව හමුදාපති* [1997] 1 SLR 113, අමරසිංහ විනිසුරුතුමා ප්‍රකාරව

තෙක් අදාළ පුද්ගලයා රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කළ යුතු බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි දැක්වේ.[72] නඩු විභාගය අවසාන වීමට පෙර, එම පුද්ගලයා නිදහස් කිරීමට නීතිපතිවරයා එකඟ වී ඇත්නම්, මහේස්ත්‍රාත්වරයා එම තැනැත්තාව සිරභාරයෙන් නිදහස් කළ යුතු වේ.[73] ත්‍රස්තවාදය මර්ධනය කිරීම පිළිබඳව විශේෂ වාර්තාකරුගේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවේ නිරීක්ෂණය කර ඇති අන්දමට නඩු විභාගය අවසාන වන තෙක් සැකකරු රිමාන්ඩ් බන්ධනගාරගත කරන මෙන් මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරන අවස්ථාවල මෙය දින නියමයක් නොමැතිව රඳවා තැබීමට ඉඩ සලසයි.[74]

9(1) වගන්තිය යටතේ, යම් පුද්ගලයකු යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සඳහා සම්බන්ධ බවක් විශ්වාස කිරීමට හෝ සැක කිරීමට අමාත්‍යවරයාට හේතු තිබෙන්නේ නම්, එම පුද්ගලයාව රඳවා තබන මෙන් අදාළ අමාත්‍යවරයා විසින් නියෝග කරනු ලැබිය හැක. යම් ස්ථානයක එම පුද්ගලයා මාස තුනකට නොවැඩි කාලයක් රඳවා තැබීම සඳහා නියෝග දීමටත් ඒ සඳහා වන කොන්දේසි තීරණය කිරීමටත් අමාත්‍යවරයාට හැකිය. වරකට මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා වරින් වර එම නියෝගය දීර්ඝ කිරීමට අමාත්‍යවරයාට හැකි අතර ඒ අන්දමින් රඳවා තබා ගන්නා සම්පූර්ණ කාලසීමාව මාස 18 නොඉක්මවිය යුතු ය.[75] මෙයින් සිදුවන්නේ මාස 18 ක් ගතවන තුරු සැකකරුවෙකු විනිසුරුකු ඉදිරියට නොපමුණුවමින් රැඳවුම් භාරයේ තබාගත හැකි වීමයි.[76] එවැනි රැඳවුම් නියෝග අවසාන නියෝග වශයෙන් සලකනු ලබන අතර කිසිදු අධිකරණයක හෝ විනිශ්චය සභාවක එම නියෝග පිළිබඳව ප්‍රශ්න කළ නොහැකි ය.[77] ඒවා ඇත්තේ විමර්ශන කටයුතු සිදුකිරීමේ අරමුණ සඳහා නොව, යම් යම් නීතිවිරෝධී හැසිරීම් වැළැක්වීම සඳහා ය.[78]

අමාත්‍යවරයාට මෙම බලය අත්හැරීමට හෝ වෙනත් අයෙකුට එම බලය පැහැර ගැනීමට නොහැකිය.[79] නීතිපතිට එරෙහි වීරවංශ නඩුවේ දී මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා තීන්දු කළේ, අමාත්‍යවරිය 'පෞද්ගලික දැනුම හෝ විශ්වසනීය තොරතුරු මත තමන්ගේ ව්‍යවස්ථාපිත අභිමතය ස්වාධීනව ක්‍රියාත්මක කර' නොමැති හෙයින් සහ ඇය හුදෙක් දෙවන වග උත්තරකරුගේ මතය පිළිගැනීමක් පමණක් කර ඇති හෙයින් එය 'තම අභිමතය ප්‍රකටවම අත්හැරීමක්' වන බවයි.[80]

### පාපොච්චාරණය

පාපොච්චාරණය සිදුකරන ලද්දේ ස්වේච්ඡාවෙන් නොවන බවක් චූදිතයා විසින් ඔප්පු කළ හොත් මිස, සහකාර පොලිස් අධිකාරි හෝ ඊට ඉහළ තනතුරක පොලිස් නිලධාරියෙකු වෙත සිදු කරන පාපොච්චාරණයක් පිළිගත හැකි යැයි පූර්වානුමාන කිරීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් අවසර දෙනු ලැබේ.[81]

---

72 ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 7(1) වගන්තිය.

73 ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 7(1) වගන්තිය.

74 Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 1.

75 ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 9(1) වගන්තිය.

76 HRW, Locked Up Without Evidence 13.

77 ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 10 වගන්තිය සමගින් කියවනු ලබන 1972 අංක 18 දරන අර්ථනිරූපන (සංශෝධන) පනත, අත් අඩංගුවට ගැනීම හා රඳවා තැබීම සඳහා අවසරදීමට අමාත්‍යවරයා ගන්නා තීරණය අධිකරණ සමාලෝචනයට ලක් කළ නොහැකි බව නියම කරයි. Authority without Accountability: The Crisis of Impunity in Sri Lanka (International Commission of Jurists 2012) 33.

78 *චන්ද්‍රසිරි එදිරිව රණතුංග* SC Application 138/92 SC Minutes 3 February 1993.

79 *වන්න පීරිස් එදිරිව නීතිපති* [1994] 1 SLR 1.

80 *නීතිපතිට එරෙහි වීරවංශ නඩුව* [2000] 1 SLR 387.

81 PTA section 16; *Authority without Accountability:* The Crisis of Impunity in Sri Lanka (International Commission of Jurists 2012) 36.

සෑමවිටකම පාහේ වධහිංසා සිදුවන්නේ, එම වරද සිදුකරන්නන් හැර වෙනත් කිසිවකු නොසිටින, වැසූ දොරවල් පසුපස සිට වන බැවින් පාපොච්චාරණය සිදුකරන ලද්දේ ස්වේච්ඡාවෙන් නොවන බව ඔප්පු කිරීම මුළුමනින් ම පාහේ කළ නොහැක්කක් වන බව නිරීක්ෂණය කර තිබේ.[82] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී පීඩාකාරී පිළිවෙත් යොදා ගැනීම්, අධිකරණයේ අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම්, සහ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ අධීක්ෂණය මගහැර යාම් පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලේඛනගත කර තිබේ.[83] අදාළ පාපොච්චාරණ ලබා ගෙන ඇත්තේ වධහිංසා කිරීමෙන් බව යෝජනා කෙරෙන වෛද්‍යමය සාක්ෂි තිබියදී, ප්‍රශ්නකිරීම් සිදුකරන අවස්ථාවේ හෝ මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවන අවස්ථාවේ නීති නියෝජනයක් නොතිබිය දී, සහ ප්‍රශ්න කිරීම් අවස්ථාවේදී ස්වාධීන සහ නිසි බලය සහිත භාෂා පරිවර්තකයකු නොසිටිය දී පවා 16 වැනි වගන්තිය යටතේ ලබාගත් පාපොච්චාරණ පදනම් කරගෙන විනිසුරුවරුන් විසින් පුද්ගලයින්ව වරදකරුවන් කර ඇති බව ද සොයා ගෙන තිබේ.[84]

## නීති නියෝජනය සඳහා ප්‍රවේශය

අදාළ පුද්ගලයාට නීති නියෝජනයක් සඳහා වියදම් දැරීමට නොහැකි නම්, නීති නියෝජනය සහ නීති ආධාර සඳහා එම පුද්ගලයාට ඇති අයිතිවාසිකම සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සමුමුති (ICCPR) පනතෙහි (2007 අංක 56) 4(1) වැනි වගන්තියේ සඳහන් වේ. නඩුවිභාගය අතරතුර භාෂා පරිවර්තකයකුගේ සහය ලබා ගැනීම සඳහා ද එහි විධිවිධාන සලසයි (4(1)(ඈ) වගන්තිය). *"නිදහස අහිමි කරවනු ලැබ ඇති ඕනෑම පුද්ගලයෙකුට, ලිඛිත නීතියෙන් ස්ථාපිත කොන්දේසිවලට පමණක් යටත්ව, තමන්ගේ ඥාතීන්, නීතිවේදියා, හෝ තමන් අභිමත වෙනත් පුද්ගලයින් සමග සන්නිවේදනය කිරීම සඳහා සහ ඔවුන් තමාව බැලීමට එනු ලැබීම සඳහා අයිතියක් තිබෙන බව"* 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදන් කරවනු ලැබීමෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුති පනතෙහි දක්වා තිබේ.

මහාධිකරණයේ දී විත්තිකරු විසින් ඉල්ලා සිටි කල විනිසුරුවරයා විසින් විත්තිකරු වෙනුවෙන් නීතිවේදියකු පත් කළ යුතු බව අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 19(උ) වැනි වගන්තියේ දැක්වෙන අතර, අභියාචනාකරුට නීති ආධාර ලබා දීම යුක්තිය උදෙසා අවශ්‍ය කරන බව අධිකරණයේ මතය වන්නේ නම්, අභියාචනාධිකරණයේ දී අභියාචනාකරු වෙනුවෙන් පෙනීසිටීම සඳහා නීතිවේදියකු පැවරීමට විනිසුරුවරයාට හැකි බව එහි 353 වැනි වගන්තියේ දැක්වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඒ අයුරින් නීති නියෝජනයක් සහතික කිරීමට හෝ නීති ආධාර ලබාදීමට හෝ නීති නියෝජනයක් ලබා ගැනීම සඳහා ඇති අයිතිය පිළිබඳව සැකකරුට දැනුම්දීම සම්බන්ධයෙන් පවා ප්‍රකාශිත නීති විධිවිධානයක් හෝ ව්‍යවහාරයක් නොමැති බව මෙහිදී සැලකිල්ලට ගත යුතු වේ.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම හා රඳවා තැබීම සම්බන්ධයෙන් 2016 වර්ෂයේ නිකුත් කළ නියෝග

2016 අප්‍රේල් මාසයේ සිදුකළ අත් අඩංගුවට ගැනීම් මාලාවකින් පසුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2016 මැයි මාසයේ දී 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම සහ රඳවා තැබීම සම්බන්ධයෙන් වන නියෝග' නිකුත් කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදුකරන අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම් තුළ මූලික ප්‍රමිතීන් සපුරා නොමැති බව පිළිගනිමින් මෙම විධාන නිකුත් කර ඇති බව නිසැක ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සියුම් ලෙස නිර්වචනය කළ යුතු බවත්,

---

[82] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 20.

[83] See HRCSL Prison Study Report 2020, පිටු 517 සිට 521 සහ 530-532 බලන්න.

[84] *Authority without Accountability:* The Crisis of Impunity in Sri Lanka (International Commission of Jurists 2012) 36.

එය නිශ්චිත වාතාවරණ යටතේ සලකා බැලිය යුතු බවත්, සාමාන්‍ය වරද සම්බන්ධයෙන් පුද්ගලයින් අත් අඩංගුවට ගැනීමට යොදා නොගත යුතු බවත් කොමිෂන් සභාව තදින් ප්‍රකාශ කර තිබේ. ප්‍රශ්න කරන අවස්ථාවලදී නීතිවේදියකු හමුවීමේ අයිතිය, අත් අඩංගුවට ගෙන පැය 48 ක් තුළ අධිකරණ වෛද්‍ය නිලධාරියා ඉදිරියට පමුණුවනු ලැබීමේ අයිතිය, පවුලේ සාමාජිකයින්ට දැනුම් දීමේ අයිතිය, සියලුම රැඳවුම් ස්ථාන පැහැදිලි ලෙස ගැසට් කර අවසරලත් ස්ථාන විය යුතු බව, වෛද්‍ය හා නීති ආධාර සම්බන්ධයෙන් සහතිකවීම්, අත් අඩංගුවට ගැනීම ලියාපදිංචි කිරීමේ අයිතිය, රැඳවියා තෝරගන්නා භාෂාවක් භාවිතා කිරීම සඳහා වන අයිතිය, වධහිංසා හා අනෙකුත් අනිසි සැලකීම්වලින් ආරක්ෂාවීමේ අයිතිය, සහ කාන්තාවන් හා ළමුන් සඳහා විශේෂ ආරක්ෂාව මෙම විධාන මගින් තහවුරු කරන ලදී.[85] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන සියලුම අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් නොපමාව දැනුම්දෙනු ලැබීමට, එම පනත යටතේ අත් අඩංගුවට ගත් හෝ රඳවා තැබූ ඕනෑම පුද්ගලයෙකු කරා ප්‍රවේශ වීමට සහ ඕනෑම අවස්ථාවක ඕනෑම රැඳවුම් ස්ථානයක් කරා ප්‍රවේශවී[86]මට කොමිෂන් සභාවට ඇති බලවරම මෙම විධාන තුළ නැවතත් අවධාරණය කරන ලදී.

2016 ජුනි මාසයේ දී නිකුත් කළ ජනාධිපති නියෝගවලට මෙම නියෝග ද ඇතුළත් කරන ලදී. ජුනි 27 වැනි දින ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 32 වැනි සැසිය වෙත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන විස්තර සටහන ඉදිරිපත් කිරීමට පූර්වාසන්නයේ මෙම ජනාධිපති නියෝගය නිකුත් කළ බව සැලකිල්ලට ගත යුතු වේ.[87] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් සිදු කරන ලද විමර්ශනයකට ප්‍රතිචාර වශයෙන් යැයි අනුමාන කළ හැකි කාරණයක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා එවැනි ජනාධිපති නියෝගයක් ලැබී නොමැති බවත් ඔහු එවැන්නක් පිළිබඳව දැන සිටියේ නැති බවත් දැනුම්දුන් බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වාර්තා කර තිබේ.[88]

අතීතයේ ද මීට සමාන නියෝග නිකුත් කර ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. 1995 දී, එකල ජනපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක විසින් නියෝග නිකුත් කරන ලදී. 2006 ජූලි 7 වැනි දින, එවකට ජනපති මහින්ද රාජපක්ෂ විසින් සන්නද්ධ හමුදාවල ප්‍රධානීන් වෙත නිකුත් කළ අත් අඩංගුවට ගත් සහ/හෝ රඳවා තබන ලද පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ ජනාධිපති නියෝගය 2007 අප්‍රේල් මාසයේ දී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් යුධ හමුදාපති, නාවික හමුදාපති හා ගුවන් හමුදාපති වෙත මෙන්ම පොලිස්පතිවරයා වෙත ද නැවතත් බෙදාහරින ලදී හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් මෙම නියෝග සම්බන්ධයෙන් අදහස් පළකරමින් සඳහන් කර ඇත්තේ "මෙම නියෝග ප්‍රධාන වශයෙන් ම කඩදාසි මත සඳහන් කළ ප්‍රකාශයන් වශයෙන් පවතින අතර ඒවාට නීතිමය බලයක් නොමැත. ඒවාට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දඬුවම් නොමැත. හියුමන් රයිට්ස් වොච් සහ තවත් සංවිධාන සිදු කළ පර්යේෂණ වලින් සොයා ගෙන ඇත්තේ ආරක්ෂක බලකා නිතර ම මෙම උපදෙස් නොසලකා හරිමින් සිටින බවත්, එසේ කිරීම වෙනුවෙන් ඔවුන් කිසිදු ප්‍රතිවිපාකයකට මුහුණ නොදෙන බවත් ය". එසේම,[89] "කසේ නමුත් මෙම නියෝග වලට ස්වාධීන නීතිමය බලයක් නොමැති අතර ඒවාට අනුකූලතාවය නොදැක්වීම සඳහා දඬුවම් නොලැබේ. මෙම ප්‍රකාශිත කාර්යපටිපාටිය අනුගමනය නොකර සිදු කළ අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම් පිළිබඳ බොහෝ වාර්තා තිබේ" යනුවෙන් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම සඳහන් කර තිබේ.[90]

---

[85] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 41.

[86] HRW, Locked up without evidence at page. 14

[87] HRC, 'Human Rights Commission welcomes President's directives for arrest under PTA' 23 June 2016 <https://www.hrcsl.lk/human-rights-commission-welcomes-presidents-directives-for-arrests-under-pta/> accessed 24 November 2020.

[88] HRC, 'Human Rights Commission welcomes President's directives for arrest under PTA', 23 June 2016.

[89] HRW Report: 'Return to War', 2007, pp 39-40.

[90] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 23.

## මානව හිමිකම් කොමිෂන් සභාවේ අධීක්ෂණ භූමිකාව

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11(ඈ) වගන්තියට අනුව අත් අඩංගුවේ පසුවන තැනැත්තන්ගේ තත්වය අඛණ්ඩව අධීක්ෂණය සඳහා කොමිෂන් සභාවට බලය තිබේ.

2018 දී, ත්‍රස්තවාදය මර්ධනය කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු ප්‍රකාශ කළේ සියළුම රැඳවුම් ස්ථාන වෙත ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට බාධා රහිත ප්‍රවේශයක් තිබෙන බවත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීමක් හෝ මාරුකර යැවීමක් සිදුවී පැය 48 ක් ඇතුළත ඒ බව කොමිසම දැනුවත් කරනු ලබන බවත් දැනගැනීමෙන් තමන් දිරිගැන්වුනු බවකී එහෙත්, ලැබෙන විශාල පැමිණිලි සංඛ්‍යාව හේතුවෙන් සහ විවිධ පරිපාලන හා කාර්ය සම්පාදන ගැටළු හේතුවෙන් එම පැමිණිලි සඳහා සුදුසු කාලසීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට සෑමවිටකම කොමිෂන් සභාවට දුෂ්කරවීම පිළිබඳ කණගාටුවන බව ද ඔහු සඳහන් කළේයී තවද, තමන් රැඳවුම් භාරයේ සිටි දීර්ඝ කාලය තුළ ජාත්‍යන්තර රතුකුරුස කමිටුවෙන් කෙදිනක හෝ තමන්ව බැලීමට නොපැමිණි බව පෙර රඳවා සිටි හා වර්තමානයේ රඳවා සිටින පුද්ගලයින් කිහිපදෙනෙකු ම ඔහුට දැනුම් දී තිබීම පිළිබඳව ද ඔහු කණගාටුවට පත් විය.[91]

පාස්කු ප්‍රහාරවලින් පසුව හදිසි අවස්ථාව ප්‍රකාශයට පත්කිරීමෙන් පසු, එම ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් හෝ නිකුත් කළ හදිසි අවස්ථා රෙගුලාසි සම්බන්ධයෙන් සඳහන් කරමින් මානව හිමිකම් ආරක්ෂා කිරීමට කටයුතු කරන මෙන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට හෝ ඉල්ලා සිටීමට හෝ මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කළේ නැත.

2020 නොවැම්බර් මාසයේ දී, වැඩබලන පොලිස්පති වෙත ලිපියක් යොමුකරමින් මානව හිමිකම් කොමිෂන් සභාව පොලීසිය වෙත සිදු කරනු ලබන ප්‍රකාශවල වලංගුතාවට සහතික කිරීම සඳහා පියවර ගන්නා මෙන් ඉල්ලා සිට තිබේ. තමන්ව ම වරදකරු කරවන අන්දමේ ප්‍රකාශවලට අත්සන් තබන මෙන් රැඳවූවන්ට බල කරන බවට රැඳවූවන් විසින් කළ පැමිණිලි පිළිබඳව සහ පොලිස් මූලස්ථානයට නිතර නිතරම කැඳවා ගෙන යමින්, සිංහල බසින් කලින් සූදනම් කළ ප්‍රකාශ රැඳවියන්ට ලබාදීම ද, එම ප්‍රකාශය වලට අත්සන් තැබුව හොත් නිදහස් කරන බවට වන දිරිගැන්වීම් පිළිබඳව ද, අත්සන් නොකළ හොත් ව්‍යාජ චෝදනා එල්ල කරන්නේ යැයි තර්ජනය කිරීම් සම්බන්ධයෙන් ද එම ලිපියේ සඳහන් වේ.[92]

---

91 HRW Report: 'Return to War', 2007, pp 39-40.

92 HRC 'HRCSL writes to IGP on Detentions under the Prevention of Terrorism Act' (HRCSL, 24 November 2020) <https://www.hrcsl.lk/hrcsl-writes-to-igp-on-detentions-under-the-prevention-of-terrorism-act/> accessed 25 November 2020.

## 4. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක වූ වසර 40 තුළ උගත් පාඩම් කිහිපයක්

ගත වූ දශක හතරක කාලය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් හා රඳවා තැබූ පුද්ගලයින් අත්විඳි යථාර්ථය සම්බන්ධයෙන් පවතින ලිපිලේඛන වල අඩංගු කරුණු මෙම කොටසින් සාරාංශගත කර තිබේ.

### (අ) අත් අඩංගුවට ගත් ආකාරය

අත් අඩංගුවට ගැනීමේදී ඒ සඳහා වන නිසි ක්‍රියාදාමය අනුගමනය කිරීමට අපොහොසත් වීම ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පොදු කරුණක් වී තිබේ. නිසි ක්‍රියාවලිය අනුගමනය නොකිරීමක් අත්විඳින්නට වූ බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබූවන් විසින් බහුලව වාර්තා කර තිබූ බව ශ්‍රී ලංකා මානව හිමිකක්ම් කොමිෂන් සභාව සඳහන් කර තිබේ.[93] එහිදී වාර්තාකර තිබූ අනිසි ව්‍යවහාර අතරට අත් අඩංගුවට ගැනීම සිදුකරන නිලධාරීන් සිවිල් ඇඳුමින් සිටීම හා තමන් කවුදැයි හඳුන්වා දීමෙන් වැළකීම, අත් අඩංගුවට ගැනීමේ වරෙන්තු ඉදිරිපත් නොකිරීම, අත් අඩංගුවට ගැනීමට හේතු නොදැක්වීම, ප්‍රශ්න කිරීමට කැඳවාගෙන යන මුවාවෙන් අත් අඩංගුවට ගැනීම, අත් අඩංගුවට පත්වන තැනැත්තන්ගේ දෑස් බැඳීම, රැඳවුම් ස්ථානය සම්බන්ධයෙන් තොරතුරු පවුලේ අයට නොපැවසීම, පවුල් වෙත ප්‍රවේශය ලබා නොදීම, බලහත්කාරයෙන් අත්සන ලබා ගැනීම, වධ හිංසාව සහ එක් රැඳවුම් ස්ථානයක සිට තවත් ස්ථානයකට මාරුකළ විට පවුල් වලට ඒබව දැනුම් නොදීම ඇතුළත් වේ.

### (ආ) නීති නියෝජනය සඳහා ප්‍රවේශය

නීතිවේදීන් වෙත ප්‍රවේශ වීමට ඇති ගැටළු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන්ට සහ රිමාන්ඩ් භාරයේ පසුවන්නන්ට සැලකිය යුතු ගැටළුවක් වී තිබේ. මුලින්ම, අත් අඩංගුවට ගත් වහාම එම තැනැත්තා රඳවා සිටින්නේ කුමන ස්ථානයක දැයි පවුලේ අයට නොදැන්වීම හේතුවෙන් නීතිවේදීන්ට හෝ පවුලේ අයට රැඳවියා බලන්නට පැමිණ රැඳවියාගේ ආරක්ෂාව පිළිබඳ සහතික කර ගැනීමට නොහැකි වී තිබේ. ඉන්පසුව, රැඳවුම් ස්ථානය මාරුකිරීම හේතුවෙන් තමන්ට නුපුරුදු ප්‍රදේශවලදී නීතිවේදීන් සොයාගෙන ඔවුන්ගේ නියෝජනය ලබා දීමේ අභියෝගයට ඥාතීන්ට මුහුණ දෙන්නට සිදු වේ. බොහෝවිට ඔවුන්ට නීති උපදෙස් හෝ නියෝජනය ලබාගැනීම සඳහා මුදල් නොමැති අතර එසේ කළ හැකි වන්නේ එවැනි සහායක් ලබා දෙන මානව හිමිකම් සංවිධාන සමග සම්බන්ධ වීමට ලැබුණ හොත් පමණි.

නීතිවේදීන්ට රැඳවුම්භාරයේ සිටින තම සේවාදායකයින් හමුවීමට යාම සඳහා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ (TID) අධ්‍යක්ෂවරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ගැනීම අවශ්‍ය වීමේ පරිපාලනමය පිළිවෙතක් පවතියි. මේ අන්දමින් අවසර ලබා ගැනීමට සති ගණනක් හෝ මාස ගණනක් ගත වූ අවස්ථා රැඳවියන්ගේ පවුල්වලට අත්විඳින්නට සිදුවී තිබේ.

**ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්**

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්දැකීම් වලට සංසන්දනාත්මකව**

| | |
|---|---|
| නීති නියෝජනය සඳහා අයිතිය | ▪ රැඳවූ ස්ථානය පිළිබඳ තොරතුරු නොතිබීම<br>▪ නීතිවේදියකු සකකරු හමුවීමට යන්නේ නම් සති කිහිපයකට පෙර සිට ඒ සඳහා අවසර ගැනීමේ දීර්ඝ පරිපාලන ක්‍රියාවලියක් තිබීම<br>▪ රැඳවියන්ට නීතිවේදියෙකුගේ සහාය විමර්ශනයේ සෑම අදියරකදීම ලබා ගැනීමට නොහැකි වීම<br>▪ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන් නියෝජනය කිරීම මගින් නීතිවේදීන්ට බිය සහ සමාජ අපකීර්තිය ඇති වීම. |

[93] Prison Study by the Human Rights Commission of Sri Lanka, Human Rights Commission of Sri Lanka, 2020, at pages 639-644. Found at https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Study-by-HRCSL_Concise-Version.pdf (Referred to as "HRCSL Prison Report 2020")

රැඳවුවන්ට නීති උපදෙස් ලබා ගැනීම විමර්ශනයේ සෑම අදියරකදී ම කළ නොහැකි තත්වයක් තිබෙන බවත්, ඇතැම් අවස්ථාවල ඔවුන්ට කිසිදු නීති උපදෙසක් ලබා ගැනීමට නොහැකි බවත්, නීති ආධාර ක්‍රමවේදය යටතේ ලබා දුන් නීතිවේදියා ද රැඳවුවන්ට අවබෝධ කර ගත හැකි භාෂාවකින් කථා නොකළ බවත් ත්‍රස්තවාදය මර්ධනය පිළිබඳව වූ විශේෂ වාර්තාකරු විසින් නිරීක්ෂණය කර තිබේ.[94] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන නඩුවලට පෙනී සිටීම සම්බන්ධයෙන් බැඳී ඇති අපකීර්තිය හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ගොනු කිරීමෙන් පසුව රැඳවුවන් නියෝජනය කිරීමට නීතිවේදීන් මැලිකමක් දැක් වූ බවත්, අධිකරණයේ කාර්යපටිපාටීන් සැකකරුට අවබෝධ කරගත නොහැකි භාෂාවකින් තිබෙන විට ඇතිවන දුෂ්කරතා පිළිබඳවත් 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් වාර්තා කර තිබුණි.[95]

එසේම, බොහෝ දෙමළ පුද්ගලයින් මෙම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටත් වන නඩු විභාග විදිරිවාදී පරිසරයක පැවැත්වෙන බවක් සලකන හෙයින් ඇතැම් දෙමළ නීතිවේදීහු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන නඩු විභාග සඳහා සහභාගිවීමට බියක් පළ කළහ. මෙම නඩු සම්බන්ධයෙන් කටයුතු කරන විනිසුරුවරුන්ගේ අපක්ෂපාතීත්වයක් සහ ස්වාධීනත්වයක් නොමැතිකම සම්බන්ධයෙන් ද නීතිවේදීන් සැලකිල්ල යොමු කරන ලද අතර, යාපනය හෝ වවුනියාව වැනි දෙමළ බහුතරයක් සහිත ප්‍රදේශවලට මෙම නඩු මාරුකර දෙන මෙන් ඔවුන් ඉල්ලා තිබේ.[96]

## (ඇ) අත් අඩංගුවට ගැනීමට හේතු සහ රඳවා තබා ගැනීම යුක්තිමත් කිරීම අධිකරණය සමාලෝචනයකට ලක් නොවීම

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධාන උපුටා දක්වනු ලබන මහේස්ත්‍රාත් අධිකරණවල සිදුවන සම්පූර්ණ කාර්යපටිපාටියම ක්‍රමවත්ව අධ්‍යයනය කර ප්‍රකාශනයට පත් කළ තොරතුරු කිසිත් නොමැත. මේ සම්බන්ධයෙන් පවතින ලිපිලේඛන ඇසුරින් පහත කරුණු අවධානයට යොමු කරනු ලැබේ:

නඩු විභාගය අවසාන වන තෙක් සැකකරු රඳවා තබා ගැනීම පිණිස පනතෙහි 6(1) වැනි වගන්තිය යටතේ එම පුද්ගලයා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ දී, එම අත් අඩංගුවට ගැනීමට තුඩු දුන් හේතු යුක්තිමත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි යොදාගෙන ඇති යෙදුම් ඔස්සේ මහේස්ත්‍රාත්වරයාට ඉඩ සලසා නොමැත. කෙසේ නමුත්, 'වරද සිදුකළ බවට සාධාරණ සැකයක් හෝ සාධාරණ පැමිණිල්ලක්' තිබෙන්නේ යැයි විධායකය විසින් අධිකරණය සෑහීමකට පත් කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන තිබේ. නීති වෘත්තිකයින්ගේ අවබෝධයන්ට අනුව, නිශ්චිත වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇත්තේ ද නැත හොත් වරදක් සිදු කළ බවට සාධාරණ පැමිණිල්ලක් ඇත්තේ ද යන්න සොයා බැලීම පිණිස මෙකී සීමිත සමාලෝචන බලය මහේස්ත්‍රාත්වරුන් විසින් නිරන්තරයෙන් යොදා ගනු නොලබයි. රඳවා තැබීම අනිවාර්යයෙන් ම අවශ්‍ය වන්නේ ද යන කාරණාව එක් එක් නඩුවට වෙන් වෙන් වශයෙන් අධිකරණය විසින් සමාලෝචනය කළ යුතු බවත්, එවන් සමාලෝචනයක් නොපවතින බවත් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම විසින් ද ප්‍රකාශ කර තිබේ.[97]

රැඳවුම් නියෝග සම්බන්ධයෙන් ගත හොත්, ඒවා අධිකරණ සමාලෝචනයට ලක් කිරීම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් ප්‍රකාශිතව ම බැහැර කර තිබේ (ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 10 වැනි වගන්තිය). රැඳවුම් නියෝගයක් යටතේ රඳවා සිටින තැනැත්තන් සම්බන්ධයෙන් (ත්‍රස්තවාදය වැළැක්වීමේ

[94] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 23.

[95] HRCSL Prison Report 2020 at page 524.

[96] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 47.

[97] International Commission of Jurists, Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects (ICJ Briefing Note, September 2010) 05.

පනතෙහි 9 වැනි වගන්තිය) මහේස්ත්‍රාත්වරයකුට ක්‍රියාත්මක කළ හැකි සමාලෝචන බලතලයක් නොමැත්තේ ය. එහිදී යොදාගත හැකි එකම අධිකරණ සමාලෝචනය වන්නේ හේබියස් කෝපුස් සහ මූලික අයිතිවාසිකම් අයදුම් වේ. එහිදී ද, 'රඳවා තැබීම සඳහා දැක්වූ හේතු දැඩි සමාලෝචනයකට ලක් කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ක්‍රියාකාරීත්වය බේදජනක ලෙස ප්‍රමාණවත් නොවන' බව සඳහන් වී තිබේ.[98]

## (ඈ) රඳවා තබාගන්නා කාලසීමාව

ත්‍රස්තවාදය වැලැක්වීමෙ පනත ක්‍රියාත්මකවූ තැන් පටන් අත් අඩංගුවට ගත්, රැඳවුම් නියෝග යටතේ රඳවා ගත්, අධිකරණ නියෝගය මත රිමාන්ඩ් ගත කළ, අධිචෝදනා ගොනුකළ, පුනරුත්ථපනය කළ, නඩු විභාගයකින් පසුව නිදහස් කළ හා වරදකරුවන් කළ මුළු පුද්ගලයින් සංඛ්‍යාව සම්බන්ධයෙන් මෙතෙක් පොදුවේ තොරතුරු ලබා ගැනීමට නැත.

මේ සම්බන්ධයෙන් පවතින දත්ත සැලකීමේදී, 2010 වර්ෂයේ දී, එනම් යුද්ධය අවසාන වී වසරක් ගතවූ පසු අන්තර්ජාතික නීතිවේදීන්ගේ කොමිසම විසින් ප්‍රකාශ කර තිබුණේ චෝදනා ගොනු කිරීමෙන් හෝ නඩුවිභාග යකින් තොරව ශ්‍රී ලංකාවේ පරිපාලන රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින් සංඛ්‍යාව අටදහසක් පමණ වන බවයි.[99] 2018 වර්ෂයේ දී, ත්‍රස්තවාදය මර්ධනය කිරීම සම්බන්ධයෙන් වන විශේෂ වාර්තාකරු සඳහන් කර තිබුණේ සිරකරුවන් 81 දෙනෙකු පූර්ව-නඩුවිභාග රැඳවුම් භාරයේ ද, 70 දෙනෙකු වසර පහක් තිස්සේ නඩු විභාගයක් නොමැතිව ද රඳවා ගෙන සිටින බවත්, 12 දෙනෙකු දස වසරකට අධික කාලයක් තිස්සේ නඩු විභාගයකින් තොරව රැඳවුම් භාරයේ සිටින බවත් ය. ඇප ලබාදීමට නීතිපතිවරයා විසින් එකඟ නොවීම මත, එල්ටීටීඊ සංවිධානය සමඟින් වූ විවිධ සැබෑ හෝ ආරෝපිත සම්බන්ධතා හෝ ඇසුර මත රඳවා සිටින පුද්ගලයින් වසර ගණනක් තිස්සේ චෝදනා ගොනු කරනු ලැබීමකින් හෝ නඩු විභාගයකින් තොරව, ඔවුන් එසේ රඳවා තැබීම සම්බන්ධයෙන් කිසිදු අධිකරණ සමාලෝචනයකට ලක් නොවී, සහ නිදහස් වීමේ කිසිදු හැකියාවක් නොමැතිව වසර ගණනාවක් තිස්සේ රැඳවුම් භාරයේ සිටින බව ද එම විශේෂ වාර්තාකරු සඳහන් කර තිබේ.[100] ඇතැම් එල්ටීටීඊ රැඳවුන්ගේ නඩු අවසාන කිරීමකින් තොරව වසර 18-19 ක් තරම් දීර්ඝ කාලයක් ඔවුන් රැඳවුම් භාරයේ තබා ගෙන සිට ඇති බවත්, ඇතැම් අවස්ථාවලදී වලදී ඔවුන්ට විරුද්ධව චෝදනා ගොනු කිරීමට ද වසර 15 ක් තරම් කාලයක් ගත වී ඇති බව ත් 2017 දී වාර්තා කරන ලදී.[101]

2011 අගෝස්තු 29 වැනි දින, එනම් හදිසි අවස්ථා තත්වය ඉකුත් වී යන්නට පැය 24 ක කාලයකට පෙර, හදිසි අවස්ථාව යටතේ පනවන ලද හදිසි අවස්ථා රෙගුලාසියක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට අන්තර්ග්‍රහණය කරගන්නා ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් නියෝගයක් හෝ මහේස්ත්‍රාත්වරයකුගෙන් රිමාන්ඩ් භාරයට පත් කිරීමේ නියෝගයක් ලබා ගන්නා තෙක් තවත් දින තිහක කාලයක් සඳහා හදිසි අවස්ථා රෙගුලාසි යටතේ රඳවාගත් තැනැත්තන් අඛණ්ඩව රඳවා තබා ගැනීම සඳහා මෙයින් අවසර ලබා දෙන ලදී. ප්‍රායෝගිකව මෙහි අර්ථය වූයේ, රැඳවූවන් පොලිස් භාරයෙන් හමුදා අධිකාරය භාරයට පත්වීම හෝ රැඳවුම් ස්ථානය මාරුකිරීම වූ අතර, ඔවුන්ට අදාළව පරිපාලන රැඳවුම් කාල සීමාව නැවතත් අලුතින් ආරම්භ වූවක් මෙන් සියල්ල නැවතත් මුල සිට පිහිටුවීමක් මෙයින් සිදු විය.[102]

---

98 Niran Anketell and Gehan Gunatilleke, *Emergency Law in the Context of Terrorism* (Venture Associates and South Asia for Human Rights), 2011

99 International Commission of Jurists, *Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects* (September 2010).

100 Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018)

101 Ruki Fernando, 'Court acquits Tamil mother after 15 years of detention under PTA' (Groundviews, 05 October 2015) <https://groundviews.org/2015/10/05/court-acquits-tamil-mother-after-15-years-of-detention-under-pta/#_ftn9> accessed 24 November 2020.

102 Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 14.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධ සිරකරුවන් පිළිබඳව පරිච්ඡේදයක් ඇතුළත්, බන්ධනාගාර පද්ධතිය පිළිබඳව වූ වාර්තාවක් 2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් නිකුත් කරන ලදී.[103] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගත වූ පුද්ගලයින් 121 ක් බන්ධනාගාර පද්ධතියේ සිටින බව මෙම වාර්තාවේ සඳහන් වේ. ඉන් පුද්ගලයින් හැත්තෑ එකක් (58%) රිමාන්ඩ් භාරයේ සිටින අතර, ඉතිරිය වරදකරුවන් වී බන්ධනාගාරගතව සිටින තැනැත්තන් ය. රිමාන්ඩ්භාරයේ සිටින පුද්ගලයින් අතරින් එකොලොස් දෙනෙක් (15%) අවුරුදු 10 ත් 15 ත් අතර කාලයක් රිමාන්ඩ් භාරයේ සිට ඇති අතර, පුද්ගලයින් 29 දෙනෙක් (41%) අවුරුදු 5 ත් 10 ත් අතර කාලයක් රිමාන්ඩ් භාරයේ සිට ඇත. වාර්තාගත දීර්ඝත ම නඩු කාලය අවුරුදු 14 ක් විය. එසේම, 'දින නියම නොකළ' නඩු පිළිබඳව ද මෙම වාර්තාවේ ලේඛනගත කර තිබේ. එහිදී සිදුවන්නේ, විමර්ශනයේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පොලීසිය විසින් නිශ්චය කරගත් පසු, නඩුවේ මීළඟ දිනය තීරණය කිරීමට පොලීසියට ඉඩ සලසමින් නඩුව සඳහා 'දින නියම නොකරන' මෙන් පොලීසියෙන් මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලා සිටීමයි. එම කාලසීමාව මුළුල්ලේ ම රැඳවියා සිරභාරයේ සිටිනු ලැබේ.

## (ඉ) පවුල් වලින් දුරස්ථ බව

රැඳවුම් ස්ථානවලට බෙහෙවින් දුර බැහැර ප්‍රදේශවල ජීවත්වන පවුලේ සාමාජිකයින් සමගින් රැඳවියන්ට වූ සම්බන්ධය අහිමි වී යාම සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් රැඳවියන්ට සපයනු නොලබන ද්‍රව්‍ය වන පුද්ගලික සෞඛ්‍යාරක්ෂක නිෂ්පාදන වැනි පුද්ගලික සැපයුම් වෙත ප්‍රවේශ වීමට නොහැකිවීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ බන්ධනාගාර පිළිබඳ 2020 වාර්තාවේ සඳහන් වේ. ත්‍රස්තවාදය වැළැක්වීමෙ පනත ක්‍රියාත්මක වීම හේතුවෙන් වැඩියෙන් ම බලපෑමට ලක්ව ඇත්තේ දෙමළ පුද්ගලයින් වන අතර, එම පනත යටතේ සිදුකරන රඳවා තැබීම් හා නඩු විභාග දෙමළ බහුතරයක් සහිත ප්‍රදේශවල සිදුවන්නේ කලාතුරකින් වන බව 2018 දී ත්‍රස්තවාදය මර්ධනය පිළිබඳ විශේෂ වාර්තාකරු නිරීක්ෂණය කර තිබේ. අධිකරණවල කාර්යපටිපාටි සලකා බැලූ විට, දීර්ඝ කාලයක් තිස්සේ ඉතා දුර බැහැර ප්‍රදේශවල ජීවත්වන පවුලේ සාමාජිකයින් තුළ මේ සම්බන්ධයෙන් වූයේ අසහනකාරී හැඟීමක් වූ අතර තමන්ව එම ක්‍රියාවලියෙන් බැහැර කර ඇති බව ඔවුන්ගේ හැඟීම විය. එසේම, ගෙවා ගැනීමට නොහැකිව ගොඩ ගැසුනු නීතිඥ ගාස්තු එම පවුල්වල මූල්‍ය තත්වය කෙරෙහි ද බලපෑමක් ඇති කරන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ 2020 බන්ධනාගාර පිළිබඳ වාර්තාවේ දැක්වේ.[104] රැඳවූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් අතර ඇතිවන මෙම දුරස්ථබව දරුවන් ඇතුළුව පවුලේ සාමාජිකයින්ට බලපාන අන්දම, සමාජ සබඳතා සඳහා බලපාන අන්දම, ජීවනෝපාය හා නඩු විභාගයේ දී නිසි ලෙස විත්තියක් ගොනුකර ගැනීමට ඇති හැකියාවට පවා බලපාන අන්දම පිළිබඳව තොරතුරු හිඟ බවක් පෙනෙන්නට තිබේ.

## (ඊ) වධහිංසා

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හරහා වධහිංසා සඳහා හැකියාව ඇතිකරවන පරිසරයක් නිර්මාණය පිළිබඳව මනාව ලේඛනගත වී තිබේ. පොලිසිය භාරයේ පැය 72 ක් තරම් දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම, විමර්ශන සඳහා පොලීසියට රැඳවූවන්ව රැඳවුම් භාරයෙන් ඉවත්කරගෙන යාමට හැකියාව ලබා දෙන විධිවිධාන, පොලිස් නිලධාරියකුට කරන පාපොච්චාරණයක් අධිකරණයේ පිළිගතහැකි බව යනාදී කරුණු සියල්ල ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන්ට වධහිංසා පැමිණවීම වැඩිකිරීමට දායක වී තිබේ.

### ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්දැකීම් වලට සංසන්දනාත්මකව**

| | |
|---|---|
| වධ හිංසා වලින් නිදහස් වීමට සම්පූර්න අයිතිය (සීමා කිරීම් නැත) | ත්‍ර.වැ.ප. යටතේ සිද්ධීන්හි දී ප්‍රධාන වශයෙන් ම පාපෝච්චාරණය හා සම්බන්ධ වධ හිංසාව හොඳින් ලේඛනගත වී තිබේ. |

[103] Prison Study by the Human Rights Commission of Sri Lanka, Human Rights Commission of Sri Lanka, 2020. Found at https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Study-by-HRCSL_Concise-Version.pdf

[104] HRCSL Prison Report 2020, at page 527

2016 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වධහිංසාවට එරෙහි සම්මුතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට ඉදිරිපත් කළ කරුණු අතර, කොමිෂන් සභාව මෙසේ වාර්තා කර තිබුණි: *'2016 අප්‍රේල් මාසයෙන් පසුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් පුද්ගලයින් දහතුන් දෙනෙකු තමා අත් අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේ සහ/ හෝ අත් අඩංගුවට ගත් පසුව මූලික ප්‍රශ්න කිරීම් සිදුකරන අතරතුර තමන්ට පීඩා කරන ලදැයි හා වධහිංසා පමුණුවන ලදැයි පැමිණිලි කර තිබේ. කොමිෂන් සභාව වෙත වාර්තා වූ පීඩා කිරීම් සහ වධහිංසා ක්‍රමවේද අතරට අත්වලින්, ප්ලාස්ටික් බටවලින් හා දඬුවලින් පහර දීම, ඇඳුම් ගලවන මෙන් පවසා සිටීම හා ලිංගෙ ’න්ද්‍රියන් ප්ලාස්ටික් බට යොදා තද කිරීම, නැවෙන්නට බලකර වැලමිටින් කොන්දට පහරදීම, හිස පහතට සිටින ලෙස කොකු හෝ විදුලි පංකාවක එල්ලා යටිපතුල්වලට පහරදීම, බිමට තල්ලුකර දමා පා පහරදීම හා සිරුර මත අඩිය තැබීම, ලිංගේන්ද්‍රියන් තුළට අල්පෙනෙති ඇතුළු කිරීම, රත්කළ ප්ලාස්ටික් බට යොදාගෙන ශරීරයේ කොටස් පිළිස්සීම, එක් අතක් ශරීරය පසුපසින් ද අනෙක් අත උරහිසට ඉහළින් ද ගෙන එකට මාංචු දමා තැබීම. මාංචු අතරට දණ්ඩක් දමා දෑත් දෙපසට ඇදීම ඇතුළත් වේ. තමන්ව රැඳවුම් මධ්‍යස්ථාන කරා ප්‍රවාහනය කරනු ලැබුවේ දෑත්වලට මාංචු දමා දෑස් බැඳ වන බවත්, ඇතැම් විටෙක පැය හයේ සිට අට දක්වා වූ එම කාල සීමාව තුළ තමන්ට සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීමට අවසර නොලැබුණු බවත් රැඳවියන් විසින් ප්‍රකාශ කර තිබේ.'* [105]

2017 වර්ෂයේ මුල් භාගයේදී තමන් විභාග කළ නඩු වලින් සියයට අනූවක් ඉක්මවන ප්‍රතිශතයක අත්‍යාවශ්‍ය සාක්ෂි තර්ජන හෝ බලහත්කාරය යොදා ගනිමින් ලබාගත් ඒවා වූ හෙයින් එම සාක්ෂි බැහැර කරන්නට තමන්ට සිදුවූ බවක් ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයකු විසින් නිරීක්ෂණය කළ බව ත්‍රස්තවාදය මර්ධනය කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු විසින් වාර්තා කර තිබේ.[106] වධහිංසාවට ලක් කරනු ලැබීමෙන් පසුව, ඇතැම් විටෙක පොලීසියේ හෝ ආරක්ෂක හමුදා භාරයෙන් පිටතට මාරු කර හරින බවර පොරොන්දු ලැබීම මත රැඳවියන් තමන්ට නොතේරෙන භාෂාවකින් වූ ලේඛනවලට අත්සන් තබා තිබුණි, නැත හොත් හිස් කඩදාසියක පහළ කෙළවරේ අත්සන් තබන මෙන් ඔවුන්ට පවසා තිබුණි.[107]

2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වාර්තා කර තිබුණු අන්දමට සමීක්ෂණයට සම්බන්ධ කරගත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ සිරකරුවන් අතරින් 92%ක් පොලීසිය හෝ අත් අඩංගුවට ගත් බලධාරීන් අතින් පීඩා කිරීම් අත්විඳ තිබේ.[108]

සිරභාරයේ සිටින පුද්ගලයින්ට වධහිංසා පැමිණවීමට යොදාගත් ශාරීරික ක්‍රමවේද සම්බන්ධයෙන් 1998 තරම් අතීතයේ සිටම, සිදු කරන ලද විවිධ අධ්‍යයන බොහෝ සංඛ්‍යාවක් තිබේ.[109] වධහිංසාවල ශාරීරික සහ මානසික බලපෑම් සම්බන්ධයෙන් සහ සුවපත් වී සමාජයට නැවතත් ඒකාබද්ධවීමට ගතවන දීර්ඝ කාලය සම්බන්ධයෙන් ද සොයාගත් කරුණු තිබේ.

සමීක්ෂණයට සම්බන්ධ වූ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතයටතේ සිටි රිමාන්ඩ් රැඳවියන් අතරින් 76% ක් ද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ වරදකරුවන් අතරින් 86% ක් ද විෂාදය හා බැඳුණු ස්ව-පීඩා හෝ දිවි නසාගැනීමට තැත් කිරීම් පිළිබඳව වාර්තා කළ බව ද ශ්‍රී ලංකා මානව හිමිකම්

---

105 International Commission of Jurists, Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects (ICJ Briefing Note, September 2010) 05.

106 Niran Anketell and Gehan Gunatilleke, *Emergency Law in the Context of Terrorism* (Venture Associates and South Asia for Human Rights), 2011.

107 Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 18

108 HRCSL Prison Report 2020 at page 521.

109 D Somersunderum, 'Torture in Sri Lanka - A method of physical, psychological and socio-political terror under PTA', *In Sri Lanka The Prevention of Terrorism Act - A critical analysis,* Center for Human Rights and Development at page 80.

කොමිසමේ වාර්තාවේ සඳහන් වේ.[110] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටීම හේතුවෙන් එම පුද්ගලයින්ට ඇතිවී තිබෙන මානසික බලපෑම කොතරම් ඉහළ ද සහ කොතරම් බරපතළ ද යන්න ද මෙයින් පෙන්නුම් කෙරේ.

### (උ) එකම පුද්ගලයාට විරුද්ධව විවිධ අධිකරණවල බහුවිධ නඩු පැවරීම

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සැකකරුවන්ට එරෙහිව ඇති බහුවිධ නඩු නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම, ක්‍රමවත් අන්දමින් ලේඛනගත කර නොමැති තවත් පරිචයක් වේ. 2020 දී වාර්තා වූ අන්දමට, එකම පුද්ගලයාට එරෙහිව විවිධ දිස්ත්‍රික්කවල ඇති විවිධ අධිකරණවල බහුවිධ නඩු ගොනුකර තිබෙන අතර, එක් තැනැත්තෙකුට එරෙහිව ගොනුකළ නඩු 15 ක් ද මීට ඇතුළත් වේ.[111] මෙම ව්‍යවහාරයෙන් ඇති වන දුෂ්කරතාවය එතුළින්ම ප්‍රත්‍යක්ෂ වන නමුත්, මෙය වළක්වාගත හැකි පරිපාලන පිළිවෙතක් නිර්මාණය කෙරෙන බව සහතික කරගැනීම සඳහා මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කිරීම වැදගත් වේ.

### (ඌ) පුනරුත්ථාපන ප්‍රතිපත්තිය

2009 ඔක්තෝබර් මාසයේදී, ඒ වන විට රැඳවුම් භාරයේ සිටි 15000 ට ආසන්න සංඛ්‍යාවක් වූ 'හිටපු එල්ටීටීඊ සටන්කාමීන්' පුනරුත්ථාපනය කර සිවිල් ජීවිතයට ඔවුන්ව නැවතත් ඒකාබද්ධ කිරීම සඳහා 2009 ඔක්තෝබර් මාසයේ දී, එවකට ශ්‍රී ලංකා රජය විසින් හිටපු සටන්කාමීන් සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. ආරක්ෂිත නවාතැන් සහිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයක මාස 3 ක සිට මාස 24 ක දක්වා කාලයක් පුනරුත්ථාපනය වීම මෙම පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ සිදුවිය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි රෙගුලාසි යටතේ ක්‍රියාත්මක වූ මෙම පුනරුත්ථාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සැලකිල්ල යොමුවිය යුතු කරුණු බොහොමයක් විය: පුනරුත්ථාපනය අනිවාර්ය කිරීම, නීතිය අවභාවිතය හා අධිකරණමය අධීක්ෂණයක් නොමැතිවීම, ප්‍රශ්න කිරීම් තවදුරටත් අඛණ්ඩව කරගෙන යෑමේ චේතනාවන් සහ පුනරුත්ථාපනයෙන් පසුව සමාජයට මුදාහළ පුද්ගලයින්ට මුහුණදෙන්නට සිදු වූ සමාජ අපකීර්තිය ඒ අතරට ඇතුළත් වේ.[112]

මෙම 'පුනරුත්ථාපන ක්‍රමවේදය මගින්, සාමාන්‍ය අපරාධ කාර්ය පටිපාටි සහ සාධාරණ නඩු විභාග පැවැත්වීම සම්බන්ධ නිසි ක්‍රියාවලිය හා සාධාරණ නඩුවිභාගයක් සඳහා වන අයිතිවාසිකම් කෙරෙහි ලබා දෙන වැදගත්කම අඩු වී තිබීම' කෙරෙහි ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම සිය සැලකිල්ල යොමු කර තිබේ.[113] අඩු අවදානම් 'පුනරුත්ථාපනය වූවන්' සම්බන්ධයෙන් පවා අවුරුදු දෙකක් දක්වා වූ පරිපාලන රඳවා තැබීමක් නියම වූ අතර ජාත්‍යන්තර නීතිය යටතේ කිසිදු වාතාවරණයක නොකළ යුතු යැයි තහනම් කර ඇති සාමූහික දඬුවම් ලබාදීමේ ස්වරූපයක් මේ අන්දමින් පිරිස් රඳවා තැබීම තුළ පවතින බවක් මෙයින් පෙන්නුම් කෙරුණි.

### (එ) දීර්ඝ කාලයක් සිරභාරයේ තබාගෙන සිට නිදහස් කිරීමෙන් ඇතිවන අසාධාරණය

සාමාන්‍ය අපරාධ යුක්ති පද්ධතිය තුළ පවා මේ අන්දමින් දීර්ඝ කාලයක් තිස්සේ සිරභාරයේ තබාගෙන සිටීම සාමාන්‍යයෙන් සිදු වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එය ස්ථාපිත වී තිබෙන ව්‍යවහාරයක් වී ඇති අතර, නඩු විභාගයට පෙර දීර්ඝ කාලයක් තිස්සේ පුද්ගලයින්ව රඳවා තැබීමට ලක්වීමේ සැබෑ

---

[110] HRCSL Prison report 2020, at page 504.

[111] https://srilankabrief.org/2020/04/sri-lanka-cprp-requests-government-to-include-pta-detainees-in-granting-bail-and-relief-to-prisons-due-to-pandemic/

[112] Ambika Satkunanathan, The treatment of former combatants in post-war Sri Lanka: A form of arbitrary detention or rehabilitation?, Routledge Handbook Of Human Rights In Asia, 2018.

[113] "Beyond Lawful Constraints: Sri Lanka's Mass Detention of LTTE Suspects", International Commission of Jurists, September 2010.

අන්තරායක් පවතියි. එසේ දීර්ඝ කාලයක් සිරභාරයේ පසුවීමෙන් සැකකරුවන්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවිත වලට, පවුල්වලට සහ අනාගතයට ඇතිවන බලපෑම සම්බන්ධයෙන් සවිස්තර අධ්‍යනයක් සිදු කර නොමැති බවක් පෙනේ. දීර්ඝ කාලයක් රැඳවුම් භාරයේ තබාගැනීමෙන්, විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති අවිනිශ්චිතතාවයන් මැද එසේ රැඳවුම් භාරයේ සිටීමෙන් ඇතිවන මනෝවිද්‍යාත්මක බලපෑම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ 2020 බන්ධනාගාර වාර්තාවේ යම් තරමකට සඳහන් කර තිබෙන අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන් තමන්ටම හානියක් කර ගැනීමට සිතීම හා එවැනි දෑ අත්විඳීම පිළිබඳව ඔවුන් විසින් ම වාර්තා කර ඇති අවස්ථා ප්‍රමාණය තැතිගන්වනසුළු තරම් ඉහළ බව වාර්තාවේ සඳහන් වේ.

2015 දී වාර්තා වූ එක් සිදුවීමකට අනුව 2000 වර්ෂයේදී රිමාන්ඩ් භාරයට පත් වූ එක්තරා තිදරු මවක් 2015 දී මහාධිකරණය විසින් නිර්දෝෂී බව තීරණය කරන ලද අවස්ථාවක් පිළිබඳව විස්තර කර ඇත.[114] පුද්ගලයින් රැඳවුම් භාරයට ගෙන දීර්ඝ කාලයකට පසු නිදහස ලැබූ, මේ හා සමාන අවස්ථාවලදී අසාධාරණ අන්දමින් අත් අඩංගුවට ගෙන රඳවා තැබීමට ලක් වූ එම පුද්ගලයින්ගෙන් කිසිදු සමාව ඉල්ලා සිටීමක් හෝ ඔවුන්ට වන්දියක් ලබා දීමක් සිදු කර නොමැත.[115] ඒ අය මානසිකව හා ශාරීරිකව බලපෑමට ලක්ව, පහසුවෙන් තමන්ගේ සාමාන්‍ය ජීවිතය නැවත ආරම්භ කරගැනීමට නොහැකිව පසුවෙති.[116] සමාජයෙන් එල්ලවන විවේචන මධ්‍යයේ තම දිවිය පවත්වාගෙන යාමට අරගල කරන්නට ඔවුන්ට සිදු වී තිබේ.[117] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් ඇති වන මෙම දීර්ඝකාලීන බලපෑම් අධ්‍යනය කර එයට ආමන්ත්‍රණය කිරීම සඳහා රජයෙන් අනුග්‍රාහකත්වය සහිත වැඩසටහනක් ඇති බවක් නොපෙනෙයි.

## (ඒ) සමස්ත ප්‍රජාවන්ම සහ සාමකාමීව සිදු කරන විවේචන හෝ විරුද්ධත්වය දැක්වීම් ත්‍රස්තවාදීන් හෝ ත්‍රස්තවාදී ක්‍රියා වශයෙන් සලකා අපකීර්තියට පත් කිරීම.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබීම හේතුවෙන් පවුලේ සාමාජිකයින් සහ ප්‍රජාවේ සාමාජිකයින් අත්විඳින අපකීර්තිය පිළිබඳව අධ්‍යනයන් සිදු කර නොමැත. අපකීර්තිය නිසා ඇතිවන බලපෑම යම් ප්‍රජාවක සාමාජිකයින්ගේ පුද්ගලික ආරක්ෂාව මත බලපෑම් එල්ල කළ හැකි අතර එය වෙනස්කොට සැලකීම් සඳහා ශක්තිය ලබා දෙන අන්දමේ සහ ප්‍රචණ්ඩත්වය හෝ තව තවත් රඳවා තැබීමට ලක්වීමේ අවදානම වැඩි කරවන පරිසරයක් නිර්මාණයට හේතු වෙයි.

සමස්ත ප්‍රජාවන් ම සහ සිවිල් සමාජ සාමාජිකයින් ද, ඕනෑම ස්වභාවයක සාමකාමී විවේචන හෝ විරුධතාවය දැක්වීමේ ක්‍රියා ද 'ත්‍රස්තවාදීන්' යනුවෙන් අපකීර්තියට හෙළීමට, හංවඩු ගැසීමට හා චෝදනාවට ලක් කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ත්‍රස්තවාදී ක්‍රියා යන යෙදුම සම්බන්ධයෙන් ඇතුළත් වී ඇති බෙහෙවින් පුළුල් නිර්වචනය මගින් බලධාරීන්ට ඉඩ ලබාදී ඇති බව ත්‍රස්තවාදය මර්ධනය පිළිබඳ විශේෂ වාර්තාකරු සඳහන් කර ඇත. එල්ටීටීඊ සංවිධානය සමගින් වක්‍රාකාරයෙන් හෝ යම් සම්බන්ධයක් තිබුණු බවට සැකයට භාජනය වූ තැනැත්තන්ව අත් අඩංගුවට ගැනීමට, රඳවා තැබීමට, ප්‍රශ්න කිරීමට හා නිසි ක්‍රියාවලියේ හා සාධාරණ නඩු විභාගයක් සඳහා වන සහතිකවීමෙහි අඩු ප්‍රමිතීන්ට භාජනය කිරීමට බලධාරීන්ට අවස්ථාව සලසා ඇති බව ද විශේෂ වාර්තාකරු සඳහන් කර ඇත.[118]

---

[114] Ruki Fernando, 'Court acquits Tamil mother after 15 years of detention under PTA' (Groundviews, 05 October 2015) <https://groundviews.org/2015/10/05/court-acquits-tamil-mother-after-15-years-of-detention-under-pta/#_ftn9> accessed 24 November 2020.

[115] HRW, Locked Up Without Evidence, at page 1.

[116] HRW, Locked Up Without Evidence, at page 1.

[117] Ruki Fernando, 'Court acquits Tamil mother after 15 years of detention under PTA' (Groundviews, 05 October 2015) <https://groundviews.org/2015/10/05/court-acquits-tamil-mother-after-15-years-of-detention-under-pta/#_ftn9> accessed 24 November 2020.

[118] Human Rights Council, Report of the Special Rapporteur on the promotion and protection of human rights while countering terrorism A/HRC/40/XX/Add.3 (23 July 2018) para 1.

# 5. 2019 වර්ෂයේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම් හා රඳවාගැනීම් පිළිබඳ අත්දැකීම්

## නිරීක්ෂණය කළ නඩු පිළිබඳ විස්තරය

මෙම ක්‍රියාකාරී පර්යේෂණ අධ්‍යනයේ කොටසක් වශයෙන් පුද්ගලයින් 47 දෙනෙකුගේ අත්දැකීම් නිරීක්ෂණයට ලක් කරන ලදී. මෙම පුද්ගලයින් 47 දෙනා නඩු 24 ක සැකකරුවන් වශයෙන් නම් කළ තැනැත්තන් වේ. නිරීක්ෂණයට ලක් කළ මෙම නඩු ශ්‍රී ලංකාවේ පළාත් 5 ක මහේස්ත්‍රාත් අධිකරණ 10 ක් ඉදිරියට පමුණුවා තිබූ නඩු කටයුතු ය. නැගෙනහිර, උතුර, උතුරු මැද, වයඹ සහ බස්නාහිර යන පළාත්වල මෙම නඩු පවරා තිබුණි.

අධිකරණයේ නඩු වාර්තාවල ඇතුළත් තොරතුරු සහ එම සියලුම පුද්ගලයින් වෙනුවෙන් පෙනී සිටි නීතිවේදීන් ලබා දුන් තොරතුරු ද, රැඳවූවන්ගේ පවුල්වල සාමාජිකයින් සමගින් සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් 2020 දී නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශිත වාර්තාවකින් ලබාගත් තොරතුරු ද යන තොරතුරු මූලාශ්‍ර දෙකෙන් ලබාගත් තොරතුරු මෙම කොටස සම්පාදනය සඳහා උපයෝගී කරගෙන තිබේ.

## (අ) නීති නියෝජනයක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම

අත් අඩංගුවට පත් වූ තම පවුලේ සාමාජිකයින් වෙනුවෙන් නීති නියෝජනය ලබා ගැනීමේ දී එම පවුල්වල සාමාජිකයින්ට එයට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් දුෂ්කරතා ඇතිවූ බව නිරීක්ෂණය කරන ලදී. මෙම නඩු 'ත්‍රස්තවාදී නඩු' යනුවෙන් හඳුන්වන ලද අතර, නීති නියෝජනයක් ලබා ගැනීමට යාමේදී 'ත්‍රස්තවාදී නඩු' යනුවෙන් හඳුන්වනු ලැබීමත් සමග බැඳුණු අත්දැකීම් වන, නඩුවට පෙනී සිටීමට නීතීඥයින් ප්‍රතික්ෂේප කිරීම හෝ මැළිවීම සම්බන්ධ අත්දැකීම්වලට මුහුණ දෙන්නට ඔවුන්ට සිදුව තිබුණි. එක් සැකකරුවකුගේ පවුලේ සාමාජිකයකු විසින් සඳහන් කළ අන්දමට 'නඩු භාණ්ඩ' තිබෙන්නේ නම් (එනම්, අධිකරණයට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන භාණ්ඩ තිබේ නම්) තමන්ට නඩුව වෙනුවෙන් පෙනී සිටීමට නොහැකි බව එක්තරා නීතිවේදියක් පවසා තිබේ. එක් නීතිවේදියකුගෙන් තවත් නීතිවේදියකු වෙත යනාදී වශයෙන් නීතිවේදීන් තිදෙනෙක් අනුපිළිවෙලින් එම නඩුව ප්‍රතික්ෂේප කළ අන්දම තවත් රැඳවූවෙකුගේ පවුලේ සාමාජිකයකුගේ මතකයේ රැඳී තිබේ. ශ්‍රී ලංකා නීතීඥ සංගමය වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යවන ලද ලිපියක 'එක්තරා ප්‍රජාවකට අයත්, පීඩා විඳි පාර්ශවයන් වෙනුවෙන් පෙනී සිටීම ප්‍රතික්ෂේප කිරීමේ නැඹුරුවක්' පිළිබඳව සඳහන් කර ඇති අතර, අප්‍රේල් 21 වැනි දින සිදුවූ ප්‍රහාරවලින් පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් පුද්ගලයින් හය දෙනෙකු වෙනුවෙන් පෙනී සිටීමට මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ සාමාන්‍යයෙන් වෘත්තියේ නිරතවන සියලුම නීතිවේදීන් විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් වූ නිශ්චිත වාර්තාවක් පිළිබඳව ද එහි සඳහන් කර තිබුණි. සැබැවින් ම, ඇප ඉල්ලා සිටීම යන සීමිත කාරණාව සඳහා පමණක් පෙනී සිටීමට වෙනත් ප්‍රදේශයකින් එතැනට පැමිණ සිටි නීතිවේදියකු එකඟ වූ විට (මෙය, මහේස්ත්‍රාත් අධිකරණයක වෘත්තියෙහි නියැළෙන වෘත්තිකයෙකුට සාමාන්‍ය රාජකාරියකි) සාමාන්‍යයෙන් එම අධිකරණයෙහි වෘත්තියෙහි නියැළෙන අනෙක් නීතිවේදීන් ඇයට ද ඇඩිව එදිරි වී ඇත.[119] මානව හිමිකම් කොමිෂන් සභාවට ප්‍රතිචාර දැක්වූ නීතීඥ සංගමයේ ස්ථාවරය වූයේ 1988 ශ්‍රේෂ්ඨාධිකරණ රීති (නීතිවේදීන්ගේ චර්යාව හා ආචාර රීති) අංක 5 යටතේ වන අතුරු විධානය ප්‍රකාරව තමන් නියෝජනය කරන සේවා දයකයින් තීරණය කිරීමට නීතිවේදීන්ට අභිමතය

[119] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ආචාර්ය දීපිකා උඩුගම ගේ අත්සනින් යුතුව ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතීඥ කාලිංග ඉන්ද්‍රතිස්ස වෙත යැවූ, 2019 ජූලි 27 වැනි දින දරන ලිපිය 2019 ජූලි 28 වැනි දින "HRCSL Concerned" යන සිරස්තලයෙකa Sunday Morning පුවත් වෙබ් අඩවියේ පලවිය

හිමි බවත් නීති නියෝජන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් නීතිඥ සංගමයට නිල වශයෙන් ක්‍රියාමාර්ග ගත නොහැකි බවත් ය.[120]

ඉහත සඳහන් කළ 5 වැනි රීතියේ මෙසේ සඳහන් වේ: 'ඕනෑම අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ යුක්තිය පසිඳලීම සඳහා ඇතිකරන ලද වෙනත් ආයතනයක් ඉදිරියේ ඇති ඕනෑම කරුණක් හෝ නඩු කටයුත්තක් සඳහා හෝ, ඕනෑම වෘත්තීමය කරුණක් සඳහා, තමන්ගේ වෘත්තීමය ගාස්තු අයකරමින් පාර්ශවයක් හෝ පුද්ගලයෙකු වෙනුවෙන් ක්‍රියා කිරීමට නීතිවේදියකුට ප්‍රතික්ෂේප කළ නොහැකි ය. කෙසේ නමුත්, තමන්ගේ මතය අනුව තම වෘත්තීමය ස්වාධීනත්වය පවත්වාගෙන යාම දුෂ්කර කරවන හෝ එවැනි වෘත්තීය කරුණක් භාර ගැනීම වෙනත් ආකාරයකින් යුක්තිය පසිඳලීමේ යහපත සමගින් පරස්පර වන අවස්ථාවක දී එවැනි විශේෂ වාතාවරණ යටතේ සේවාදායකයකු වෙනුවෙන් ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීමට නීතිවේදියකුට හැකි ය.'

මෙයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 'මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය දක්වන සාධනීය ප්‍රතිචාරය මගින් වැඩදායක වූ පණිවුඩයක් යැවෙනු ඇති බවත්, මහජනතාව වෙත, විශේෂයෙන් ම පීඩාවිඳි පාර්ශවයන් වෙත ඉහළම වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව නීති නියෝජන ලැබීමේ ප්‍රතිලාභය හිමිවනු ඇති බව සහතික කරනු ඇති බවත්' සඳහන් කරමින්, රටේ විවිධ ප්‍රජාවන් අතරේ ගැඹුරට කාවැදී ඇති ආතතීන් හා බෙදීම් කෙරෙහි ද අවධානය යොමු කර තිබුණි. මෙම ගැටළුව සම්බන්ධයෙන් තවදුරටත් ඉදිරි පියවර ගත් බවක් පෙනෙන්නට නැත.

නීතිඥයින්ගේ සහාය ලබා ගත හොත් තම පවුලේ සාමාජිකයාගේ නඩුව තවත් දික්ගැසීමට එය හේතුවනු ඇති බැවින් නීතිඥයින්ගේ සේවා ලබා නොගන්නා මෙන් ප්‍රදේශයේ පොලීසිය තමන් වෙත දැනුම් දුන් බව ඇතැම් පවුල් විසින් අවධානය යොමු කළ තවත් කරුණක් වේ

## (ආ) අත් අඩංගුවට ගැනීම්

### අත් අඩංගුවට ගත් ආකාරය

අත් අඩංගුවට ගැනීම සඳහා හේතු සඳහන් නොකිරීම බොහෝ පවුල් ලැබූ පොදු අත්දැකීමක් විය. ඇතැම් පවුල්වලට ලබාදී තිබූ අදහස වූයේ තම පවුලේ සාමාජිකයා යම් ප්‍රශ්න කිරීමක් සඳහා අවශ්‍ය කර ඇති බවක් වන නමුත් පසුව ඔවුන්ට දැනගත හැකි වී ඇති අන්දමට පොලීසියට රැගෙන ගිය විට එම පුද්ගලයාව අත් අඩංගුවට ගෙන ඇත.

අදාළ පුද්ගලයින් තමන්ගේ නිවසේ දී අත් අඩංගුවට ගෙන හෝ ඔවුන් විසින්ම ගොස් පොලිසියට භාර වූ පසුව පවා එම පුද්ගලයින් පොලීසියෙන් සැඟවී සිටි බවක් පොලීසිය විසින් අධිකරණයට වාර්තා කර තිබූ අන්දම පවුල් කිහිපයක් විසින් ම විස්තර කරන ලදී.[121] එක් අවස්ථාවක දී, එක් සැකකරුවෙකු ප්‍රශ්නකිරීම සඳහා අම්පාරේ පාලු නිවසකට ගෙන ගොස් තිබේ. තමන් හමුදා සංවිධානය යටතේ මාස හතරක් පුහුණුව ලැබූ බව ප්‍රකාශ කළහොත් ඔහුව නිදහස් කරන බවක් ඔහු වෙත පවසා තිබේ.[122] එසේ කීමට බල කිරීමෙන් පසුව ඔහුව රඳවාගෙන තිබේ. තවත් අවස්ථාවකදී, තමන් අත් අඩංගුවට ගැනීමට දින ගණනාවකට ප්‍රථමයෙන් තමන් සවිස්තරාත්මක ප්‍රකාශ ලබාදී තිබුණ ද අත් අඩංගුවට ගන්නා අවස්ථාවේ දී තමන් අත් අඩංගුවට ගන්නේ කුමන පදනමක් මත ද යන්න පිළිබඳ කිසිදු නිශ්චිත තොරතුරක් ලබා නොදුන් බව උතුරු මැද පළාතේ සැකකරුවෝ පැවසූහ.

120 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස වෙත යැවූ, 2019 සැප්තැම්බර් 30 වැනි දින දරන ලිපිය https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/HRCSL-Letter-to-Bar-Association-of-Sri-Lanka.pdf

121 Marisa de Silva, PTA: Terrorising Sri Lanka for 42 years, Law and Society Trust, November 2020, p 4.

122 එම, 12 පිටුව

අත් අඩංගුවට ගන්නේ කුමන හේතුවක් මත දැයි පැවසීමෙන් වැළකීම සාමාන්‍ය පුරුද්දක් බවට පත්වී ඇති බවක් පෙනී යාම, බරපතළ ලෙස සැලකිල්ල යොමු කළ යුතු කරුණකි. මෙය,රැඳවියාට එරෙහිව ඇති නඩුව කුමක් ද යන්න පිළිබඳව දිගින් දිගටම අත්විඳින්නට වන අවිනිශ්චිත භාවයේ අත්දැකීමේ පළමු අවස්ථාව වන අතර, කිසිදු තොරතුරක් නොමැතිව තමන්ගේ විත්තිය සඳහා සූදානම් වීමේ දුෂ්කර අවස්ථාවට රැඳවියා පත් කරයි. එක්තරා නඩුවකට අදාළ සටහන් නිරීක්ෂණය කිරීමේදී, චෝදනා කිහිපයක් එල්ල කර ඇත්තේ නඩුවේ විවිධ අදියරවලදී බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.[123]

## අත් අඩංගුවට ගැනීමට හේතු

පාස්කු ප්‍රහාරවලින් පසුව අත් අඩංගුවට ගැනීම සඳහා හේතු වශයෙන් දැක්වූ කරුණු හෙළි කරන, තෝරාගත් සිද්ධි අධ්‍යයන පහකින් පහත දැක්වෙන තොරතුරු ලබා ගෙන ඇත:

(1) එක්තරා 21 හැවිරිදි සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන තිබුණේ 'සෝදිසි කිරීම් සිදුකරන්නේ නම් ගේට්ටුවට අධි බලැති විදුලි රැහැනක් සම්බන්ධ කරන්න' යනුවෙන් එක්තරා වට්ස්ඇප් කණ්ඩායමක සාමාජිකයින්ට උපදෙස් දුන් පණිවුඩයක් සාමාජිකයින් වෙත සම්ප්‍රේෂණය කළ වට්ස් ඇප් කණ්ඩායමක සාමාජිකයකු වූයේ ය යන චෝදනාව මත යි සැකකරු පවසා සිටියේ එම කණ්ඩායමෙන් ලැබුණු පණිවුඩය එම කාලය තුළ කෝලාහල ඇතිවේ දැයි බිය පල කරමින් එවූ පණිවුඩයක් වූ බවකි. පොලීසියට පැමිණ ප්‍රකාශයක් කරන මෙන් සිදු කළ දැනුම් දීමක් ලැබීම මත ස්වේච්ඡාවෙන් පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී, එනම් මැයි මාසයේ අගභාගයේ දී මෙම සැකකරු අත් අඩංගුවට ගෙන තිබේ. 2019 අගෝස්තු මාසය වන විටත් මෙම සැකකරු රැඳවුම් භාරයේ සිටි අතර, විමර්ශන සඳහා ඔහුගේ දුරකථනය පොලීසිය භාරයට ගෙන තිබුණි. එවැනි විමර්ශනයක් තුළින් සැකකරුගේ හැසිරීම පැහැදිලි කර ගැනීමට හැකිව තිබුණි. පසුව, මෙම සැකකරු නිදහස් කර තිබුණි.

(2) 2019 මැයි මාසයේ මැද භාගයේ දී නිවසේ සී4 පුපුරන ද්‍රව්‍ය තිබුණේ යැයි යන චෝදනාව මත පියෙකු සහ පුතෙකු අත් අඩංගුවට ගෙන තිබේ. එම ද්‍රව්‍යය සැබැවින්ම ක්ලෝරීන් බව සැකකරුවෝ පවසා තිබේ. 2019 ජුනි මාසයේ දී මෙම සැකකරුවන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී, තහවුරු කර ගැනීම සඳහා එම ද්‍රව්‍යය රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යවා ඇති බව ඔවුන්ට පවසා තිබේ. අගෝස්තු අවසානය වන විට නඩු දින 7 ක් ගත වී තිබුණ ද, රජයේ රස පරීක්ෂක වාර්තාව ලැබී නොතිබීම හේතුවෙන් තීන්දුවක් ගැනීමට නොහැකි වී තිබේ.පසුව මෙම සැකකරුවන් නිදහස් කර තිබේ.

(3) 2014 දී (අළුත්ගම ප්‍රචණ්ඩත්වය ඇති වූ අවස්ථාවේ) ෆේස්බුක් ජාලයෙන් යවා තිබූ පළකිරීමක් (පොස්ට් එකක්) සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා දෙන මෙන් කළ දැනුම්දීමකට අනුව 2019 මැයි මස අගභාගයේ දී ස්වේච්ඡාවෙන් පොලීසියට ගිය 25 හැවිරිදි පුද්ගලයෙකු අත් අඩංගුවට ගෙන ඇති අතර, ඉහත කී පළ කිරීමෙහි අන්තර්ගතය ත්‍රස්තවාදී කණ්ඩායමකට සම්බන්ධ වේ ය යන අදහසක් ඔහු වෙත ගම්‍ය කර තිබේ. මෙම පුද්ගලයා අත් අඩංගුවට පත් වන අවස්ථාව වන විට තම මව සහ බාල සහෝදර සහෝදරියන් දෙදෙනෙකු රක්ෂා කරමින් සිටි අයෙකි. ඔහුගේ නමින් රැඳවුම් නියෝගයක් නිකුත් කර ඇති බව ඔහුට පසුව දැනුම්.දී ඇතත් ඔහුට හෝ කිසිදු නීතිඥයකුට මෙම රැඳවුම් නියෝගය පෙන්වා නැති අතර, පසුව 2019 ජුනි මාසයේ දී ඔහුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ ද එය ඉදිරිපත් කර නොමැත. ඔහුගේ මුල් නම ඇති අයෙක් ප්‍රහාර සඳහා ප්‍රධාන සැකකරුවකු වන බව ද ඔහුට දැනගන්නට ලැබී තිබේ. තමාව රඳවා තැබීම අනන්‍යතාවය වරදවා හඳුනා ගැනීමක් මත සිදුවූවා වියහැකිය යන විශ්වාසයක් ඔහු තුළ තිබේ පසුව, 2019 ජුලි 10 වැනි දින මෙම සැකකරුවා නිදහස් කර තිබේ

[123] කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණයේ බී323/19 නඩුව

(4) සහරාන් (ත්‍රස්ත ප්‍රහාරය සැලසුම් කර සිදු කළ තැනැත්තා වශයෙන් හඳුනාගෙන ඇති පුද්ගලයා) සහ වයඹ පළාතේ ජීවත් වූ එක්තරා සැකකරුවෙකු අතර සිදුවූ සම්බන්ධතා පිළිබඳව පොලීසියේ බුද්ධි අංශයට ලැබුණු තොරතුරු මත 2019 අප්‍රේල් මස අවසානයේ දී එම සැකකරු අත් අඩංගුවට ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම් වලින් සොයාගෙන ඇති අන්දමට ඊට වසර දහයකට පෙර මෙම සැකකරු අරාබි පාසලක උගන්වා තිබේ. 'බී' වාර්තාවේ දැක්වෙන්නේ සැකකරු 'සැකපිට ප්‍රශ්න කිරීම සඳහා' අත් අඩංගුවට ගත් බවකි.

(5) උතුරු මැද පළාතේ ජීවත් වූ 40 හැවිරිදි ගොවියෙකු සහරාන් වෙත (ත්‍රස්ත ප්‍රහාරය සැලසුම් කර සිදුකළ තැනැත්තා වශයෙන් හඳුනාගෙන ඇති පුද්ගලයා) රුපියල් බිලියනයක මුදල් පැවරීමක් සිදු කිරීමට සම්බන්ධ වූයේ යැයි චෝදනා පිට අත් අඩංගුවට ගෙන තිබේ. ප්‍රශ්නවලට ඔහු ස්වේච්ඡාවෙන් පිළිතුරු දී ඇති අතර පොලීසිය සැලකිලිමත් වූ සියලුම කරුණු පිළිබඳව ඔහු පොලිසියට ප්‍රකාශ ලබා දී තිබේ. ඒ කිසිවක දී එවැනි ගනුදෙනුවක් සඳහා ඔහුගේ කිසිදු සම්බන්ධයක් තිබෙන බවක් සඳහන් වී නැත. ඔහු අත්අඩංගුවට ගත් පසුව ඔහු ත්‍රස්තවාදීන් සමගින් ගනුදෙනු කරඇති බව කියමින් ඔහුගේ මුහුණේ ඡායාරූපයක් ජාතික පුවත්පතක පළ වී තිබේ. තමන්ට කිසිදු බැංකු ගිනුමක් නොමැති බවත්, තමන් කිසිදක සහරාන් හමු වී හෝ ඔහු සමගග ගනුදෙනු කර නොමැති බවත් සැකකරු පවසයි. ගොවියෙකු වන ඔහු තම බිරිඳ, දරු තිදෙනා සහ වයස්ගත නැන්දණිය හා මාමණ්ඩිය රක්ෂා කරගෙන ජීවත් වූ අයෙකි. ඇප මත මුදාහැරීමට පෙර ඔහු මාස 7 ක් රඳවා තබා ගෙන ඇත. ඔහුට විරුද්ධව චෝදනා එල්ල කිරීමට හේතු වූ ගනුදෙනුවට අදාළ කිසිදු තොරතුරක් හෝ බැංකු වාර්තා පිළිබඳව ඔහු වෙත හෙළිදරව් කර නැත. 'බී' වාර්තාවෙන් හෙළිදරව් කර ඇති අන්දමට, එකම සැකකරු ඔහු වන නඩුවක් මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇතත්, පසුව ඔහුගේ නම සැකකරුවන් දහ දෙනෙකුගේ නම් අතරින් එකක් වන වෙනත් නඩුවකට ඔහුව මාරු කර තිබේ. එම නඩුවේ විමර්ශන ප්‍රධාන වශයෙන්ම එහි පළමු සැකකරුවන් දෙදෙනා සම්බන්ධයෙන් සිදු කෙරෙන අතර, ඒ අය සමග මෙම සැකකරුවාට කිසිදු සම්බන්ධයක් නොමැත.

(6) හිජාස් හිස්බුල්ලා සම්බන්ධයෙන් වූ සුප්‍රකට සහ සංකේතාත්මක වූ නඩුවේ දී, මෙම 39 හැවිරිදි නීතිවේදියාට එරෙහිව රැඳවුම් නියෝගය ලබා ගෙන තිබුණේ ඔහු 'පාස්කු ඉරිද බෝම්බකරුවන්ට 'ආධාර සහ අනුබලදීම' සම්බන්ධයෙන් සහ 'ප්‍රජාවන් අතරේ ආගමික සහයෝගීතාවයට හානිකර අන්දමේ' යැයි සැලකෙන ක්‍රියාකාරකම්වල නිරතවීම සම්බන්ධයෙන් වූ චෝදනා විමර්ශනය කරන බව' හේතු වශයෙන් දක්වමිනි. මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාව වනවිටත් මේ සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි කිසිවක් අධිකරණය ඉදිරියට පමුණුවා නොමැත. ඒ වෙනුවට, මාධ්‍ය හරහා ද එල්ල කරන ලද චෝදනා අතරට ළමුන්ට 'අන්තවාදී' අදහස් ඉගැන්වූ පාසලකට වූ වක්‍රාකාර සමබන්ධතාවයක් සහ යුසුෆ් මොහොමඩ් ඊබ්‍රහීම් නැමැති ව්‍යාපාරිකයා සමගින් වූ සම්බන්ධතාවයක් ඇතුළත් වේ. පාස්කු ඉරිද බෝම්බ ප්‍රහාර සිදුකළ හත්දෙනා අතරින් දෙදෙනෙකු වන ඉන්ෂාෆ් සහ ඉල්හාම් යන අය මෙකී ව්‍යාපාර හිමියාගේ පුතුන් වේ. හිස්බුල්ලා, මෙකී ඊබ්‍රහිම් ගේ නීතිඥයා විය.[124]

(7) මන්නාරම ප්‍රදේශයේ කවියෙකු වූ මන්නාරමුදු අහ්නාෆ් ජසීම් නැමැති 25 හැවිරිදි පුද්ගලයා සම්බන්ධ සිදුවීම මාධ්‍යවල වාර්තා කර තිබූ තවත් සිදුවීමකිශ්‍රී 2020 මැයි 16 වැනි දින ඔහු අත් අඩංගුවට ගත් අතර අන්තවාදය සහ ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කිරීම ඔහුට විරුද්ධව ඇති චෝදනා බව වාර්තා වී තිබුණි. 2017 ජූලි මාසයේ දී අහ්නාෆ් විසින් දෙමළ භාෂාවෙන් ලියා ප්‍රකාශනයට පත් කළ 'නවරාසම්' නැමැති කවි එකතුව ඔහුව අත් අඩංගුවට ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා යොදාගෙන ඇත්තේ යැයි අහ්නාෆ් ගේ පවුලේ අය විශ්වාස කරති. අත් අඩංගුවට ගැනීමෙන් මාස හතක් ගත වී ඇතත්, ඔහුව අත් අඩංගුවට ගත් හේතුව

124 "Why Sri Lanka jailed a Muslim lawyer for 6 months" [Al Jazeera dated 15th October 2020] https://www.aljazeera.com/news/2020/10/15/sri-lanka-muslim-lawyer

පැහැදිලි කිරීමට හෝ තහවුරු කිරීමට හේතුවන අන්දමින් විමර්ශන සිදු නොකෙරෙන අතර අහ්නාෆ් තවදුරටත් රැඳවුම් භාරයේ පසු වෙයි.

(8) එසේ ම, සැකකරුවන්ගේ පවුල්වල කාන්තා සාමාජිකාවන්, මවුවරුන්, බිරින්දෑවරුන් හා සහෝදරියන් අත් අඩංගුවට ගත් අවස්ථා ද තිබුණි. ඒ අයට විරුද්ධව ඇති කිසිදු සාක්ෂියක් පිළිබඳව පවුලේ අයට දැනුම් දී නොමැති ඒ අනුව ඔවුන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් එළඹිය හැකි එකම නිගමනය පවුලේ ඥාතීත්වය මත එය සිදුකර ඇති බවයි. ඇතැම් අවස්ථාවල මෙම කාන්තා රැඳවියන්ගේ රැකවරණය අවශ්‍ය ළදරුවන් ද සිරභාරයට ගෙන තිබේ.

මෙම සිද්ධි අධ්‍යයන හතෙන් පෙන්නුම් කෙරෙන්නේ අදාළ පුද්ගලයින්ට එරෙහිව එල්ල කළ චෝදනා සම්බන්ධයෙන් විස්තර නොමැතිකමයි. අදාළ ද්‍රව්‍යය සී4 වේ ද නැතිද, වට්ස්ඇප් පණිවුඩය සාපරාධී හැසිරීමක් වන්නේ ද නැති ද, චෝදනා කළ ආකාරයට එම මුදල් ප්‍රමාණවලින් ගනුදෙනු සිදු වී ඇති බවක් සැකකරුගේ බැංකු ගිනුමෙන් පෙන්නුම් කෙරෙන්නේ ද නැති ද යන වග ප්‍රමාදයකින් තොරව තහවුරු කරගත හැකිවූ තැන්හි, අසාධාරණ රඳවා තැබීමක් විය හැකි රඳවා තැබීමකින් ඇතිවන හානිවල බලපෑම අඩුකර ගැනීමට පියවර ගෙන නොතිබුණු බව ද ඒවායින් පෙන්නුම් කරයි. අසාධාරණ ලෙස අත් අඩංගුවට ගැනීමෙහි ප්‍රතිවිපාක හා බලපෑම් පිළිබඳ නොතැකීමක් පිළිබඳව ඉන් හැඟවෙයි.

ඉහත 3 වැනි සිද්ධි අධ්‍යයනයේ සැකකරුවා රඳවා තබනුයේ රැඳවුම් නියෝගයක් (පරිපාලන රඳවා තැබීමක්) පදනම් කරගෙන වේ. එනම්, වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් පරිපාලන රඳවා තැබීමක් අවශ්‍ය බව අමාත්‍යවරයාගේ මතය වී තිබේ. කෙසේ නමුත්, ඔහුව රඳවා තැබුයේ ඔහු විසින් සිදු කරන ලද ක්‍රියාවක් හේතුවෙන් ද, නැතහොත් ඉදිරියේදී සිදුකරනු ඇති ක්‍රියාවක් හේතුවෙන් ද යන්න පිළිබඳ පැහැදිලිතාවයක් නොමැති බව පෙනී යයි. ඔහු අත් අඩංගුවේ පසුවන අතර ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී ෆේස්බුක් පළ කිරමක් (පෝස්ට් එකක්) පිළිබඳව විමසන අතර ඔහු වෙනුවෙන් ආ නීතිවේදීන්ට ද 2014 වර්ෂයේ දී සිදු කළ ෆේස්බුක් පළ කිරීමක් පිළිබඳව දැනුම් දී තිබේ. එකී පළ කිරීම සාපරාධී ක්‍රියාවක් වූයේ නම්, 2014 හෝ ඒ ආසන්න කාලයකදී ඔහුට විරුද්ධව චෝදනා කරන්නට තිබුණේ යැයි අනුමාන කළ හැකිය. කෙසේ නමුත්, හේතුවක් ලබා නොදුන් රැඳවුම් නියෝගයක් යටතේ ඔහුව රඳවා තබා ගැනීමෙන් පසු ඔහු පිළිබඳ විමර්ශනය කළ පොලීසියට අත් අඩංගුවට ගැනීම සඳහා හේතු වශයෙන් දැක් විය හැකිව ඇත්තේ මෙකී ෆේස්බුක් පළ කිරීමයි.

ඒ හා සමානව අහ්නාෆ් ගේ සිදුවීමේ දී ද, 2017 වර්ෂයේ දී පළකළ කවි පොතක් පමණක් අත් අඩංගුවට ගැනීම හා රඳවා තැබීමට හේතුව විය නොහැකි අතර, සැකකරු අන්තවාදය හා ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ වී ඇත්ද, එම දින, වේලාවන් සහ ඊට සම්බන්ධ වූ පාඨකයින් කවුරුන්ද යන්න චෝදනා හරහා පැහැදිලි කළ යුතු වේ. චෝදනා සම්බන්ධයෙන් පවුලේ අයට පවා ඇත්තේ නොපැහැදිලිතාවයක් වීම ඔහුගේ විත්තිය වෙනුවෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට පවුලේ අයට ඇති හැකියාවට බරපතළ අන්දමේ අගතියක් ඇති කරයි.

නීතිය හා සමාජ භාරය විසින් සම්පාදනය කර ඇති 'PTA: Terrorising Sri Lanka for 42 years' නැමති වාර්තව මගින් හෙළි කර ඇති අන්දමට, නුවරඑළියේ දී නැෂනල් තවුහීද් ජමාත් සංවිධානය පැවැත්වූ බයාන් නොහොත් දේශනයකට සහභාගිවීම හේතුවෙන් තම පවුලේ සාමාජිකයෙකු අත් අඩංගුවට ගන්නා ලද බව පවුල් කිහිපයකට ම දැනුම් දී තිබේ.[125] චෝදනාවේ නොපැහැදිලි බව සහ දේශනාවකට සහභාගිවීමේදී එයට සම්බන්ධ වූයේ කුමන අපරාධ අංගය ද (ක්‍රියාව හෝ චේතනාව) යන්න පිළිබිඳ පැහැදිලිතාවයක් නොතිබීම මෙම පවුල්වලට දැනෙන අසාධාරණ බව හා අයුක්තිය පිළිබඳ හැඟීමට සැලකිය යුතු ලෙසින් දායකත්වයක් ලබා දෙයි. නැෂනල් තවුහීද් ජමාත් සංවිධානය විසින් කළමනාකරණය කරන ලද පුණ්‍ය සංවිධානයක් සඳහා 2015 දී වෙබ් අඩවියක් නිර්මාණය කර දීම සම්බන්ධයෙන් වසර 20

[125] Marisa de Silva, PTA: Terrorising Sri Lanka for 42 years, Law and Society Trust, November 2020.

තිස්සේ පරිගණක ගුරුවරයකු වශයෙන් කටයුතු කළ අයෙකු අත් අඩංගුවට ගෙන ඇති සිදුවීමක් ද මෙම වාර්තාවේ අවධානයට යොමු කොට තිබේ.[126]

## (ඈ) විමර්ශන අවසන් කිරීමට බාධා වන අන්දමින් බහුවිධ නඩු පැවරීම

උතුරු මැද පළාතේ එක් නඩුවක දී, එම සැකකරුවා මුලින් ම අත් අඩංගුවට ගන්නා අවස්ථාවේ දී ඔහුට එරෙහිව වූ සහරාන් වෙත මුදල් යැවුවේ ය යන චෝදනාව සම්බන්ධ නඩුවේ එකම සැකකරු වශයෙන් ඔහුගේ නම සඳහන් වී තිබුණි. අත් අඩංගුවට ගෙන නඩු පවරා මාසයක් ගත වූ පසු එම සැකකරු වෙනත් නඩුවක් යටතේ සැකකරුවකු බවට මාරු කර තිබේ. ඔහු සැකකරුවන් දහ දෙනෙකු අතරින් එක් අයෙක් බවට පත්වන අතර, මෙම නව නඩුවේ උසාවි දින නියම වී ඇත්තේ එහි ප්‍රධාන සැකකරු සම්බන්ධයෙන් පමණි. මෙහිදී පෙනී යන අන්දමට මෙම නව නඩුව ප්‍රධාන වශයෙන්ම එක් පුද්ගලයකුට එරෙහිව ඇති බවත් ඒ පුද්ගලයාට එරෙහිව සාක්ෂි වශයෙන් යම් කරුණු ඉදිරිපත් කර ඇති බවත් පෙනෙන්නට තිබීම සැලකිල්ලට ගතයුතු යී එම නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන අතරතුර මෙම සැකකරුට එරෙහිව සාක්ෂි වශයෙන් විමර්ශන හෝ තොරතුරු ඉදිරිපත් කරන්නට පියවර ගෙන නොමැති බව පෙනේ. විමර්ශන සිදුකිරීමකින් හා ඔහුට එරෙහිව ඇති චෝදනා නිශ්චිත වශයෙන් නිර්ණය කිරීමකින් තොරව සැකකරු රැඳවුම් භාරයේ තබාගැනීමට සිතාමතාම ගත් පියවරක් ලෙස මෙම ක්‍රියාපටිපාටිය දැකිය හැකි ය.

නැෂනල් තවුහීද් ජමාත් සංවිධානයෙන් පවත්වාගෙන ගිය පුණ්‍යායතනයක් සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනුණු පරිගණක ගුරුවරයාගේ සිදුවීමේ දී, ඔහු නැගෙනහිර පළාතේ නඩුවක සැකකරුවන් 65 දෙනෙක් අතරින් එක් අයෙක් වශයෙන් නම් කර තිබේ. එහි අදහස නම්, ඔහුට විරුද්ධව ඇති යම් නිශ්චිත චෝදනා සම්බන්ධයෙන් කළ විමර්ශන අධිකරණයට ඉදිරිපත් කර නොමැති බවත් වෙනත් කිහිප දෙනෙකුට එරෙහිව ඇති චෝදනා එම නඩුවේ දී ප්‍රමුඛත්වය ගෙන ඇති බවත් ය. ඔහුට හා තවත් කිහිප දෙනෙකුට එරෙහිව එල්ල කර ඇති චෝදනා අතරේ පැහැදිලිව පෙනෙන සම්බන්ධයක් නොමැති බව ඔහුගේ පවුලේ ද අදහසයි. මෙම තත්වය තුළ ඔහුට අදළ වන කරුණු කෙරෙහි පැමිණිලි පක්ෂයේ අවධානය යොමුකර ඔහුව නිදහස් කිරීමට ඉඩ සලසා දිය හැකි පරිදි විමර්ශන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකරවා ගැනීම බෙහෙවින් දුෂ්කර වී තිබේ.[127]

## (ඇ) පවුල් වලින් දුරස්ථවීම

අතීතයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන් මුහුණ දුන් අත්දැකීම්වලට සමානව ම 2019 වර්ෂයේ දී රඳවා තැබූ පුද්ගලයින්ගේ පවුල්වල අය ද, එම රැඳවූවන් වෙත ප්‍රවේශවීමේදී දුෂ්කරතා අත්වින්දෝ ය. තමන් පදිංචි ප්‍රදේශයේ රැඳවුම් මධ්‍යස්ථානයක රඳවා සිටි රැඳවියන් වෙනත් පළාතකට, උදහරණ වශයෙන් මඩකලපුවේ සිට බදුල්ලට මාරු කළ අවස්ථා වැනි වූ අවස්ථා පවුල් විසින් විස්තර කරන ලදි. රැඳවියන් සහ පවුලේ අය අතරේ සම්බන්ධතාවය සම්පූර්ණයෙන් ම නැතිවී යාමට මෙය හේතු වී තිබේ. ගමනාගමනයට දැරිය යුතු වියදම සහ ගතවන කාලය බාධකයක් වූ බව ඇතැම්හු විස්තර කළහ.

වාර්තා වූ අත්දැකීම් අතරට පහත ඒවා ද ඇතුළත් වේ:

- සම්පූර්ණ දවසක් ම ගමනේ යෙදී අදළ ස්ථානයට ගිය විට රැඳවියා සමගින් කථා කරන්නට ලැබී ඇත්තේ මිනිත්තු විස්සකටත් අඩු කාලයකි.[128]

[126] එම, 10 පිටුව

[127] එම, 11 පිටුව

[128] එම, 4 පිටුව

- කථා කරන්නට ලැබුණේ මිනිත්තු පහක් පමණක් වූ අතර රැඳවියන් හා පවුලේ සාමාජිකයින් එකිනෙකාට බොහෝ දුරස්ථව තබා ඇති නිසා මහ හඬින් කෑගැසිය යුතු විය.[129]

- දරුවා පාසල් ගිය මුල් දිනයේ ගත් ඡායාරූපයක් පෙන්වූ විට අඩුම තරමින් එය අල්ලා බැලීමටවත් අවසර නොලැබුණි.[130]

- පුතුන් දෙදෙනා සහ වැඩිමල් පුතුගේ බිරිඳ විවිධ දිස්ත්‍රික්ක තුනක (කෑගල්ල, කොළඹ සහ ත්‍රිකුණාමලය) රඳවා ඇත. ඔවුන් බලන්නට යාමට වියදම් කරන්නට සිදුව ඇති මුදලත් සමගින් අනෙක් දරුවන් දෙදෙනාගේ වැඩකටයුතු කරගැනීම දුෂ්කර වී තිබේ. ඉන් එක් දරුවකු ශාරීරික වශයෙන් ආබාධිත ය.[131]

- 16 හැවිරිදි අයෙකුගේ මවට තමන්ගේ එම පුතා බැලීමට අවසර ලබාදීම ප්‍රතික්ෂේප කර තිබේ.[132]

- කිලෝමීටර 55 ක් දුරක් ගෙවා සිය සැමියා බැලීමට ගිය ඇයට සැමියා සමගින් කථා කිරීමට ලැබී ඇත්තේ මිනිත්තු 5 ක් පමණක් වන අතර දැල් සහිත තිරයකින් ඔබ්බෙහි සිට කථාකරන්නට ලැබුනත් ශාරීරිකව දරුවන් අසළට ඒමට ඔහුට අවස්ථාව ලැබී නැත.[133]

ඉහත විස්තර කළ අත්දැකීම් සහ ප්‍රවේශයේ ස්වභාවය පහසුකම් අඩුවීමකට වඩා දඬුවමක් වශයෙන් විස්තර කළ හැකිය. විශේෂයෙන්ම රැඳවියන්ගේ දරුවන් සහ කලත්‍රයන් සමගින් අර්ථවත් අන්දමින් හමුවීමට සහ සම්බන්ධ වීමට නිසි කටයුතු සංවිධානය කිරීමට බලධාරීන් අපොහොසත් වී තිබේ. මේ පුද්ගලයින් තමන්ට එරෙහිව නිශ්චිත චෝදනා ගොනුකිරීමකට පවා ලක් නොවූ සැකකරුවන් වීම ඔවුන්ගේ ගරුත්වයට උචිත පරිද්දෙන් සැලකිලි ලබාදීමට හේතු වන කරුණක් විය යුතු වේ.

## (ඉ) වධහිංසා

පවතින අධිකරණ කාර්ය පටිපාටිය තුළ වධහිංසා හෝ පීඩා කිරීම් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරු ඉදිරියේ නිල වශයෙන් පැමිණිලි ඉදිරිපත් කර නොමැති මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාව වන විටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වධහිංසා සම්බන්ධයෙන් සිදු කරන ලද පැමිණිලි පිළිබඳව ලබා ගත හැකි තොරතුරු නොමැත. 2020 නොවැම්බර් මාසයේ දී, පොලිසිය වෙත ලබා දෙන ප්‍රකාශයන්හි වලංගුතාවය සහතික කරගැනීම පිණිස පියවර ගන්නා මෙන් ඉල්ලා පොලිස්පති වරයා වෙත යවන ලද ලිපියක, "පාපොච්චාරණය" සඳහා බල කිරීම සහ වධහිංසාව සිදුව තිබෙන්නට ඉඩ ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හඳුනාගෙන තිබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අතීතයේදී වධහිංසාව සහ පීඩා කිරීම සඳහා අනුබල දීමේ අත්දැකීම් සලකා බැලීමේදී වර්තමානයේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීම තුළ වධහිංසා සිදු කළ අවස්ථාවන් තිබීමට ඇති ඉඩකඩ තිබිය හැකි බව නිරීක්ෂණය කරන අතර එවැනි උල්ලංඝන වාර්තා කිරීම සඳහා ඉදිරියට පැමිණීමට තමන් සුරක්ෂිත යැයි වින්දිතයන්ට හා පවුල්වලට හැඟෙන අන්දමේ තත්ත්වයන් නිර්මාණය කළ යුතුව තිබේ. වර්තමානයේදී එවැනි සුරක්ෂිත තත්ත්වයන් පවතින බවක් නොපෙනෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ විසි වැනි සංශෝධනයත් සමග ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ද බලපෑමට ලක්ව ඇති අතර වින්දිතයින් සහ ක්‍රියාධරයින් අතර තව තවත් සැලකිල්ලට යොමු කළ යුතු කරුණු නිර්මාණය කිරීමට මෙය හේතු වී තිබේ. රැඳවියන්ගේ පවුල් සමග සිදු කළ පෞද්ගලික සන්නිවේදන වලදී සිරභාරයේ සිටින අතර මුහුණ දුන් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්, විශේෂයෙන් ම අත්අඩංගුවට ගත්

---

[129] එම, 6 පිටුව

[130] එම, 7 පිටුව

[131] එම, 9 පිටුව

[132] එම, 13 පිටුව

[133] එම, 14 පිටුව

වහාම සහ රැඳවුම් භාරයේ සිටින අතරතුර ඇති වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් රහස්‍ය ලෙස හෙළිදරව් කළ අවස්ථා කිහිපයක් විය.

### (ඊ) අත්අඩංගුවට ගැනීම් අධිකරණයේ අධීක්ෂණයට නතු කිරීම

ප්‍රහාර සිදු වූවායින් පසු අත්‍යාසන්න මාස වලදී රටේ විවිධ ප්‍රදේශ වල මහේස්ත්‍රාත්වරුන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමේ හා රඳවා තැබීමේ නඩු අධීක්ෂණය කරන්නට සිදු විය. මේ සම්බන්ධයෙන් පවතින තොරතුරු වලට අනුව, මේ අන්දමින් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අධිකරණමය මාර්ගෝපදේශ නිකුත් කර නො තිබුණි. මෙම නඩු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරුන් විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වා තිබෙනු දක්නට තිබුණි. ඉතා සමීප අධීක්ෂණයක් සිදු කළ මහේස්ත්‍රාත්වරුන් සැකකරුවන්ට එරෙහිව ඇති, විශ්වාසනීය වූ හෝ අවම වශයෙන් නිශ්චිත වූ චෝදනා දැනුම්දෙන මෙන් තරයේ ප්‍රකාශ කළ අතර තවත් මහේස්ත්‍රාත්වරු සියලුම පාර්ශවයන්ට සවන්දී මෙම අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාට බලතල නොමැති බව සැකකරුවන් වෙත දැනුම් දෙන ලදී. මෙම නඩු සඳහා පෙනී සිටි ඇතැම් නීතීඥවරුන් දුටු අන්දමට මුල් අවස්ථාවේදී වඩාත් තද අධීක්ෂක ප්‍රවේශයක් යොදා ගත් මහේස්ත්‍රාත්වරුන් පසුව ඒ සඳහා පසුබටව වූ බවක් පෙනී තිබේ. සිදු කරන ලද තවත් නිරීක්ෂණයක් වූයේ සැකකරුවන් කැටුව ආ සන්නද්ධ ආරක්ෂක නිලධාරීන් අධිකරණ පරිශ්‍රයේ ගැවසීම තුළින් ද තැතගන්වනසුළු පසුබිමක් නිර්මාණය වූ බවයි.

බස්නාහිර පළාතේ එක්තරා නඩුවකදී ඊට අදාළ රැඳවුම් නියෝගය මාසයකට පෙර ලබා ගත් බවක් පොලිසියෙන් කියා සිටිය ද එය ඉදිරිපත් කිරීමට පොලිසිය අපොහොසත් වී ඇති අතර, එම නියෝගය අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ට කාලය ලබාදුන්න ද එය ඉදිරිපත් කිරීමට පොලිසිය අපොහොසත් වී තිබේ. සැකකරු රඳවා තබා ගැනීම සඳහා නීතිමය පදනමක් නොතිබුණ ද සැකකරු මුදාහැරීමට හෝ නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා විසින් නියෝගයක් ලබා දී නොමැත.

ඇප ලබාදීම සම්බන්ධයෙන් තීන්දුවක් දීම ප්‍රමාද වීමට එක් හේතුවක් වූයේ අදාළ සැකකරුවාගේ ලිපිගො ානුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැමිණිලි පාර්ශවය වෙත ලැබී නොතිබීම බව නිරීක්ෂණය විය. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් නොමැතිව නඩුව සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දීමට අධිකරණයට බලය නොතිබූ බැවින් මෙම නඩු නාමික වශයෙන් නැවත වරක් දින නියම කර කැඳවීම පමණක් සිදු වනු ලැබේ. රැඳවියන්ගේ පවුල් වලට මෙම නඩු සම්බන්ධයෙන් කීමට ඇති දෑ සඳහා සවන් දෙනු ලබන බව සහතික කරගත හැකි විනිවිදභාවයෙන් යුතු මහජන විනිශ්චය ශාලාව වන්නේ මහේස්ත්‍රාත් අධිකරණය වන බැවින් මෙම තත්ත්වය ඉතාමත් බලාපොරොත්තු සුන්කරවනසුළු අත්දැකීමක් වන අතර එමගින් එම පවුල් මත සෑහෙන මූල්‍යමය සහ කාර්ය සංවිධානමය පිරිවැයක් ද පටවනු ලබයි. තමන්ගේ පවුලේ සාමාජිකයාගේ නඩුව සම්බන්ධයෙන් කුමන දිනයක ප්‍රගතියක් අත්වේදැයි නොදන්නා බැවින් නියම කරන සෑම නඩු දිනයක් පාසාම නීති නියෝජන ලබා ගැනීමට කටයුතු කිරීමට ඔවුන්ට සිදුවී තිබේ.

### (උ) නීතිපතිවරයා වෙත නියෝජනයන් සිදු කිරීම

අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීම සඳහා නීතිමය පදනමක් නොමැති බව පෙන්නුම් කරන කරුණු ද ඇතුළුව රඳවා තැබීමේ නිත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් අදාළ වන ඕනෑම තොරතුරක් නීතිපතිවරයාගේ අවධානය වෙත ගෙන ඒම සඳහා තමන්ගේ නීතිවේදියා මගින් කටයුතු කිරීම රැඳවියන්ට ඇති එක් නීති නියෝජනයක් වන්නේ යි නීතිපතිවරයා යනු රටේ ප්‍රධාන නඩු පැවරීමේ නිලධාරියා වන අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇප ලබාදීම සඳහා කැමැත්ත පළකිරීමේ බලය ප්‍රකාශිතව ම පැවරී ඇත්තේ නීතිපතිවරයා වෙත ය.

මෙම අධ්‍යයනය සඳහා නිරීක්ෂණය කළ නඩු කිහිපයක ම අදාළ සැකකරුවන් සම්බන්ධයෙන් නීතිපතිවරයා වෙත නියෝජන ඉදිරිපත් කර තිබුණි. විශ්වසනීය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම සහ දීර්ඝ

කාලයක් තිස්සේ රඳවා තැබීමේ අන්තරාය පිළිබඳව ඉන් ඇතැම් නියෝජන වලින් නීතිපතිවරයාගේ කඩිනම් අවධානය යොමු කරවා තිබේ.

මේ අන්දමින් නියෝජනයක් සිදු කර, ඇතැම්විටක එම දෙපාර්තමේන්තුවේ අදාළ ලිපිගොනුව භාරව සිටින නිලධාරියා සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූ පසුව එම නියෝජන සමාලෝචනය කර ඒවාට පිළිතුරු සපයනු ලැබේ බොහෝ විට මෙම නඩු වලදී සිදුවන්නේ ඇප ලබාදීම සඳහා එකඟවීමට හෝ සැකකරු නිදහස් කිරීමට හැකි වේ ද නැති නම් නොහැකි වේ ද යන්න තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු තිබෙන්නේ දැයි නීතිපතිවරයා විසින් තීරණය කිරීමයි.

සමාලෝචනය කළ නඩු වෙනුවෙන් නියෝජන ඉදිරිපත් කළ ඇතැම් නීතිවේදීන්ගේ අත්දැකීම අනුව, ඔවුන් විසින් ලිඛිතව ඉදිරිපත් කළ නියෝජනය සම්බන්ධයෙන් ගත් තීරණය සම්බන්ධයෙන් ඔවුන්ට ලිඛිත ප්‍රතිචාරයක් ලැබී නොමැත. ඇතැම් අවස්ථා වලදී, ඇප ලබා දීම සඳහා එකඟත්වය පළ කරන බව වාචිකව නීතිවේදීන් වෙත දැනුම් දී තිබේ.

2020 ජුනි මාසයේ පමණ, එනම්, පාස්කු ප්‍රහාරවලින් පසුව සිදු කළ අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් සම්බන්ධයෙන් වූ ලිපිගොනු භාරව තිබූ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයාගේ සිට තවත් ජ්‍යෙෂ්ඨ සොලිසිටර් ජෙනරාල්වරයකු වෙත එම ලිපිගොනු මාරු වී ඇති බවක් පෙනෙන්නට තිබේ. එවැනි මාරුකිරීමක් පිළිබඳව ලිඛිත දැනුම් දීමක් සිදුකර නොමැත. දෙපාර්තමේන්තුවෙන් වාචිකව ඒ බව විමසා එය නිශ්චිතව දැනගන්නට සිදුව තිබේ. එක්තරා නීතිඥයකු පැවසූ අන්දමට 'මම අලුතින් ඒ ලිපිගොනු භාර වූ නිලධාරිනිය එක්ක කථාකරලා බැලුවාම, කලින් නිලධාරියා වෙත අපි ඉදිරිපත් කළ නියෝජන කිසිවක් ගැන ඇය දැනුවත්ව සිටියේ නැහැ. තමන්ට ලිපිගොනු නොලැබුණු බව ඇය පැවසුවා. මට අලුතින් ම ඒ සියලු නියෝජන නැවත ඉදිරිපත් කරන්නට සිද්ධ වුණා' දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක් එක් ගොනුවට අදාළව සටහන් ඇතුළත් කිරීමක් හෝ ගනු ලැබූ සියලුම ක්‍රියාමාර්ග සටහන් තැබීමක් සිදු කරන බව කවුරුත් දන්නා ව්‍යවහාරයකී එබැවින් නීතිවේදීන් විසින් බහුවිධ, නැතහොත් නැවත නැවතත් නියෝජන සිදුකිරීමක් අවශ්‍ය නොවිය යුතු ය. මේ අවස්ථාවේදී තීරණයක් ගැනීමට නොහැකි බව හෝ, ඇප ලබාදීමට එකඟවන බව හෝ, ඇප ලබාදීමට එකඟ නොවීමට තීරණය කළ බව හෝ වේවා, අදාළ සැකකරු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගත් තීරණය පැහැදිලිව සහ විධිමත් වශයෙන් රැඳවියන්ගේ පවුල් වෙත සන්නිවේදනය කළ යුතුව තිබේ. වාචික සන්නිවේදන තුළ ඒ අන්දමින් පැහැදිලිතාවයක් නොමැතිවීම සහ නිශ්චිතභාවයක් නොමැතිවීම තුළ සැකකරු අහිතකර තත්වයන් යටතේ තවත් දීර්ඝ කාලයක් රැඳවුම් භාරයේ තබාගනීවි දෝ ය යන බිය පෝෂණය කරනු ලබයි.

ලිපිගොනුවල භාරකාරීත්වය මාරු වූ පසුව තමන්ගේ නියෝජනය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාවක් ඉල්ලා සිටිවිට එය ප්‍රතික්ෂේප වූ බව නීතිවේදීහු තිදෙනෙක් ප්‍රකාශ කළහ.

අත්තනෝමතික හෝ නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම් හෝ රඳවා තැබීම් සිදුවීමට ඇති ඉඩකඩ වැඩි බැවින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබා දෙමින් නොපමාව තීරණ ගැනීමට නීතිපතිවරයා විසින් කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් ද පවතියි. නීතිය මගින් සියලුම පුරවැසියන් එක හා සමානව ආරක්ෂා කරන බව සහතික කරගැනීමේ දී නීතිපතිවරයාගේ භූමිකාව අතිශයින් වැදගත් වේ. නිර්දෝෂී භාවයේ පූර්වනිගමනය සහ එය ක්‍රියාත්මක වන අන්දම පිළිබඳව ද එම කාර්යාලයට ඉතාමත් හොඳ අවබෝධයක් තිබේ. එම කාර්යාලයේ භූමිකාව සංක්ෂිප්තව මෙසේ විස්තර කර ඇත: 'නීතිපතිවරයා වශයෙන් පූර්ණ ලෙස මධ්‍යස්ථ වීමටත්, පූර්ණ ලෙස ස්වාධීන වීමටත් සහ සත්‍ය තහවුරු කිරීමේ පරම අභිප්‍රායයෙන් අපක්ෂපාති ලෙස කටයුතු කිරීමටත් ඔහුට අධිකරණය වෙත, රජය වෙත සහ රටවැසියන් වෙත ඉටු කළ යුතු වගකීමක් තිබේ.'[134]

[134] ඉඩම් ප්‍රතිසංස්කරණ කොමසාරිස් එදිරිව ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ලිමිටඩ් [1981] 1 SLR at 250.

## (ඌ) රැඳවියන්ගේ පවුල් මත ඇති කෙරෙන සමාජ-ආර්ථික බලපෑම

තම පවුලේ ආදායම් උපයන්නා අත් අඩංගුවට ගැනීම හේතුවෙන් තමන් ආර්ථික දුෂ්කරතා වලට මුහුණ දුන් බව සියලුම පවුල් ප්‍රකාශ කළ බැව් PTA: Terrorising Sri Lanka for 42 years යන නමින් නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත් කළ වාර්තාවේ හෙළිදරව් කර ඇත. රඳවා තැබීම හේතුවෙන් ණය ගැති තත්වයට පත් වූ අන්දම පිළිබඳව එම පවුල් සඳහන් කර ඇත.[135] එසේම, රැඳවුම් භාරයේ සිටින තම පවුලේ සාමාජිකයා බැලීමට යාමටත් ඔවුන් වෙනුවෙන් නීති නියෝජන ලබා ගැනීමටත් මුදල් සොයා ගැනීම ඔවුන්ට දුෂ්කර වී තිබේ. ඔවුන්ගෙන් මුදල් ලබාගෙන රැඳවියා වෙනුවෙන් පෙනී නොසිට එම මුදල් ආපසු ලබා දීමෙන් ද වැළකී සිටි ඇතැම් නීතිවේදීන් හේතුවෙන් රැවටීමට පත් වූ අත්දැකීම් ද ඇතැමුන්ට තිබේ.[136]

මෙම පවුල්වලට විඳින්නට සිදුව ඇති විවිධ ආතතීන් සඳහා උදාහරණ එම වාර්තාවේ සඳහන් වේ. කලින් තම සැමියා විසින් තමන්ගේ සහ දරුවන් තිදෙනාගේ යැපීම වෙනුවෙන් ආදායම් උපයන ලද නමුත් දැන් තමන්ට සැමියාගේ මවුපියන් මත යැපීමට සිදුව ඇති අන්දම පිළිබඳව එක් කාන්තාවක් පැවසුවා ය.[137] එක්තරා භාර්යාවක් පෞද්ගලික පන්ති පැවැත්වීමෙන් ආදායම් උපයා තිබේ. එහෙත් ඇගේ සැමියා අත් අඩංගුවට පත්වීමෙන් සහ දරුවා උපතේ දී ම මියයෑමෙන් පසුව ඇයට තවදුරටත් පෞද්ගලික පන්ති පැවැත්වීම සඳහා සුදුසු චිත්තවේගීය හෝ ශාරීරික හැකියාවක් නොමැති වී තිබේ. එසේම ඇයට සැමියා බලන්නට යාම, ඔහුගේ නඩුවට අදාළ කටයුතු සොයා බැලීම මෙන්ම ඔවුන්ගේ දරුවන් රැකබලා ගැනීම යන වගකීම් ද පැවරී තිබේ.[138] තවත් උදාහරණයක, එම බිරිඳ මුදල් උපයාගෙන ඇත්තේ තමන් මසන නිමි ඇඳුම් සැමියා මාර්ගයෙන් බෙදාහැර අළෙවි කිරීමෙනි. එය අහිමි වී ගිය පසු ඇයට නිවසේ තිබූ බඩු බාහිරාදිය සහ තම පෞද්ගලික භාණ්ඩ ද අළෙවි කර ජීවත්වීමට සිදුව තිබේ.[139]

තමන්ගේ පියා කොහිදැයි දරුවන් විමසන කල තමන්ට දැනෙන අසරණභාවය පිළිබඳව කාන්තාවෝ පවසා තිබේ.[140] එසේම රැඳවියන් ගේ දරුවන් ගේ අධ්‍යාපනයට ද බාධා පැමිණ තිබේ. නීතිය හා සමාජ භාරය විසින් පළකරන ලද PTA Social Impact Report 2020 නැමති වාර්තාවේ සඳහන් කර ඇති පරිදි කැප්පෙටිපොළ පරිවාස මධ්‍යස්ථානයේ රඳවා තබන ලද දහසය හැවිරිදි බාලවයස්කාර රැඳවියකුට අපොස සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත්වීම සඳහා පහසුකම් ලබා දී නොමැත.[141] තමන්ගේ දියණිවරුන් ඉගනීමට දක්ෂ බව පැවසූ මවුවරුන් දෙදෙනෙක් පවසා සිටියේ පියා අත් අඩංගුවට පත්වීමෙන් පසුව එම දියණියන්ට පාඩම් කිරීමට හෝ පන්ති යාමට නොහැකි වී තිබෙන බවකි.[142]

සැබැවින්ම සැලකිල්ලට යොමු කළ යුතු කරුණු වශයෙන් සඳහන් කරනු ලැබූ මෙම කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින්, පරිපාලකයින් සහ අධිකරණ ක්ෂේත්‍රය විසින් ප්‍රතිචාර දැක්වීම වැදගත් වේ.

---

135 Marisa de Silva, PTA: Terrorising Sri Lanka for 42 years, Law and Society Trust, November 2020, at page 17.

136 එම, 6 පිටුව

137 එම, 5 පිටුව

138 එම, 6 පිටුව

139 එම, 7 පිටුව

140 එම, 14 පිටුව

141 එම, 12 පිටුව

142 එම, 14 පිටුව

## (එ) සැකකරුවන්ගේ පවුල් සමාජයේ හුදකලාවීම

රැඳවියන් ගේ පවුල් කොන්කරනු ලැබීමට සහ සමාජයේ අපකීර්තියට භාජනයවීමට ලක්ව තිබේ. නීතිය හා සමාජ භාරය විසින් පළ කරන ලද PTA: Terrorising Sri Lanka for 42 years වාර්තාවේ ඒ බව මෙසේ විස්තර කර ඇත:

- පියා සිරභාරයේ සිටින බව පාසලේ මිතුරන්ට නොකියන්නැයි මවක් විසින් තම පුතුට උපදෙස් දීම[143]
- කෘත්‍රිම මල් සෑදීමේ ව්‍යාපාරයක නිරත වී සිටි කාන්තාවක් තම සැමියා අත් අඩංගුවට පත්වීමෙන් පසු මිනිසුන් ඇය දෙස බලන්නේ වෙනස් අන්දමින් වන බැවින් නැවතත් එම ආදායම් මාර්ග යෙන් මුදල් උපයාගත හැකි වේයැයි බලාපොරොත්තු අත හැරීම[144]
- පියා 'ISIS' යැයි කියමින් දරුවෙකු පාසලේ දී අනෙක් අය විසින් තාඩන පීඩනවලට ලක් කරනු ලැබීම
- පියා අත් අඩංගුවට ගැනීමෙන් පසුව එම පවුලේ ළදරුවාගේ සුවදුක් පිළිබඳ සොයා බැලීම සඳහා පවුල් සෞඛ්‍ය සේවිකාව තවදුරටත් නොපැමිණීම[145]
- එක්තරා බිරිඳක් 'ISIS' යැයි හඳුනා ගැනීමකට ලක් කරමින් ඇය ඇනුම්පදවලට ලක්වීම සහ ඇයට ණය ලබා දීම ප්‍රතික්ෂේප වීම.[146]
- කලින් පෞද්ගලික පන්ති පැවැත්වූ තැනැත්තෙක් අත් අඩංගුවට පත්වී ඇප මත නිදහස් වූවායින් අනතුරුව ප්‍රජාවේ පවුල්වල දරුවන් ඉගෙනීම් සඳහා ඔහු වෙත එවන්නට පසුබට වීම[147]

අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම් හේතුවෙන් තවදුරටත් සහ දෙවන වරටත් වින්දිතයින් බවට පත්වීමක් සිදු නොවන බව සහතික කර ගැනීම සඳහා ප්‍රජා මට්ටමින් දැඩි සේ අවශ්‍ය කර තිබෙන අවධානය පිළිබඳව මෙම අත්දැකීම්වලින් අවධාරණය කෙරෙයි. මේ අන්දමින් සමාජයේ සහයෝගය අහිමි වී යාම මානසික වශයෙන් දැඩි පීඩනයක් ඇති කරවන අතර ඉන් ඇතිවිය හැකි අසරණභාවය හා හුදකලා බව පවුලේ සාමාජිකයින්ගේ ශුභසිද්ධිය මත බරපතළ බලපෑම් එල්ල කරයි. එමෙන්ම එය මෙම පවුලවලට තව තවත් හානි හා අහිමිකරවීම් ඇතිකරන්නා වූ ආරවුල් සඳහා ද මගපෑදිය හැකිය.

## (ඒ) කෝවිඩ්-19 පසුබිම තුළ දුෂ්කරතා සහ අවිනිශ්චිතතා උග්‍රවීම

දැනටමත් අධික තදබදයක් සහිත, පමණ ඉක්මවන තරමට පිරී ඇති බන්ධනාගාර තුළ කෝවිඩ්-19 රෝගය පැතිරයාම සම්බන්ධයෙන් ඇති වී තිබෙන බියත් සමගින්, සුළු වරද සඳහා ඇප ලබා දිය නොහැකිව සිරභාරයේ සිටින තැනැත්තන්ට සහන ලබා දීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් 2020 මාර්තු මාසයේ දී කමිටුවක් පත් කරන ලදී.[148] මේ සම්බන්ධයෙන් සාධාරණ හා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් අනුගමනය කරන මෙන් සහ විශේෂ අවදානම්පාත්‍රතා සහිත තැනැත්තන් නිදහස් කිරීම සඳහා සලකා බලන මෙන් සිවිල් අයිතිවාසිකම් ක්‍රියාධරයින් ජනාධිපතිවරයාගෙන් හා අධිකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටින ලදී.[149] 2020 අප්‍රේල් වන විට සිරකරුවන් 2,961 ක්

---

[143] එම, 7 පිටුව

[144] එම, 13 පිටුව

[145] එම, 16 පිටුව

[146] එම, 15 සහ 16 පිටු

[147] එම, 19 පිටුව

[148] 'President seeks relief for prisoners amidst fears of Covid-19 spreading to prisons' (Daily FT, 25 March 2020) <http://www.ft.lk/news/President-seeks-relief-for-prisoners-amidst-fears-of-COVID-19-spreading-to-prisons/56-698004> accessed 25 November 2020.

[149] සේනක පෙරේරා- සිරකරුවන්ගේ අයිතීන් සුරැකීමේ කමිටුව□ නන්දන මනතුංග පියතුමා- මහනුවර මානව හිමිකම් කාර්යාලය□

ඇප මත මුදාහරින් ලදී.[150] සැප්තැම්බර් වන විට, සුළු වරද සඳහා රඳවා සිටි සිරකරුවන් 400 ට අධික පිරිසක් ජනාධිපති සමාව ලබා නිදහස් වූහ.[151] සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන කමිටුව නීතිපතිවරයා වෙත විවෘත ලිපියක් ලියමින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබා ඇති රැඳවියන් සඳහා ඇප ලබා දීම පිළිබඳව නොපමාව තීරණයක් ගැනීමට යොමුවන මෙන් නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටින ලදී.[152]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන්ගේ නඩු සමාලෝචනයට ලක් කර කරුණුමය සාධක ප්‍රමාණවත් නොවීම මත ඔවුන් වෙත ඇප ලබාදීමට හෝ කෝවිඩ්-19 බෝවීමේ තර්ජනය පසුබිම් කරගනිමින් මුදා හැරීමට එකඟවීම් පිළිබඳව වාර්තා වී නොමැත. රැඳවුම් භාරයේ සිටින තම ඥාතීන් බැලීමට යාම සඳහා හෝ කථා කිරීම සඳහා මෙම වසංගත කාලය තුළ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට අවස්ථාව අහිමි වී තිබේ. බන්ධනාගාර කාර්ය මණ්ඩලයට ගෙවීමක් කර මිනිත්තු පහක දුරකථන ඇමතුමක් ලබාග ැනීමට හැකි බවක් ඇතැම් අයට පවසා තිබේ. කෝවිඩ්-19 බෝවීමට ඇති ඉඩකඩ සහ ප්‍රමාණවත් පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්වීම හෝ ප්‍රතික්ෂේප කිරීමක් වශයෙන් ඔවුන් අවබෝධ කරගෙන ඇති මෙම තත්වය හේතුවෙන් රැඳවියන්ගේ පවුල් වෙත මානසික පීඩා ඇතිවී තිබේ. රඳවා සිටින තම පවුලේ සාමාජිකයාට එරෙහිව කිසිදු තොරතුරක් හෝ සාක්ෂියක් නොමැති බව විශ්වාස කරන පවුල්වලට මෙම කෝවිඩ්-19 බෝවීමට ඇති ඉඩකඩ පෙනෙන්නේ මගහරවාගත හැකිව තිබූ එහෙත් මුහුණ දෙන්නට ඔවුන්ව බලයෙන් යොමුකරවනු ලැබූ අවදානමක් වශයෙනි. නීතිවේදී හිජාස් හිස්බුල්ලා වැනි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවූවන්ට රැඳවුම් භාරයේ දී කෝවිඩ්-19 ආසාදනය වී ඇති බවක් වාර්තා වී තිබීම.[153] මෙම පවුල්වල පීඩා තවත් උත්සන්න කරවයි. රැඳවියන්ගේ රැකවරණය සහ සුරක්ෂිතභාවය පිළිබඳ පූර්ණ වගකීම රජයට පැවරෙන අතර රැඳවියන් බෝවන රෝගයකට ගොදුරු වීම මෙම වගකීම ඉටුකිරීමට අපොහොසත්වීමක් වශයෙන් අර්ථ විග්‍රහ කළ හැකිය.

## (ඔ) අසමාන ලෙස සැලකීම

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රජයේ රැඳවුම් භාරයේ සිටින තැනැත්තන් වෙත අසමාන අන්දමින් සැලකීම නීතියේ ආධිපත්‍යය දෘෂ්ටිකෝණයෙන් බලන කළ බරපතළ ලෙස සැලකිල්ල යොමුවිය යුතු කරුණකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිශ්චිත අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ බරපතළ අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් වන තැනැත්තන්ට ඇප ලැබීම හෝ ඔවුන් නිදහස් කිරීම සිදු වේ. උදාහරණ වශයෙන්, 2000 දෙසැම්බර් මාසයේ දී අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ දෙමළ සිවිල් වැසියන් අටදෙනෙක් ඝාතනය සඳහා වරදකරු වූ සැරයන් සුනිල් රත්නායකට සමාව දී නිදහස් කොට තිබේ.[154] පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසෆ් පරරාජසිංහම් ඝාතනය වෙනුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් පාර්ලිමේන්තු මන්ත්‍රී සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් ඇතුළු පස් දෙනෙකු ඇප මත මුදාහැර තිබේ.[155] රජයේ සිරභාරයේ සිටින පුද්ගලයින් සම්බන්ධයෙන්

අම්බිකා සත්කුනනාදන්, ත්‍යාගි රුවන්පතිරණ හා රුකී ප්‍රනාන්දු- ෂහඩසෘව මානව හිමිකම් ලේඛනගත් කිරීමේ කාර්යාලය විසින් ලියන ලද, 2020 මාර්තු 31 දින දරන ලිපිය

150 'Nearly 3,000 released from Sri Lanka prisons' (The Associated Press, 05 April 2020) <https://apnews.com/article/27d53bcdd57f205837cb5d64694d11bb> accessed 25 November 2020.

151 PTI, 'Over 400 prisoners granted presidential pardon in Sri Lanka' (The New Indian Express, 01 September 2020) <https://www.newindianexpress.com/world/2020/sep/01/over-400-prisoners-granted-presidential-pardon-in-sri-lanka-2191114.html> accessed 25 November 2020.

152 Ruwan Laknath Jayakody, 'Covid-19 based social distancing: Rights group calls for the release of prisoners' (Ceylon Today, 1 April 2020) <https://ceylontoday.lk/news/covid-19-based-social-distancing-rights-group-calls-for-the-release-of-prisoners> accessed 25 November 2020.

153 "Hejaaz Hizbullah has Covid" Lankasara website dated 8th January 2021 found at https://lankasara.com/en/news/hejaaz-hizbullah-has-covid/

154 'Justice reversed for victims of the Mirusuvil massacre, Sri Lanka' (Amnesty International, 26 March 2020) <https://www.amnesty.org/en/latest/news/2020/03/justice-reversed-for-victims-of-the-mirusuvil-massacre-from-sri-lanka/> accessed 25 November 2020.

155 https://island.lk/pillayan-and-four-others-granted-bail-after-five-years-in-remand/

ගන්නා තීරණවල අත්තනෝමතිකබව ආමන්ත්‍රණය කරන, යෝග්‍යතාව මත පදනම් වූ ක්‍රමවත් ඇගයීමක් සිදු නොවේ. පරිපාලනමය රැඳවුම් නියෝගමත සහ නිශ්චිත වශයෙන් වරද කුමක්දැයි සඳහන් නොකර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින තැනැත්තන්ට මෙම අසමාන සැලකිල්ලෙන් නැවතත් අවධාරණය කෙරෙන්නේ ඔවුන් සිරභාරයට ගැනීමේ ඇති අසාධාරණකම සහ අත්තනෝමතික ස්වභාවය පිළිබඳවයි.

# 6. සමාප්තිය

(1) විශේෂයෙන් ම ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ පසුබිම තුළ අත්තනෝමතිකව අත් අඩංගුවට ගැනීම හා රඳවා තැබීම සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර නීති ප්‍රමිතීන් කවරේ ද, (2) ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ පසුබිම තුළ අත්තනෝමතිකව අත් අඩංගුවට ගත් හා රඳවා තැබූ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති දේශීය නෛතික රාමුව කුමක්ද, සහ (3) 2019 අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරවලින් පසුව සහ 2019 ට පෙර ත්‍රස්තවාදය සම්බන්ධයෙන් සම්පාදිත නීති මගින් බලපෑමට ලක් වූ තැනැත්තන් ලැබූ ප්‍රායෝගික හා ජීවමාන අත්දැකීම් කවරේ ද යන ප්‍රධාන ප්‍රශ්න තුන සඳහා ප්‍රතිචාර දැක්වීම මෙම වාර්තාවේ අරමුණ විය.

මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේදී ත්‍රස්තවාදය සම්බන්ධ නීතිය මගින් සමාජය මත ඇති කෙරෙන බලපෑම පිළිබඳ සංවාදයකට මෙම වාර්තාව දායක වනු ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම විනිවිදභාවයකින් යුතුව ලේඛනගත කිරීමට රජය මුළුමනින්ම අපොහොසත් වී තිබීම මෙහි ප්‍රධානතම නිරීක්ෂණයක් වේ. ත්‍රස්තවාදය සම්බන්ධ නීති ශ්‍රී ලංකාවේ අදාළ කරගන්නා ආකාරය දීර්ඝ කාලීන මානව දුක් ගැහැට ඇතිකිරීමට ඉඩ සලසන අතර නීතියේ ආධිපත්‍යය අනතුරේ හෙලන අන්දමේ නෛතික සහ පරිපාලනමය ව්‍යවහාර නියෝජනය කරන බව මෙම අධ්‍යයනයෙන් සොයාගනු ලැබූ මූලික කාරණය වේ. මේ සම්බන්ධයෙන් දරන්නට සිදුවී ඇති පිරිවැය ඉහළ වන අතර එම බොහොමයක් කරුණුවලට මුහුණ දුන් තැනැත්තන්ට ඒවා ආපසු හැරවිය නොහැකි බවක් පෙනෙන්නට තිබේ.

නීතිය හා සමාජ භාරයේ දැක්ම වන්නේ නීති ක්‍රියාවලීන්ගේ නියතභාවය පිළිබඳව පුරවැසියන්ට සහතික කරන්නා වූත්, වරදකාරිත්වය තීරණය කිරීමේ ක්‍රියාවලියට කොටස්කරුවන් වන සියලුම සැකකරුවන්ට සියලු ආරක්ෂණයන් ලබා දෙන බවත් පරිපාලනමය හා නීතිමය ක්‍රියාමාර්ග භාවිතය හෝ අවභාවිතය ඔස්සේ පුරවැසියන් වෙත අධිකරණමය විනිශ්චයකින් තොරව දඬුවම් නියම නොකරනු ඇති බවත් දැන පුරවැසියන් ඉන් සුරක්ෂිත වූත් රටක් වේ. ත්‍රස්තවාදය මර්ධනයේ දී මානව ආරක්ෂාව සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරදීම සඳහා සිදුවිය යුතු ප්‍රතිපත්තිමය, නීතිමය සහ පරිපාලනමය කතිකාවන් සංවර්ධනය සඳහා දායක වීමට මෙම වාර්තාව මගින් අපේක්ෂා කරනු ලැබේ.

2019 අප්‍රේල් මාසයේ පාස්කු ඉරුදින ප්‍රහාරවලින් පසුව පුරවැසියන්ගේ නිදහස අහිමි කිරීම් සම්බන්ධයෙන් දැනට ඔවුන් අත්විඳිමින් සිටින අත්දැකීම් පිළිබඳ මූලික ලේඛනගත කිරීමක් ඔස්සේ මෙම වාර්තාව, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (1979) ක්‍රියාත්මක කිරීම හා එහි බලපෑම් සම්බන්ධයෙන් වන ශාස්ත්‍රීය ලේඛන සමුදායට යමක් එක් කිරීමට බලාපොරොත්තු වේ. මෙම අත්දැකීම්, ගත වූ සිවු දශකයේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යොදාගැනීම සම්බන්ධයෙන් වන දීර්ඝ කාලයක සිට පවත්නා භාවිතයන් සමගින් සම්බන්ධ කිරීමට මෙම වාර්තාවෙන් කටයුතු කරනු ලැබේ. මෙම වාර්තාව තුළ, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ දේශීය නීතියේ ඇති ආරක්ෂණ සමගින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත භාවිතය සසඳනු ලැබේ. අපරාධ යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා පොදුවේ ව්‍යාධිගත සන්දර්භය තුළ ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ මෙම සැකකරුවන්ගේ අත්දැකීම් ද පිහිටන බව මෙම වාර්තාවෙන් සිහිපත් කර දෙනු ලැබේ. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ පවුල් වෙත පුදනු ලබන මෙම වාර්තාව, ශ්‍රී ලංකාවේ ත්‍රස්ත මර්ධන නීති රාමුව පිළිබඳව සම්පූර්ණයෙන්ම නැවත සිතාබලා නීතියේ ආධිපත්‍ය සහතික කරන්නා වූත් 'ත්‍රස්තවාදය' සම්බන්ධයෙන් චෝදනා එල්ලවූවන් ඇතුළුව ශ්‍රී ලංකාවේ සියළුම ජනතාව සඳහා මානව ආරක්ෂාව සහතික කරන්නා වූත් නීති රාමුවක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි.

LAW & SOCIETY TRUST